# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,035 — 1964 මැයි 15 වැනි සිකුරාදා — 1964.5.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 601 | තොටුපල් ඵේන්ද හා වෙනත් ඵේන්ද විකිණීම ... ... | 650 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 613 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 624 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 647 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | 651 |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 649 | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥා පනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

---

## විශේෂ නිවේදනයයි

1964 මැයි 25 වැනි සඳුදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1964 මැයි 29 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1964 මැයි 23 වැනි සෙනසුරාදා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

**බර්නාඩ් ද සිල්වා,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1964 මැයි 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

---

(සී) චරිත සහතික දෙකක්. මින් එකක් අධ්‍යයන අධ්‍යක්ෂගෙන්, විද්‍යාලීය, ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුයි;

(ඩී) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර;

(ඊ) සිංහලෙන් සමත්වූ උසස්ම විභාගයේ සහතික පත්‍රය.

**සංලක්ෂ්‍යය.**—(i) අයදුම් පත්‍රයට ලියවිලි හෝ ලියවිලි පිටපත් නොඇමිණිය යුතුයි ;

(ii) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අයදුම්පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුයි. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන එවැනි අයදුම්පත්‍ර එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දින හෝ ඊට පෙර ලද බව හා ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් ඒවා පිළිගත යුතු බව නිර්දේශ නොකරතොත්, අයදුම්පත්‍ර සලකා බලනු නොලැබේ.

7. අයදුම් පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර, මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට පෞද්ගලිකව නොඑවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවෙනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍යසේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. අයදුම්පත් සියල්ලම ලැබුන බව දන්වනු ඇත. අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින 7ක් ඇතුලත තම අයදුම් පත්‍රය ලැබුන බව දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවකු වේ නම් ඔහු විසින් ඒ බව රාජ්‍යසේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත වහාම දැන්විය යුතුයි. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම්පත්‍රය සලකා බලනුවස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

සී. ජේ. සේරසිංහ,
රාජ්‍යසේවා කොමිෂන් සභාවේ ලේකම්.

1964 මැයි මස 11 වැනි දින,
කොළඹ 1, ගාළුමුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍යසේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය,
තැ. පෙ. 500.

5–432/1—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ. 384/එක්ස්. 1478/63.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### මහරගම රජයේ ගුරු විද්‍යාලයේ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ කථිකාචාර්ය තනතුරු

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මහරගම රජයේ ගුරු විද්‍යාලයේ, ශාරීරික අධ්‍යාපනය පිළිබඳ තනතුරු දෙකක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි ඉදිරිපත් කළ යුතු අයදුම් පත් පහත සඳහන් දිනයන්හි හෝ ඉන් පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුයි :—

(අ) මෙරට අයදුම් පත් 1964 මැයි මස 29 වැනිදා .

(ආ) පිටරට අයදුම්පත් 1964 ජූනි මස 5 වැනිදා.

**සංලක්ෂ්‍යය.**—(i) අයදුම්පතක් හෝ ඒ හා සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැක. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් විඳ දරාගත යුතුයි ;

(ii) විදේශීය අයදුම්කරුවන්ට අවශ්‍යවන මුද්‍රිත අයදුම්පත් පෝරම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම තමාගේ අයදුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවීම සඳහා තමා පදිංචි රටට හෝ තමාට ආසන්නම රටට හෝ පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළතදී භාරදීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන ;

(iii) **වෛද්‍ය පරීක්ෂණය හා ගමන් ගාස්තු.**—ලංකා ආණ්ඩුව යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි වෛද්‍ය පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුයි. එම පරීක්ෂණය සඳහා ගාස්තුවක්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ ගමන් ගාස්තුවත් ඔවුන් විසින්ම දැරිය යුතුවේ.

2. **වැටුප් දීමනා.**—මෙම තනතුරු සඳහා රු. 5,160—360 වැටුප් වැඩිවීම් 9—රු. 8,400ක වාර්ෂික වැටුප් ක්‍රමයක් නියමිතය.

3. **සේවා කොන්දේසි.**—මෙම තනතුරු, පාසැල් ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ. විශ්‍රාම වැටුප් වාර්තා යටතේ ගුරුවරුන් ලෙස විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරණ ශික්ෂකයන් මෙම තනතුරු සඳහා තෝරාගනු ලැබේ නම්, ඔවුන් විසින් දරණ තාක් මෙම තනතුරු විශ්‍රාම වැටුප් හිමි තනතුරු ලෙස ප්‍රකාශ කරනු ලැබේ.

4. **අධ්‍යාපනික හා අනිකුත් අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔවුන් පිළිබඳ පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(ඒ) 1964 මැයි මස 29 වැනි දිනට වයස අවුරුදු 28 ට නොඅඩු බවට හා අවුරුදු 50 ට නොවැඩි බවට, (දැනටමත් රජයේ සේවයේ ස්ථිර තනතුරු දරණ අයගේ අයදුම් පත් උපරිම වයස සීමාව නොසලකා, සලකා බලනු ඇත.) ;

(බී) උසස් ක්‍රීඩකයෙකු ලෙස ගණන් ගැනීමට සුදුසු අන්දමේ විශිෂ්ඨ වාර්තාවක් තිබිය යුතු ; හා

(සී) පිළිගත් විද්‍යාලයක හෝ ආයතනයක ශාරීරික අධ්‍යාපනය පිළිබඳව උපාධියක් හෝ ඩිප්ලෝමාව. මේ සඳහා අඩුම වශයෙන් පහත සඳහන් කරුණු සම්පූර්ණව තිබිය යුතුය. එනම් —

(i) එක් අවුරුදු නේවාසික පශ්චාත් උපාධි පාඨමාලාවක් හෝ,

(ii) එවැනි ආයතනයක අඩු ගණනේ අවුරුදු 2 ක නේවාසික පාඨමාලාවක් අනුගමනය කර තිබීම සහ ශාරීරික අධ්‍යාපන ගුරුවරයෙකු වශයෙන් හෝ ශාරීරික අධ්‍යාපන පාඨශාලා පරීක්ෂකයෙකු වශයෙන් අවුරුදු දෙකක පළ පුරුද්දක් ලබා තිබීම හෝ,

(ඩී) ක්‍රීඩා හා මල්ලව ක්‍රීඩා පිළිබඳව විශිෂ්ඨ වාර්තා ලබා ඇති පිළිගත් විශ්ව විද්‍යලයක උපාධිධාරියෙකු වීම සහ යටත් පිරිසෙයින් වර්ෂ පහක ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා තිබීම. (ක්‍රීඩා හා මල්ලව ක්‍රීඩා සංවිධානය කිරීම හා පැවැත්වීම පිළිබඳ පුරුද්ද සමග) ; හෝ

(ඊ) ගුරු විදුහල්වල ශාරීරික අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ කථිකාචාර්යවරයෙකු වශයෙන් අඩුගණනේ අවුරුදු 8 ක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති ද්විතීයික පුහුණු පළමුවන පෙළ ගුරුවර/ගුරුවරියක් හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු වීම ;

(එෆ්) (i) **සිංහලෙන් වැඩ කිරීමට හොඳ හැකියාවක් තිබීම, තෝරා**ගනු ලබන අයදුම්කරුවන් විද්‍යාලයයේ සියලුම ක්‍රීඩා පිළිබඳ කටයුතු භාරව සිටීම අවශ්‍ය වේ ;

(ii) ඔවුන්ට සිංහල භාෂාවෙන් දේශන පැවැත්වීමට හැකියාවක් තිබීම,

(ජී) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශාරීරික සනීපයෙන් යුක්ත බවට.

5. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කරන ලදුව, නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත්, එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දින හෝ ඊට පෙර ලද බව හා ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් ඒවා පිළිගත් බව නිර්දේශ නොකළහොත් එම අයදුම් පත් ගැන සලකා බලනු නොලැබේ.

6. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ල ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි විට අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—බෞතිස්ම සහතික හෝ උපකෘත පාසැල් සඳහා නියමිත අධ්‍යාපන ව්‍යවස්ථා පරිදි නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ භාරගනු නොලැබේ.);

(බී) උපාධි සහතික පත්‍ර හෝ උසස්ම අධ්‍යාපනික සහතික පත්‍ර;

(සී) මේ තනතුරුවලට පත් කිරීමට යෝග්‍ය බවටත්, චරිතය සම්බන්ධවත්, අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳවත් ළඟදී ලබා ගන්නා ලද සහතික තුනක් (දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගෙන් මෙහි සඳහන් ලියකියවිලි ඉදිරිපත් කිරීම අනවශ්‍යය.)

සංලක්ෂ්‍යය:—

(1) අයදුම් පත්‍රයට ලියවිලි හෝ ලියවිලි පිටපත් නො ඇමිණිය යුතුයි.

(11) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නො හැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍ර සලකා බලනු නොලැබේ.

7. තෝරාගනු ලැබූ අපේක්ෂකයන් පළමුවෙන් ම මහරගම රජයේ ගුරු විද්‍යාලයට අයත්ව සේවය කරන නමුත් මාරුකර යැවීමට ඉඩ ඇත.

8. අයදුම් පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට පෞද්ගලිකව නො එවිය යුතුයි.

9. මෙම ගැසට් පත්‍රයේ පළමුවෙනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි ද බලනු මැනවි.

10. අයදුම් පත්‍ර සියල්ලම ලැබුණු බව දන්වනු ඇත. අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින 7 ක් ඇතුළත තම අයදුම් පත්‍රය ලැබුණු බව දන්වන ලිපියක් නො ලත් අයදුම්කරුවෙක් වේ නම් ඔහු විසින් ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත වහාම දන්විය යුතුයි. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතා වය පැහැර හැරීමෙන් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

සී. ජේ. සේරසිංහ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1964 මැයි මස 11 වැනි දින,
කොළඹ 1, ගාළුමුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායාීලයේ දී ය.
තැ. පෙ. 500

5–432/2—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### සිංහල භාෂා පරිවර්තක තනතුර

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සිංහල භාෂා පරිවර්තක තනතුරක් සඳහා අයදුම් පත් එවන ලෙස සුදුස්සන්ට මෙයින් ආරාධනය කරමි. මෙහි පහත දැක්වෙන ඉල්ලුම් පත්‍රයේ අන දමට පිළියෙළ කරන ලද අයදුම්පත් වර්ෂ 1964 මැයි මස 29 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙනසේ එවිය යුතුය.

2. වැටුප.—මේ තනතුරට නියමිත වැටුප් ක්‍රමය, රුපියල් 3,900—රුපියල් 180 හා රුපියල් 240—රුපියල් 6,540.

3. සේවයේ කොන්දේසි.—(i) මේ තනතුර සථිරය, විශ්‍රාම වැටුප් සහිත ය; මේ තනතුරට තෝරා ගනු ලබන අපේක්ෂකයා තුන් අවුරුද්දක ආධුනික කාලයක් සහිතව පත් කරනු ලැබේ.

(ii) සුළු කාලයක් ඇතුළත දී තනතුරේ වැඩ බාර ගන්නා ලෙස තෝරාගත් අපේක්ෂකයාට නියම කරනු ලැබේ.

(iii) තනතුරට අයත් කාර්ය නම්, ලිපි ලේඛනාදිය ඉංග්‍රීසියෙන් සිංහලට පරිවතීනය කිරීම, සිංහලයෙන් ඉංග්‍රීසියට පරිවතීනය කිරීම, අනෙක් දෙපාර්තමේන්තුවලින් එවන සිංහල පරිවර්තනයන් ප්‍රතිශෝධනය කිරීම සහ දෙපාර්තමේන්තුවෙන් නියම කෙරෙන වෙනත් කටයුතු කිරීමද වේ. භාෂා පිළිබඳ විශේෂ ප්‍රවීණත්වයක් ඔවුන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

4. අවශ්‍ය සුදුසුකම්.—හැම අයදුම්කරුවකුම—

(අ) සිංහලය විෂයයක් වශයෙන් ඇති උපාධියක්, පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ අයකු බවට; නැතහොත්

(ආ) සිංහල භාෂා පරිවර්තකයකු වශයෙන් දහ අවුරුද්දක් පළපුරුදුකම් ඇත්තාවූ හෝ තමා යටත් පිරිසෙයින් උපාධිධරයන්ට සමාන ප්‍රවීණතාවක් ඇති උගතකු බව තෝරීම් සභාවට ඒත්තු යන සේ කරුණු ඉදිරිපත් කළ හැකි ලේඛකයකු නොහොත් ග්‍රන්ථ කර්තෘවරයකු වූ හෝ බවටත්, ඉංග්‍රීසිය පිළිබඳ ඉතා හොඳ දැනුමක් ඇත්තා වූ අයකු බවටත් ;

(ඇ) 1964 මැයි මස 29 වැනිදාට තමාගේ වයස අවුරුදු 25 ට නො අඩු බවටත් 50 ට නො වැඩි බවටත් (දැනට ආණ්ඩුවේ සේවයේ යෙදී සිටින අයට මේ වයස් සීමාවන් අදාළ නොවේ.) ;

(ඈ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවටත් සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. හැම අයදුම්කරුවකුම විසින් පහත පෙනෙන සහතික වල පිට පත් (මුල් ලිපි නොවේ) තම අයදුම්පතට අමුණා එවිය යුතු ය:—

(අ) උප්පැන්න සහතිකය හෝ (උප්පැන්න සහතිකය ලියාපදිංචි කර නැති අපේක්ෂකයන් සම්බන්ධයෙන් නම්) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස් පිළිබඳ විශේෂ සහතිකය. (බෞතිස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර භාරගනු නොලැබේ.) ;

(ආ) උසස්ම අධ්‍යාපනික සුදුසුකම් සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ ලැබූ සහතික පත්‍රය ;

(ඇ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, මේ තනතුරට ඇති යෝග්‍යතාව යන මේවා සම්බන්ධයෙන් මෑතදී ලබාගන්නා ලද සහතික තුනක් (රාජ්‍ය සේවාවෙහි සිටින අයදුම්කරුවන්ගෙන් මේ බලාපොරොත්තු නොවේ).

සැලකිය යුතුයි.—සහතික පත්‍රවල හා චරිත සහතික පත්‍රවල පිටපත් ආපසු එවනු නොලැබේ.

6. ආණ්ඩුවේ සේවයෙහි නියුක්ත නිලධාරීන් එවන අයදුම්පත් නියමිත දිනයෙන් පසුව මෙහි ලැබුණොත්, ඒ අයදුම්පත් භාරගනු ලබන්නේ ඒවා නියමිත දිනයට කලින් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට ලැබී තිබුණහොත් ද, ඒවා ප්‍රමාද වීමට සෑහෙන හේතු දක්වමින් එම අයදුම් පත් භාරගන්නා ලෙස දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා නිර්දේශ කළහොත් ද පමණකි.

7. අයදුම්පත් හා ඒ පිළිබඳ සෙසු ලියුම් කියුම් එවිය යුත්තේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියකුගේ පෞද්ගලික නමට නොව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස් හටය.

8. ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයෙහි පළවූද, රාජ්‍ය සේවාවේ තනතුරුවලට කෙරෙන පත් කිරීම පිළිබඳ වූද පොදු කොන්දේසි බලනු මැනවි.

9. එවන හැම අයදුම්පතක් ම මෙහි ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම්පත් බාරගන්නා අවසාන දිනයේ සිට තුන් දවසක් ඇතුළත එවැනි දැන්වීමක් යම් අයදුම්කරුවකුට නොලැබුණොත් ඔහු විසින් ඒ බව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස් හට වහාම දන්වා එවිය යුතුය. එසේ නොකරන අයගේ හිමිකම් ගැන සලකනු නො ලැබේ.

නන්දදේව විජේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

1964 මැයි 15 වැනිද,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 598,
22, පීඩ් මාවත, කොළඹ 7.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### සිංහල භාෂා පරිවර්තක තනතුර පිළිබඳ ඉල්ලුම් පත්‍රය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
(අ) අගට යෙදෙන නම :————.
(ආ) අනිත් නම් :————.

2. ලිපිනය :————.

3. (අ) වර්ෂ 1964 මැයි මස 29 වැනි දිනට සම්පූර්ණ වයස :— අවුරුදු———, මාස———, දවස්———.
(ආ) උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ හෝ වයස පිළිබඳ විශේෂ සහතිකයේ පිටපතක් අමුනා එවිය යුතුයි) :————.

4. රටවැසිභාවය සහ එය කෙසේ හිමි වී ද යන බව :————.

5. (අ) පියාගේ සම්පූර්ණ නම :————.
(ආ) පියා උපන් දින සහ ස්ථානය :————.
(ඉ) ඔහුගේ රටවැසිභාවය :————.

6. අයදුම්කරු විවාහක ද, අවිවාහක ද, කනවැන්දුම් ද යන බව (විවාහක නම් විවාහ වූ දිනයත් දරුවන් ගණනත් සඳහන් කළ යුතුයි) :————.

7. මූලික අධ්‍යාපනය ලත් පාඨශාලා සහ විද්‍යාල (ඒවාට ඇතුළත් වූ සහ අස් වූ දින සඳහන් කළ යුතුයි) :————.

8. (අ) ශාස්ත්‍රාලයීය සහ වෘත්තීය සුදුසුකම් (ඒවා ලත් දිනත්, සාමාර්ථය ලැබූ පෙළත් සඳහන් කළ යුතුයි. සහතික පිටපත් ද අමුණා එවිය යුතුයි.) :————.

(ආ) සිංහල සහ ඉංග්‍රීසි භාෂා විෂයයන් වශයෙන් ඈතිව සාමාර්ථය ලත් උසස් ම විභාගය :—

සිංහල :————.

ඉංග්‍රීසි :————.

9. (අ) පරිවර්තක වැඩ සම්බන්ධයෙන් පළපුරුදු කම් තිබේ නම්, දින සමග විස්තර සඳහන් කරන්න :————.

(ආ) සාහිත්‍ය කෘතීන් කර පළපුරුදුකම් තිබේ නම්, දින සමග ඒවාද සඳහන් කරන්න :————.

10. (අ) පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් හෝ අස්වූ පසු නියුක්තව සිටි රක්ෂාවල් ද, ඒ පිළිබඳව වකවානු ද, ලැබූ වැටුප් ද සඳහන් කරන්න :————.

(ආ) රජයේ සේවයේ යෙදී සිටි නම්, තත්ත්වයන්, වාර්ෂික වැටුප් ද සඳහන් කරන්න :————.

11. විශේෂ පළපුරුදු, පුහුණුවීම්, සුදුසුකම් සහ හිමිකම් :————.

12. පෞද්ගලික ලෙස ආශ්‍රය කරන තිදෙනකුගේ නම් (තත්ත්වය සහ ලිපිනය සඳහන් කරන්න. මේ අය ඔබේ ඥාතීන් නොවිය යුතුයි.) :—

(i) :————.
(ii) :————.
(iii) :————.

13. චරිත සහතික දී ඇති අයගේ නම් සහ තත්ත්ව (ඥාතීන් නොවිය යුතුයි. මෑතකදී ලත් චරිත සහතිකවල පිටපත් පමණක් අමුණා එවිය යුතුයි.) :————.

14. මුදල් කරදර නැති වූවෙක් ද යන වග ; නැතිනම් ණය ප්‍රමාණය (ගණන් විස්තර කරන්න) :————.

15. වෙනත් කරුණු :————.

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම දෙන්නට පෙර හෙළිවුවහොත් මගේ අපෙක්ෂකත්වය අවලංගු කිරීමට ද, පත්වීම ලැබුවාට පසු හෙළිවුවහොත් කිසිම වන්දි ගෙවීමක් නැති ව මා තිලයෙන් අස් කිරීමට ද යටත් වන බව මම දැන සිටින බව ද, මේ අයදුම් පතෙහි දැක්වෙන සියලු විස්තර සත්‍ය බව ද නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5–315—64.5.15 දින අංක 14,035දරන ගැසට් පත්‍රය

---

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

### බාහිර කථිකාචාර්ය තනතුරු—ලංකා කාර්මික විද්‍යාලය, කොළඹ

කොළඹ ලංකා කාර්මික විද්‍යාලයේ බාහිර කථිකාචාර්ය තනතුරු සඳහා අයදුම් පත් භාරගනු ලැබේ. පහත සඳහන් පාඨමාලා හා විෂයයන් සඳහා බාහිර කථිකාචාර්ය වරුන් උවමනා කර තිබේ :—

වාණිජ අංශය

| පාඨමාලාව | දිවාකාල හෝ සන්ධ්‍යා | විෂය |
|---|---|---|
| වාණිජ ඩිප්ලොමාව (ඉංග්‍රීසි) ... ... ... | දිවාකාල ... | 1. වාණිජ නීතිය<br>2. දේශපාලන න්‍යාය<br>3. රජයේ මුදල්<br>4. කොස්ට් ගණකාධිකරණය<br>5. ගණකාධිකරණය<br>6. බදු ක්‍රම<br>7. වාණිජ භූගෝල විද්‍යාව |
| වාණිජ ඩිප්ලොමා (සිංහල) ... ... ... | දිවාකාල ... | 1. ආර්ථික ඉතිහාසය<br>2. ආර්ථික භූගෝලය<br>3. ආණ්ඩුක්‍රම මූල ධර්ම<br>4. ගණන් තැබීම සහ ගණකාධිකරණය<br>5. වාණිජ්‍ය හා මුදල්<br>6. ආර්ථික මූල ධර්ම<br>7. ව්‍යවහාරික අර්ථ ශාස්ත්‍රය<br>8. මහබලවතුන්ගේ ආර්ථික ඉතිහාසය<br>9. මූලික සංඛ්‍යාලේඛන ක්‍රම<br>10. ගිවිසුම් නීතියට විශේෂවූ නීතිය පිළිබඳ සාමාන්‍ය මූලධර්ම<br>11. නවීන ලෝක ඉතිහාසය |
| තක්සේරු කිරීමේ ඩිප්ලොමාව ... ... | දිවාකාල හා සන්ධ්‍යා ... | 1. තක්සේරු කිරීම<br>2. දේශපාලනය පිළිබඳ නීතිය<br>3. ප්‍රාදේශ පාලනය (මුදල්)<br>4. නගර නිර්මාන ශිල්පය<br>5. කෘෂිකර්මය<br>6. ඉඩම් පිළිබඳ නීති |
| පොත් තබන්නන් හා ලඝුලේඛක යතුරු ලියන්නන්ගේ වාණිජ සහතික පත්‍රය (සිංහල) | දිවාකාල හා සන්ධ්‍යා ... | 1. සිංහල භාෂාව<br>2. සිංහල ලඝුලේඛනය<br>3. සිංහල යතුරු ලියනය<br>4. වාණිජ භූගෝලය<br>5. පොත් තැබීම |
| පොත් තබන්නන් හා ලඝුලේඛකයන් පිළිබඳ උසස් වාණිජ සහතික පත්‍රය | දිවාකාල හා සන්ධ්‍යා ... | 1. සිංහල භාෂාව<br>2. සිංහල ලඝුලේඛනය<br>3. සිංහල යතුරු ලියනය<br>4. වාණිජ විද්‍යාව හා මුදල්<br>5. පොත් තැබීම හා ගණකාධිකාරණය |
| පොත් තබන්නන් හා ලඝුලේඛන යතුරු ලියන්නන්ගේ වාණිජ සහතිකය (ඉංග්‍රීසි මාධ්‍යය) | දිවාකාල ... | 1. ඉංග්‍රීසි භාෂාව<br>2. වාණිජ භූගෝලය |
| පොත් තබන්නන් හා ලඝුලේඛක යතුරු ලියන්නන්ගේ උසස් සහතිකය (ඉංග්‍රීසි මාධ්‍යය) | දිවාකාල ... | 1. ඉංග්‍රීසි භාෂාව |

| පාඨමාලා | වෘත්තීය අංශය<br>දිවාකාල හෝ සන්ධ්‍යා | විෂය |
|---|---|---|
| ලඝු ලේඛක යතුරු ලියන්නන්ගේ වාණිජ සහතිකය (ඉංග්‍රීසි මාධ්‍යය) | සන්ධ්‍යා ... | 1. ලඝුලේඛනය (ඉංග්‍රීසි) |
| ලඝුලේඛක යතුරු ලියන්නන්ගේ උසස් වාණිජ සහතිකය (ඉංග්‍රීසි (ඉංග්‍රීසි මාධ්‍යය) | සන්ධ්‍යා ... | 1. ලඝුලේඛනය (ඉංග්‍රීසි) |
| ලඝුලේඛනය (අධික වේගය ඉංග්‍රීසි මාධ්‍යය) සහතිකය ... | සන්ධ්‍යා ... | 1. ලඝුලේඛනය (ඉංග්‍රීසි) |
| | **ගණකාධිකරන අංශය** | |
| 1. ගණකාධිකරණය ඩිප්ලෝමා ... ... | සන්ධ්‍යා ... | 1. ගණකාධිකරණය<br>2. උසස් ගණකාධිකරණය<br>3. වාණිජ පිළිබඳ සාමාන්‍ය දැනීම<br>4. වාණිජ හා මුදල් පිළිබඳ සාමාන්‍ය දැනීම<br>5. වාණිජ නීති මූලධර්ම<br>6. වාණිජ නීතිය<br>7. හවුල් සහ සමාගම් නීතිය<br>8. පොල්මඃකාර, අද්මිනිස්ත්‍රාත්කරුවන්, භාරකාරයන් වස්තු භංගත්වය, බේරුම් කිරීම හා අධිනිර්ණය සම්බන්ධවූ නීතිය<br>9. අර්ථ ශාස්ත්‍රීය මූලධර්ම<br>10. ගණන් පරීක්ෂණය<br>11. මිල කිරීමේ මූලධර්ම<br>12. බදු ක්‍රම |
| 2. ලේකම් ධූර සඳහා පන්තිය ... ... | දිවාකාල හා සන්ධ්‍යා ... | 1. ලේඛන හා පරිපාලන ක්‍රම<br>2. සමාගම්හි ලේඛන ක්‍රම<br>3. රාජ්‍ය පාලනය<br>4. ඉංග්‍රීසි වෙළඳ නීතිය<br>5. ඉංග්‍රීසි සමාගම් නීතිය<br>6. උසස් ගණකාධිකරණය<br>7. ඉංග්‍රීසි භාෂාව<br>8. ආර්ථික න්‍යාය<br>9. ආර්ථික ප්‍රතිපත්ති සහ ගැටළු<br>10. ලේඛක ක්‍රම (බදු) |
| 3. බැංකු ක්‍රම ... ... ... | සන්ධ්‍යා ... | 1. මුදල් න්‍යාය හා ප්‍රායෝගිකය<br>2. විදේශීය වෙළඳාම පිළිබඳ මුදල් හා විදේශ මුදල් හුවමාරුව<br>3. බැංකු ක්‍රියාකාරිත්වය<br>4. බැංකු කටයුතු වලට සම්බන්ධවූ නීතිය<br>5. නීතිය පිළිබඳ සාමාන්‍ය ප්‍රතිපත්තිය<br>6. ගණකාධිකරණය<br>7. වාණිජ භූගෝලය<br>8. ඉංග්‍රීසි භාෂාව<br>9. ගණන් කැබීම |
| 4. ප්‍රවාහනය ... ... ... | සන්ධ්‍යා ... | 1. ප්‍රවාහන මූලධර්ම<br>2. දේශීය ප්‍රවාහනය පිළිබඳ නීතිය<br>3. ප්‍රවාහනයට සම්බන්ධවූ මුදල් කටයුතු හා ගණකාධිකරණය<br>4. දේශීය ප්‍රවාහනයට සම්බන්ධවූ අර්ථ ශාස්ත්‍රය<br>5. දුම්රිය හෝ මංමාවත් ප්‍රවාහන ක්‍රියාකාරිත්වය<br>6. සාමාන්‍ය අර්ථශාස්ත්‍රය<br>7. ඉංග්‍රීසි භාෂාව<br>8. නවීන ප්‍රවාහන ක්‍රමයේ පරිනාමය<br>9. නීතිය පිළිබඳ සාමාන්‍ය මූලධර්ම<br>10. ප්‍රවාහනය සම්බන්ධිත භූගෝල විද්‍යාව<br>11. කලමනාව පිළිබඳ මූලධර්ම ප්‍රවාහනය සම්බන්ධිත |
| | **වෘත්තීය අංශය** | |
| යාන්ත්‍රික පුහුණුව–තුන් අවුරුදු පන්තිය ... ... | සන්ධ්‍යා ... | (ආ යාන්ත්‍රික වැඩ (ප්‍රායෝගික)<br>(ආ) යාන්ත්‍රික වැඩ (සෛද්ධාන්තික) |
| හේත්තු වැද්දීම පුහුණුව–තුන් අවුරුදු පන්තිය ... ... | සන්ධ්‍යා ... | (අ) හේත්තු වැද්දීම (ප්‍රායෝගික)<br>(ආ) හේත්තු වැද්දීම (සෛද්ධාන්තික) |
| වාත්තුමල් සෑදීම–තුන් අවුරුදු පන්තිය ... ... | සන්ධ්‍යා ... | (අ) වාත්තුමල් සෑදීම (ප්‍රායෝගික)<br>(ආ) වාත්තුමල් සෑදීම (සෛද්ධාන්තික) |
| ඉහත සඳහන් පාඨමාලා තුන සඳහා— | | කාර්මික චිත්‍ර කර්මය |
| මුද්‍රණ ශිල්පය–තුන් අවුරුදු පන්තිය ... ... | සන්ධ්‍යා ... | (අ) වර්ණ යෝජනය<br>(ආ) පොත් බැඳීම |
| ජලනල සවිකිරීම–එක් අවුරුදු පන්තිය ... ... | සන්ධ්‍යා ... | ජලනල සවිකිරීම |
| රේඩියෝ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම–එක් අවුරුදු පන්තිය ... | සන්ධ්‍යා ... | රේඩියෝ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම |
| විදුලි කම්බි සවිකිරීම–එක් අවුරුදු පන්තිය ... ... | සන්ධ්‍යා ... | විදුලි කම්බි සවිකිරීම |
| මෝටර් යාන්ත්‍රික විද්‍යාව ... ... ... | දිවාකාල ... | 1. සිංහල භාෂාව<br>2. ඉංග්‍රීසි භාෂාව |

**කාල.**—දිවා කාල පන්ති සතියේ දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 5.00 දක්වා පැවැත්වෙන අතර, සන්ධ්‍යා කාල පන්ති සතියේ දිනවල පස්වරු 5.00 සිට 7.00 දක්වා පැවැත්වේ.

ගාස්තු.—බාහිර කථිකාචාර්යවරුන්ට කෙරෙන ගෙවීම් පැයකට රු. 5/- සිට රු. 21/- දක්වා වෙයි. තෝරාගත් අයදුම්කරුවන්ට භාණ්ඩාගාරයෙන් අනුමත කෙරෙන පාඨමාලා තත්වය අනුවත් ඔවුන්ගේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් අනුවත් ගෙවීම් කරනු ලැබේ.

සේවා කොන්දේසි.—මෙම පත්වීම කරනු ලබන්නේ අධ්‍යයන වර්ෂය වන 1964 ජූලි මාසය පටන් ඊළඟ වර්ෂයේ මාර්තු මාසය අවසානය දක්වා පමණය. එහෙත් මෙම පත්වීම් අධ්‍යයන වර්ෂය අතරතුර කවර වේලාවකදී වුවද හේතූන් නොදක්වා අවසන් කිරීමට පුළුවන.

බාහිර කථිකාචාර්යවරු, වාරය පටන් ගැනීමට පෙර තමන්ට දෙනු ලබන නිර්දේශ පත්‍ර අධ්‍යයන වර්ෂය තුලදී සම්පූර්ණ කිරීම පිණිස යොදන්ට අදහස් කරන කාර්ය මාලාව වාරය පටන් ගැනීමට පෙර ඉදිරිපත් කළ යුතුයි. එසේම අධ්‍යයන වර්ෂය අතරතුරදී ඔවුන් පවත්වන දේශන සම්මත කෙරුනු කාර්ය මාලාවට අනුව වියයුතුයි.

වර්ෂාවසාන පරීක්ෂණ වලට බාහිර පරීක්ෂකවරුන් පත් කෙරෙන අවස්ථාවලදී හැර අනිකුත් වාරවල පරීක්ෂණ හා වර්ෂාවසාන පරීක්ෂණ වලදී, තම තමන්ගේ පන්තිවල ශිෂ්‍යයන් කිසිදු ගෙවීමක් නොබලා පරීක්ෂා කිරීමට බාහිර කථිකාචාර්යවරු සතුටුවිය යුතුයි.

අයදුම්පත් බාරගන්නා අවසාන දිනය.—මෙහි පහත දක්වෙන ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව පිළියෙල වුනු ඉල්ලුම් පත් (පිටපත් දෙකක්) 1964 මැයි මස 30 වෙනි දිනට හෝ ඊට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ එවිය යුතුයි.

ඇස්. ඇල්. ද සිල්වා,
අධ්‍යක්ෂ.

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව,
කොළඹ 10, 1964 මැයි 6 වෙනි දින.

## ආකෘති ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. වයස :————.
3. පුද්ගලික ලිපිනය (ටෙලිෆෝන් අංකයක් ඇත්නම් එයද) :————.
4. ව්‍යාපාර ලිපිනය (ටෙලිෆෝන් අංකයද සඳහන් කරන්න) :————.
5. වෘත්තිය හෝ රක්ෂාව :————.
6. වෙනත් රක්ෂා තිබේ නම් ඒවා :————.
7. ශාස්ත්‍රීය සුදුසුකම් (දින සඳහන් කරන්න) :————.
8. වෘත්තිය සුදුසුකම් (දින සඳහන් කරන්න) :————.
9. සිංහලෙන් පංති පැවැත්වීමට හැකි බව හෝ නොහැකි බව :————.
10. ඉගැන්වීමේ පළපුරුදු කම් ඇත්නම් ඒවා :————.
11. ප්‍රායෝගික සුදුසුකම් ඇත්නම් ඒවා :————.
12. බාහිර කාථිකාචාර්යකු වශයෙන් සේවය කිරීමට බලාපොරොත්තුවන පාඨමාලා සහ විෂයයන් :—

| පාඨමාලා | විෂයයන් | මාධ්‍යය |
|---|---|---|
| ............................................ | ............................................ | ............................................ |
| ............................................ | ............................................ | ............................................ |
| ............................................ | ............................................ | ............................................ |

13. සතියක් තුලදී ඔබ විසින් කළ හැකි උපරිම දේශනා ගණන :————.
14. ඔබ රජයේ සේවකයෙක්ද? එසේ නම් කාර්යාල වේලාවලට පිටස්තරව පමණක් දේශනා පැවැත්වීමට සූදානම්ද? :————.

..............................................................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

5-298—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## ජාතික පේෂකර්ම සංස්ථාව

මෙම 1964ක්වූ මැයි මස 29 වෙනි සිකුරාදා පස්වරු 4.30 දක්වා වෘෂ්ප හා විදුලිබල ඉන්ජිනේරු තනතුර සඳහා ලාංකිකයින්ගෙන් අයදුම් පත් භාරගනු ලැබේ.

සුදුසුකම්.—ඒ. ඇම්. අයි. ඊ. ඊ. සහ වාෂ්ප උපදවීම සම්බන්ධව සැහෙන පළපුරුද්දක් සහ විදුලි මධ්‍යස්ථානයක හෝ විශාල ඉන්ජිනේරු විද්‍යා වැඩ සම්බන්ධව අඩු වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතුයි.

වැටුප් ක්‍රමය.—මසකට රු. 1,000—රු. 50—රු. 1,500 සියළු දීමනා ඇතුළුව.

තෝරාගනු ලැබූ අයදුම්කරුට, ඔහුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව වැටුප් ක්‍රමයෙහි සුදුසු ස්ථානයකට පත්වීම දීම සළකා බලනු ලැබේ.

අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ වයස, අධ්‍යාපනික සුදුසුකම් සහ වෙනත් සුදුසුකම්ද, පාසැලෙන් අස්වූ පසු කළ රැකියාවන් සම්බන්ධව සම්පූර්ණ විස්තරද සඳහන් කළ යුතු අතර, අධ්‍යාපනික සහ චරිත සහතිකයන්හි පිටපත්ද (මුල් පිටපත් නොව), ඉදිරිපත් කළ යුතුය.

මෙම තනතුර සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයාට, දැනට වේයන්ගොඩ රාජකාරි කිරීමට සිදුවන අතර, මතුවට සංස්ථාවේ ඕනෑම කොටසක වැඩ කිරීමට සිදුවනවා ඇත.

ආධාර ලබාගැනීමට හෝ අසත්‍ය තොරතුරු සැපයීමට හෝ තැත් කිරීම නුසුදුසු කමක් ලෙස සලකනු ලැබේ.

ජාතික පේෂකර්ම සංස්ථාව, ලේකම්.
32ඒ, බාන්ස් පෙදෙස,
කොළඹ 7.

5-296—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**ගබඩා භාරකාර තනතුරු (ගොවිපලවල්හි හා ව්‍යාප්ති මධ්‍යස්ථාන)**

රජයේ දෙපාර්තමේන්තුවල තාවකාලික ගබඩා භාරකරුවන්ගෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ (ගොවිපලවල හා ව්‍යාප්ති මධ්‍යස්ථාන වල) ගබඩා භාරකරුවන් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අදාල වැටුප් ක්‍රමය වර්ෂයකට රුපියල් 888—72—2,184ක් වේ. වැටුප් වර්ෂයකට රුපියල් 1,608 වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් විය යුතුය.

3. **සේවා කොන්දේසි :**

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 3ක ආධුනික කාලයකට යටත් වේ;

(ii) තෝරාගත් අයදුම්කරුවන් විසින් අවුරුදු තුනක සේවා කාලය තුළදී තමා සේවය කරන ප්‍රදේශයේ වැසියන් සමග සිංහලෙන් හා දෙමළෙන් රාජකාරි කටයුතු කිරීම සඳහා එකී භාෂාවන් ගෙන ප්‍රවීණතාවයක් ලබාගත යුතුය.

4. **සුදුසුකම්.**—සෑම අපේක්ෂකයෙකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) (i) රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක අඩු වශයෙන් තුන් අවුරුද්දක ගබඩා භාරකාර පළපුරුද්දක් හා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වී සිටීම, අවුරුදු පතා අවශ්‍යවන භාණ්ඩ වර්ග ඇස්තමේන්තු කිරීම, අගය තක්සේරු කිරීම, භාණ්ඩ ඉල්ලුම් පත්‍ර සකස් කිරීම හා කාර්යාලීය වැඩ පිළිබඳ පළපුරුද්ද ආදී අතිරේක සුදුසුකම් තිබීම, හෝ

(ii) රජයේ දෙපාර්තමේන්තුවක අවුරුදු 5කට නොඅඩු ගබඩා භාරකාර සේවයේ පළපුරුද්දක් හා කණිෂ්ඨ පාඨශාලා විභාගයෙන් සමත්වී සිටීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත වීම.

5. සියලුම ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්‍රවල පිට පත් අමුනා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය (සැලකිය යුතුයි.—බව්තීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ නීති සංග්‍රහය අනුව නිකුත් කළ උප්පැන්න සහතික පත්‍රය පිළිගනු නොලැබේ.)

(ii) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පිළිබඳ උසස්ම සහතික පත්‍ර වල පිටපත්.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයෙහි පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාළ පොදු කොන්දේසි ද කියවා බලන්න.

7. පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූල වනසේ පිළියෙල කළ ඉල්ලුම් පත්‍ර 1964 මැයි 29 වැනි දින හෝ ඊට පෙර පේරාදෙණියේ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා වෙත ලැබෙන ලෙස ඉල්ලුම්කරුගේ දෙපාර්ත මේන්තුවේ ප්‍රධානියාගේ මාර්ගයෙන් එවිය යුතුය. මොනම කරුණක් නිසා හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ පුද්ගලික නමට ඉල්ලුම් පත් එවිය යුතු නොවේ. මේ සඳහා විශේෂ ආකෘති පත්‍ර සපයනු නොලැබේ.

ඒ. ටී. ඇම්. සිල්වා,
වැඩබලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1964 මැයි මස 4 වැනි දින,
පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව—පේරාදෙණිය

**ගබඩා භාරකාර තනතුරු (ගොවිපල හා ව්‍යාප්ති මධ්‍යස්ථාන)**

**සඳහා ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය**

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා වයස :————.

4. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරුගේ :————.

(ආ) අයදුම්කරුගේ පියාගේ :————.

(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ පියාගේ :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
අයදුම්කරු ලංකාවේ උපත ලබා සිටීම නම්, (අ) වගන්තිය ඇතුළු (ආ) වගන්තිය හෝ (ඇ), (ඈ) වගන්ති දෙකද පිරවිය යුතුය. අයදුම්කරු ලංකාවේ උපත නොලැබුනේ නම් (අ) වගන්තිය ඇතුළු (ආ) සහ (ඇ) වගන්තිය හෝ (ඇ), (ඈ) වගන්ති දෙක පිරවිය යුතුය.

5. අයදුම්කරු ලියා පදිංචි වීමෙන් හෝ පරම්පරාවෙන් ලංකාවේ පුරවැසි භාවය ලබා සිටී ද ? :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. අවුරුදු පතා අවශ්‍ය භාණ්ඩ වර්ග ඇස්තමේන්තු කිරීම හා අගය තක්සේරු කිරීමේ, භාණ්ඩ ඉල්ලුම් පත්‍ර සකස් කිරීම හා කාර්යාලීය වැඩ පිළිබඳ පළපුරුද්ද :————.

8. දැනට කරන රක්ෂාව :————.

9. කලින් කළ රක්ෂාවල් හා ඒ පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

මගේ අංකය :————.

කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙතටය.

(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය)

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

5–346/1—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**කාන්තා ප්‍රායෝගික කෘෂිකර්ම පාසැල්වල විද්‍යාලයාධිපති තනතුරු**

කාන්තා ප්‍රායෝගික කෘෂිකර්ම පාසැල්වල විද්‍යාලයාධිපති තනතුරු සඳහා කාන්තාවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 2,460—120×12 සහ 180×5—රු. 4,800.

3. **සේවා කොන්දේසි :**

(i) තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය ;
(ii) පත්වීම අවුරුදු 3ක ආධුනික කාලයකට යටත් වේ ;

(iii) තෝරාගනු ලබන අපේක්ෂිකාවන් දිවයිනේ කවර පළාතක වුවද සේවය කිරීමට සූදානම් විය යුතුයි.

4. **අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :**

(අ) උද්භිද විද්‍යාව හා රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ගෙන කෘෂිකර්මයෙන් හෝ විද්‍යාවෙන් හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා තිබීම, හෝ

(ආ) කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ සහතිකය හෝ කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ග්‍රාමීය ගෘහ පාලනය හා උසස් ගෘහ පාලනය පිළිබඳ සහතිකයක් හෝ ඊට සමාන පිළිගත් ආයතනයක සහතිකයක් හෝ සමග ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකයක් හෝ ඊට සමාන සහතිකයක්, මෙයට අතිරේකව ඉගැන්වීම සම්බන්ධයෙන් සත් අවුරුද්දක පළපුරුද්ද තිබිය යුතුයි.

සහ

(ඇ) සිංහලෙන් දෙසුම් පැවැත්වීමේ දක්ෂ විය යුතුයි.

5. **වයස සීමාව.**—1964 ජූලි මස 1 වැනි දිනට අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි විය යුතුයි. (දැනට රජයේ සේවයේ නියුක්ත අයට මෙම වයස් සීමාව අදාල නොවේ.)

6. සෑම අපේක්ෂිකාවක්ම පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුයි :—

(අ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතික පත්‍රයේ පිටපත ;

(ආ) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක පිටපත්.

7. පහත දක්වෙන ආකෘති පත්‍රයට අනුකූල වනසේ පිළියෙල කරන ලද අයදුම්පත් 1964 ජූනි මස 10 වැනිදාට හෝ ඊට ප්‍රථම පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් කෙළවරේ මුදුනේ "විද්‍යාලයාධිපති තනතුරු" යන්න සඳහන් කර ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

8. අයදුම්පත් හෝ ඊට අදාල සෙසු සෑම ලියකියවිල්ලක්ම එවිය යුත්තේ කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙතය. මගේ හෝ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නාමට අයදුම්පත් හා ලියකියවිලි නොඑවිය යුතුයි.

9. අයදුම්පත් ලැබුණ බව දන්වනු නොලැබේ.

10. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල් පිටුවේ පළව ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි කියවා බලන්න.

ඒ. පී. එම්. සිල්වා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1964 මැයි මස 4 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය.

## අයදුම්පතේ ආකෘතිය

### කාන්තා ප්‍රායෝගික කෘෂිකර්ම පාසැල්වල විද්‍යාලයාධිපති තනතුර

1. (අ) සම්පූර්ණ නම :————.
   (ආ) නම :————.
   වාසගම :————.
2. ස්ථිර ලිපිනය :————.
3. 1964 ජූලි මස 1 වැනි දිනට වයස සහ උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
4. පියාගේ නම සහ රක්ෂාව :————.
5. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරුගේ පියා :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
6. (අ) ජාතිය :————.
   (ආ) ඔබ ලාංකිකයෙක් ද ? :————.
   (i) උප්පත්තියෙන් ද ? :————.
   (ii) නැතහොත් ලියාපදිංචි කරවා ගැනීමෙන් ද? :————.
7. ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් :—
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.
   (ඇ) ඉංග්‍රීසි :————.
8. ලබා ඇති වෘත්තීය සුදුසුකම් :————.
9. උගැන්වීමේ පළපුරුද්ද :————.
10. සිංහලෙන් දේශන පැවැත්වීමේ හැකියාවක් තිබේද ?————.
11. වෙනත් විස්තර :————.

මවිසින් මෙම අයදුම් පතෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මේ අයදුම් පතෙහි කිසියම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු වන බවත් තෝරා ගැනීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුනොත් කිසිම වන්දියක් නොගෙවා මා රාජකාරියෙන් පහකර දැමීමට යටත්වන බවත් මෙයින් දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පේරාදෙණියේ, කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙතටයි.

5–346/2—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## කිරි මණ්ඩලය

### සහකාර ඉංජිනේරුවෙකුගේ තනතුර

කිරි මණ්ඩලීය සේවයේ සහකාර ඉංජිනේරුවෙකුගේ තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහතින් සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත්, 1964 ජූනි මස 5 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

2. මෙම තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 4,080න් පටන් ගෙන වර්ෂයකට රු. 360 බැගින් 12 වරක් වැඩිවී වර්ෂයකට රු. 8,400 දක්වා වැඩිවේ. රජයේ රෙගුලාසි අනුව විශේෂ ජීවනාධාර දීමනාව සහ ගෙවල් කුලී දීමනාවද මේ වැටුපත් සමග ගෙවනු ඇත. පළපුරුද්ද සහ සුදුසුකම් අනුව කිසියම් අනුග්‍රහයක් දිය යුතු නම් තෝරා ගනු ලබන අපේක්ෂකයා ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ සුදුසු පියවරක තබනවා ඇත. මේ තනතුර සඳහා රජයේ සේවයේ නිලධාරියෙකු පත් කර ගනු ලැබුවහොත් මෙම පත්වීම භාරගැනීමට පෙර ඔහු දැනට රජයේ සේවයේ දරණ ධුරය අත්හැරිය යුතුය. පත්කරනු ලබන නිලධාරියා ඔහු දැනට රජයේ සේවයේ දරණ තනතුර රජයේ අනුමැතිය ඇතිව අත්හැරිය හොත් ඔහු මණ්ඩලීය සේවයට බැඳෙන විට ඔහුට අයිතිවී තිබුනු විශ්‍රාම වැටුප් පහසුකම්, විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 48 ඒ ඡේදය යටතේ ආරක්ෂා කර ගතහැකිය.

පත්කරනු ලබන නිලධාරියාට සේවක අර්ථසාධක අරමුදල යටතේ අර්ථසාධක මුදල් පහසුකම් ලැබීමට අවකාශ ඇත.

3. අවශ්‍ය සුදුසුකම්.—සෑම අපේක්ෂකයෙකු විසින්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළයුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයකින් සහ මනා ශරීර සනීපයෙන් යුක්ත බව;

(ආ) උප්පත්තියෙන් හෝ ලියා පදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියෙකු බව ;

(ඇ) 1964 ජූනි මස 5 වැනි දිනට වයසින් අවුරුදු 45 ට නොවැඩි බව ;

(ඈ) (i) පිලිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධිය ලබා ඇති බවට, හෝ

(ii) ලන්ඩනයේ යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ හෝ ලන්ඩනයේ විදුලි කාර්මික ඉංජිනේරු ආයතනයේ, හෝ ආශ්‍රිත සාමාජිකත්වය සඳහා අවශ්‍ය විභාගවලින් පළමුවැනි හා දෙවැනි කොටස් වලින් සාමාර්ථය ලබා ඇති බවට, හෝ

(iii) පිලිගත් යාන්ත්‍රික විදුලි කාර්මික ආයතනයක පස් අවුරුදු ආධුනිකත්වයකට පසු යටත් පිරිසෙයින් විශාල වැඩපලක වර්ෂ 15ක ශීත කරණ යන්ත්‍ර, බොයිලේරු විදුලි උපකරණ සහ කිරි සම්පාදන යන්ත්‍රෝපකරණ පිළිබඳ කාර්මික පළපුරුද්දක් ලබා ඇති බවට හෝ ලංකා කාර්මික විද්‍යාලයේ හෝ වෙනත් පිලිගත් කාර්මික ආයතනයක යාන්ත්‍රික ඉංජිනේරු ඩිප්ලෝමා විභාගයෙන් සාමාර්ථය ඇති බවට.

4. සේවා කොන්දේසි :

(අ) පත්කරනු ලබන නිලධාරියා දැනටමත් රජයේ සේවයේ ස්ථිර කර නොමැති නම් පත් කරනු ලබන දින සිට වර්ෂ 3ක පරීක්ෂණ කාලයකට යටත්විය යුතුය ;

(ආ) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා විශෙෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින්මතු පනවන ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව "නවප්‍රවේශක" නිලධාරීන් විසින් ක්‍රියා කළයුතුය ;

(ඇ) පරීක්ෂණ කාලය ගතවී අවසන්වූවිට සේවයෙහි ස්ථිර කරනු ලබන්නේ වෙනත් කරුණු අතර, සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීනතා විභාගයෙන් සමර්ථවීම උඩය. නියමිත කාලය තුලදී සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීනතාවය ලබා ගැනීමට නොහැකි වුවහොත් ඔහුට නියමිත වාර්ෂික වැටුප් වැඩිවීම ගෙවීම අත්හිටවීමට සිදුවනවා ඇත. පරීක්ෂා කාලය අවසානයේදී නියමිත පරිදි සිංහල භාෂාව පිළිබඳව ප්‍රවීනතාවය ලබා නොගතහොත් පත් කරනු ලබන නිලධාරියා සේවයෙන් පහ කිරීමට සිදුවනවා ඇත.

5. වෛද්‍ය විභාගය.—මෙම තනතුර සඳහා පත් කරන නිලධාරියා පත්වීම භාරගැනීමට ප්‍රථමයෙන් රජයේ වෛද්‍ය ආයතනයකදී වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

6. අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොව) ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්නය ලියා පදිංචි කළ සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලාවල කාර්යයන් සඳහා නිකුත් කරන ලද සහතිකය හෝ බාර නොගන්නා බව සැලකිය යුතුය) ;

(ආ) අපේක්ෂකයා ලබා ඇති උසස්ම අධ්‍යාපනික සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඇ) අපේක්ෂකයාගේ සුදුසුකම්, කල්ක්‍රියාව සහ තනතුරට පත් කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව මෑතදී ලබාගත් සහතික තුනක්. (

මෙයින් එකක් අධ්‍යයන පිළිබඳ අධ්‍යක්ෂකගෙන් හෝ විද්‍යාලයීය ගුරුවරයාගෙන් හෝ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය වරයාගෙන් හෝ විය යුතුය.

(දැනට රජයේ සේවයේ සිටින අයදුම්කරුවන් විසින් මෙම අනුඡේදය අනුව සහතික ඉදිරිපත් කළයුතු නොවේ.)

**සංලක්ෂය.**—මෙකී සහතික පිටපත් සහ චරිත සහතික පිටපත් ආපසු එවනු නොලැබේ.

7. දැනට රජයේ සේවයේ හෝ රජයේ සංයුක්ත මණ්ඩලවල නියුක්ත නිලධාරීන් ස්වකීය ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ තම දෙපාර්තමේන්තු/සංයුක්ත මණ්ඩලීය ප්‍රධානියාගේ මාර්ගයෙනි.

8. අයදුම් පත්‍ර සහ ඒ හා සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම කිරි මණ්ඩලයේ සභාපතිතැනට හැර මෙම මණ්ඩලීය සේවයේ කිසිම නිලධාරියෙකුගේ නමට පෞද්ගලික නොඑවිය යුතුය.

9. සෑම ඉල්ලුම් පත්‍රයක්ම ලැබුනු බව දන්වා එවනු ඇත. මෙම ඉල්ලුම් පත්‍ර කැඳවීම අවසන් වන දින සිට දින තුනක් ඇතුලතදී යම් අපේක්ෂකයෙකුට තම ඉල්ලුම් පත්‍රය ලැබුන බව නොඑවනු ලැබුවහොත් ඔහු වහාම ඒ බව කිරි මණ්ඩලයේ සභාපතිට දැන්විය යුතුය.

10. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අපේක්ෂකයින් විසින් තම වියදමෙන්ම කොළඹදී පවත්වන පරීක්ෂණයකට පෙනී සිටිය යුතුවේ.

11. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බල පෑවීමකට හෝ උත්සාහයන් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

12. මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කිරි මණ්ඩලීය මූලස්ථානය,
තැ. පෙ. 1155,
නාරාහේන්පිට,
කොළඹ 5.
1964 මැයි මස 7 වැනි දින,

## ඉල්ලුම්පත්‍රය

### කිරි මණ්ඩලයේ සහකාර ඉංජිනේරු තනතුර

1. සම්පූර්ණ නම :————.

2. පෞද්ගලික ලිපිනය :————.

3. අපේක්ෂකයා උපන් දිනය සහ උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිනිය යුතුය.)

4. අපේක්ෂකයාගේ පියා උපන් ස්ථානය :————.

5. අපේක්ෂකයා ලබා ඇති උසස්ම අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිනිය යුතුය.)

6. සිංහල සහ/හෝ දෙමළ භාෂාව පිළිබඳ ප්‍රවීනතාවය :————.

7. වර්තමාන රැකියාව සහ කලින් ලබා ඇති පලපුරුදුකම් පිළිබඳ විස්තර :————.

8. අපේක්ෂකයාගේ චරිතය සම්බන්ධයෙන් සහතික කලහැකි අයවළුන් තිදෙනකුගේ නම් සහ ලිපිනයන් :—

1. :————.
2. :————.
3. :————.

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් දක්වා ඇති සියළු කරුණු නිවැරදි බව මම සහතික කරමි.

සභාපති,
කිරි මණ්ඩලය.

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

5–268—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

### මානක විද්‍යාව පිළිබඳ උපදේශක තනතුර

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේ මානක විද්‍යාව පිළිබඳ උපදේශක තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. පහත සඳහන් ආදර්ශ ආකෘතිපත්‍රය අනුව පිළියෙල වූ ඉල්ලුම් පත් 1964 ජූනි මස 5 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත එවිය යුතුය.

3. මේ තනතුරට අදාල වැටුප් ක්‍රමය රු. 3,420 වාර්ෂික වැටුපෙන් පටන්ගෙන රු. 120 වාර්ෂික වැටුප් වැඩිවීම් 4 කින් හා අනතුරුව රු. 180 වේ වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් පසුව රු. 5,340 වාර්ෂික වැටුප දක්වා වැඩි වේ. රු. 4,080 සහ රු. 4,800 කාර්යක්ෂමතා කඩඉම් සහිත වේ.

4. මේ තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. පත්වීම් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් වේ. දැනට ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරණ නිලධාරියකු තෝරා ගනු ලැබුව හොත් ඔහු පළමුවෙන් එක් අවුරුද්දක වැඩ බැලීමේ පදනම මත පත් කර ගනු ලැබේ.

5. මානක විද්‍යාව පිළිබඳ උපදේශක තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙක් ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1964 ජූනි මස 5 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු 40 ට නොවැඩි විය යුතුය, (දැනට රජයේ සේවයේ සිටින නිලධාරීන්ට මෙය අදාල නොවේ) ;

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව ;

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්, හෝ

(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන්, හෝ

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය. සහ

(iv) සර්වේ ජනරාල් තුමාගේ මැනීමේ සහ මට්ටම් කිරීමේ බල පත්‍රය ;

(v) ලංකා කාර්මික විද්‍යාලයේ මැනීම සහ මට්ටම් කිරීමේ සහතිකය ;

(vi) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිළධාරීන්ගේ (සිවිල්) සහතික ; හෝ

(vii) සමාන හෝ උසස් සුදුසුකම්.

**සටහන.**—(1) පත්කර ගනු ලබන්නා සෑහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, අවුරුදු 5 කට අඩු පළපුරුද්දක් ඇති අයකු තෝරා ගනු ලැබුව හොත් ඔහු අවශ්‍ය පළපුරුද්ද ලබාගන්නා තෙක් වසකට රු. 3,420 ක නියමිත වැටුපක් මත වැඩ බැලීමේ පදනමක් මත පත් කැරෙනු ඇත ;

(2) (v) වෙනි සහ (vi) වෙනි සුදුසුකම් ලද්දවුන් විසින් රු. 4,800 කාර්යක්ෂමතා කඩයිමෙන් උසස් වීම සඳහා සර්වේ ජනරාල් තුමාගේ බලපත්‍ර විභාගයෙන් සමත් විය යුතුය.

6. රජයේ සේවයේ නියුතු සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම තමන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් මගින් අයදුම් පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් කළ දිනයට පසු එවන අයදුම් පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණා ඉදිරිපත් කර නිර්දේශ කලහොත් පමණි යථෝක්ත ප්‍රමාදවී ලැබෙන අයදුම් පත් භාරගනු ලබන්නේ.

7. අයදුම්කරුවන් විසින් පහත දක්වෙන ලියවිලි පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම් පත්‍රවලට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථාවන්හි සඳහන් කටයුතු පිණිස නිකුත් කර ඇති සහතික භාරගනු නොලැබේ) ;

(ආ) ලබා ඇති උසස්ම ශාස්ත්‍රීය හා වෘත්තීය සහතිකය ;

(ඈ) අයදුම් කරුවන්ගේ සුදුසුකම්, චරිතය සහ තනතුරට ඇති සුදුසුකම් පිළිබඳ සහතික තුනක්.

(සැ. යු.—දැනට රජයේ සේවයේ නියුතු අයදුම් කරුවන් විසින් ඉහත (ඈ) අනුඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවුවමනාය).

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (II) වැනි ඡේදයෙහි පටන් ගැන්මෙහි පළකර තිබෙන රාජ්‍යභාෂා තනතුරු සඳහා පත් කිරීම් වලට අදාළ පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කර වනු ලැබේ.

ඇස්. ඇල්. ද සිල්වා,
අධ්‍යක්ෂ.

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව,
කොළඹ 10, 1964 මැයි 11 වෙනි දින.

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

### මෝටර් කර්මාන්තය පිළිබඳ උපදේශක තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. නිත්‍ය ලිපිනය :————.

3. වයස සහ උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.

4. ජාතිය :————.

5. උපන් ස්ථානය :—
 (අ) අයදුම්කරු :————.
 (ආ) අයදුම්කරුගේ පියා :————.
 (ඇ) අයදුම්කරුගේ සීයා :————.
 (ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

අයදුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අමතරව (ආ) නැතහොත් (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුයි. අයදුම්කරු ලංකාවේ නොඋපන්නේ නම් (අ) වලට අමතරව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) වෙනම පිරවිය යුතුයි.

6. විවාහක හෝ අවිවාහක බව :————.

7. ඇන්වීමෙහි පළකර ඇති අන්දමට අධ්‍යාපන සහ අනික් සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.) :————.

8. ඉගෙනීම ලැබූ ස්ථානය සහ අස්වූ දිනය :————.

9. පාසැල හැරයාමෙන් පසු කළ රක්ෂාවල්, ඒවායේ විස්තර :————.

10. ඔබ රාජකීය හමුදාවක සේවය කර තිබේද? එසේ නම් ඒ සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

11. චරිතය පිළිබඳ සහතික ලබා ඇති අයගේ නම් සහ තරාතිරම් (ඒවායේ පිටපත් ඇමිණිය යුතුයි) :————.

12. දැනට රක්ෂාවක් කරන්නේ නම් එය :————.

මේ අයදුම් පතෙහි සඳහන් කොට තිබෙන සියළුම විස්තර නිවැරදි, සත්‍ය කරුණු බව මෙයින් සහතික කොට ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සකු වන බව හා පත්වීමෙන් පසුව ඉහතකී කරුණුවල අසත්‍ය තාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතුවන බවද, හොඳාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5–423—64.5.15 දින අංක 14,045 දරන ගැසට් පත්‍රය

---

## ලංකා බැංකුව

ලංකා බැංකු සේවය සඳහා කණිෂ්ඨ ලිපිකරුවන් හා සහායක කැෂියර්වරුන් බඳවා ගැනීම පිළිබඳව ඉල්ලුම් පත්‍ර, 1964 ජූනි මස 6 වෙනි දින දක්වා භාරගනු ලැබේ. ඉල්ලුම් පත්‍ර සඳහා විමසීම්—

සහායක සාමාන්‍යාධිකාරී (මාණ්ඩලික),
ලංකා බැංකුව, මධ්‍යම කාර්යාලය,
ලංකා බැංකු ගොඩනැගිල්ල,
කොළඹ 1.

(ආ) වැටුප් හා දීමනා :

1. පරීක්ෂණ සමයේදී—රු. 106/-
2. පත්වීම ස්ථිර වීමේදී— රු. 106/- සිට රු. 290/- / 18 × 6, 4 × 7, 1 × 8, සහ 4 × 10.
3. ලංකා බැංකුව මගින් සම්මත ජීවනාධාර.

(ඇ) සුදුසුකම් :

1. වයස : අයදුම්කරුවන් 1964 ජූනි මස 6 වෙනි දිනට, වයස අවුරුදු 20 ට නො අඩු 24 ට නො වැඩි විය යුතුයි.
2. ජාතිය : අයදුම්කරුවන් (ලාංකික) ලංකාවේ ලියා පදිංචි කරුවන් විය යුතුයි. " ලාංකික " යනුවෙන් උත්පත්තියෙන් හෝ ලියා පදිංචි වීමෙන් යනු අදහස් වේ.
3. අධ්‍යාපන සුදුසුකම් (මෙහි අංක i හෝ අංක ii) :
 i. පහත සඳහන් විෂයයන් සමග ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත් අය :—
  (ආ) සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව,
  (ඇ) අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය හෝ මූලික ගණිතය.
  (ඈ) ඉංග්‍රීසි භාෂාව.

එකම වාරයකදී සම්මාන සාමාර්ථ 5 ක් ලබාගත් අයදුම්කරුවන් ගැන විශේෂ සැළකිල්ලක් යොමු කරනු ලැබේ. එසේ නැතහොත් :

 (ii) පහත සඳහන් විෂයයන් සමග අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය විෂයයන් 6 කින් සමත් අය :—
  (ආ) සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව,
  (ඇ) අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය හෝ මූලික ගණිතය,
  (ඈ) ඉංග්‍රීසි භාෂාව.

එකම වාරයකදී සම්මාන සාමාර්ථ 5 ක් ලබාගත් අයදුම්කරුවන් ගැන විශේෂ සැළකිල්ලක් යොමු කරනු ලැබේ.

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් හා ආරෝග්‍යශාලා ලේකම්වරුන් සඳහා 1964 ජූලි මස පැවැත්වෙන ත්‍රෛමාසික විභාගය

1964 ජූලි මස මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් හා ආරෝග්‍යශාලා ලේකම්වරුන් සඳහා ත්‍රෛමාසික විභාගය පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරමි.

| | |
|---|---|
| 1964 ජූලි 3 වැනි දින හා 4 වැනි දින. | රාජ්‍ය සේවා කොමිෂන් සභා රෙගුලාසි සහ පාලන නීති සංග්‍රහය, ආරෝග්‍යශාලා හා බෙහෙත් ශාලා පරිපාලනය ගණින් පත්‍රය. |

2. සිංහල/දෙමළ වාචික පරීක්ෂණය, ලිවීමේ පරීක්ෂණය පවත්වන දිනට ප්‍රථම දිනයේ දී පවත්වනු ලැබේ.

3. මෙම විභාගයට ඇතුළත් වීම සඳහා ඉල්ලුම් පත් විමධ්‍යගත අංශ ප්‍රධානීන්ගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍ර ප්‍රකාර විය යුතුයි.

4. මෙම විභාගය මෙහෙයවනු ලබන්නේ විභාග කොමසාරිස් තැන විසින් ය. ඔහු විසින් මෙම විභාගය මෙහෙයවනු සඳහා පනවනු ලබන නීති රීති සම්බන්ධයෙන් ආධුනිකයන් යටත් විය යුතුයි.

5. ඉල්ලුම් පත් නම කොට්ඨාශ භාර සෞඛ්‍ය සේවා අධිකාරි හාරේ, කොළඹ, මැලේ වීදියේ, විභාග කොමසාරිස් තුමා වෙත 1964 ජූනි 5 වැනි දාට ප්‍රථමයෙන් යැවිය යුතුයි. සෞඛ්‍ය සේවා අධිකාරීන් විසින් එම ඉල්ලුම් පත් 1964 ජූනි මස 5 වැනි දිනට විභාග කොමසාරිස් තුමා වෙත ලැබීමට සලස්වනු පිණිස 1964 ජූනි 3 දිනට ප්‍රථමයෙන් සෑම ආධුනිකයෙකුම විසින් ඔවුන්ගේ ඉල්ලුම් පත් සෞඛ්‍ය සේවා අධිකාරීන් වෙත එවිය යුතු බව දැන ගත යුතුයි.

6. 1964 ජූනි මස 3 වැනි දිනට පසු ලැබෙන සෑම ඉල්ලුම් පතක්ම ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

වී. ටී. එච්. ගුණරත්න,
වැඩ බලන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

5-278—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුව

### කණිෂ්ඨ කාර්මික විද්‍යාලය—යාපනය

### 1964–65 අධ්‍යයන වර්ෂය

යාපනයේ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයයේ පැවැත්වෙන පහත සඳහන් පාඨමාලාවලට සිසුන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් භාර ගනු ලැබේ :—

| | | |
|---|---|---|
| (1) | දැවුරුදු දිවාකාල වෘත්තීය පන්ති ... ... ... ... | දෙමළ මාධ්‍ය |
| (2) | දැවුරුදු දිවාකාල වාණිජ සහතික පත්‍ර පන්ති ... ... ... | දෙමළ මාධ්‍ය |
| (3) | දැවුරුදු දිවාකාල වාණිජ සහතික පත්‍ර පන්ති ... ... ... | ඉංග්‍රීසි මාධ්‍ය |
| (4) | තුන් අවුරුදු අර්ධ කාලීන ගොඩනැඟිලි තැනීම පිළිබඳ පන්තිය ... ... | දෙමළ මාධ්‍ය |
| (5) | එක් අවුරුදු සන්ධ්‍යා ඉංජිනේරු විද්‍යා ප්‍රාරම්භක පන්තිය ... ... ... | ඉංග්‍රීසි මාධ්‍ය |
| (6) | තුන් අවුරුදු සන්ධ්‍යා යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා පන්තිය ... ... ... | ඉංග්‍රීසි මාධ්‍ය |
| (7) | තුන් අවුරුදු සන්ධ්‍යා විද්‍යුත් ඉංජිනේරු විද්‍යා පන්තිය ... ... ... | ඉංග්‍රීසි මාධ්‍ය |
| (8) | තුන් අවුරුදු සන්ධ්‍යා ගොඩනැඟිලි තැනීම පිළිබඳ පන්තිය ... ... ... | ඉංග්‍රීසි මාධ්‍ය |
| (9) | තුන් අවුරුදු සන්ධ්‍යා බිම්මැනීම සහ මට්ටම් කිරීම පිළිබඳ පන්තිය ... ... | ඉංග්‍රීසි මාධ්‍ය |
| (10) | එක් අවුරුදු සන්ධ්‍යා ලඝුලේඛකයින්ගේ පන්තිය ... ... ... | ඉංග්‍රීසි මාධ්‍ය |
| (11) | එක් අවුරුදු සන්ධ්‍යා ලඝුලේඛකයින්ගේ පන්තිය ... ... ... | දෙමළ මාධ්‍ය |
| (12) | දැවුරුදු සන්ධ්‍යා ගණන් තබන්නන්ගේ පන්තිය ... ... ... | දෙමළ මාධ්‍ය |
| (13) | දැවුරුදු සන්ධ්‍යා ගණන් තබන්නන්ගේ පන්තිය ... ... ... | ඉංග්‍රීසි මාධ්‍ය |

ඉහත සඳහන් පාඨමාලාවලට ඇතුළුවීම සඳහා එවන අයදුම්පත් 1964.5.22 දින දක්වා යාපනයේ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයේ, විද්‍යාලයාධිපති තැනගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පුරවා එවිය යුතුය.

පාඨමාලා පිළිබඳ විස්තර අඩංගු අත්පොත් පිටපත් විද්‍යාලයීය කාර්යාලයෙන් මිළ දී ලබාගත හැකිය.

සියළුම අයදුම්පත් 1964.5.23 දින හෝ ඊට පෙර යාපනයේ, කණිෂ්ඨ කාර්මික විද්‍යාලයයාධිපති වෙත ලැබෙන ලෙස යැවිය යුතුය.

ඇම්. කේ. ඇෆ්. මහසිංහ,
වැඩබලන ලේඛකාධිකාරී.

1964 අප්‍රියෙල් 30 වැනි දින,
කොළඹ,
ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේදී ය.

5–326—64.5.15 දින අංක 14,0:5 දරණ ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මහජන සෞඛ්‍ය ශිෂ්‍යයින්ගේ අභ්‍යාස පංක්තියට ඇතුළත් කරගැනීම පිණිස අපේක්ෂකයින් තෝරීම

මහජන සෞඛ්‍ය ශිෂ්‍යයින් උදෙසා වූ අභ්‍යාස පංතියට ඇතුලත් කර ගැනීම සඳහා 1964.9.19 වන දා මතු කියැවෙන මධ්‍යස්ථානවල පැවැත්වීමට යන තරඟ විභාගයකට, සෞඛ්‍ය සේවා අධිකාරීන් විසින් (පිරිමි) ලාංකිකයින්ගෙන් අයැදුම් පත් බාර ගන්නවා ඇත.

අයැදුම් පත්, විභාගයට ඇතුලත් වීමට ඇති යෝග්‍යතා කොන්දේසි සහ සේවයේ සහ අභ්‍යාසයේ කොන්දේසි පිළිබඳ සම්පූර්ණ තොරතුරු මෙහි මතු විස්තර වෙයි.

**2. තිබිය යුතු සුදුසුකම්.**—සෑම අපේක්ෂකයෙකු විසින් මැ —

(අ) 1964. 5. 1 වන දාට තම වයස අවුරුදු 19 ට නො අඩු සහ අවුරුදු 24 ට නො වැඩි බවටත්, (දැනට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියුක්ත සේවකයින් විෂයයෙහි නම් ඉහළ වයස් සීමාව අවුරුදු 32 ට නො වැඩි වනු ඇත.)

(ආ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික විභාගයෙන් හෝ ඊට ඉහළ විභාගයකින් හෝ එසේ නැත් නම් මව් බස සහ අංක ගණිතය නොහොත් ගණිතය ඇතුළු විෂය හයකින් දෙවතාවකට නො වැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් හෝ තමා සමත් වී සිටින බවටත්,

පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතු යැ.

**3. අයැදුම් පත් එවන පිළිවෙල.**—(අ) අයැදුම් පත් ආකෘති පත්‍ර සපයනු නොලැබේ. මෙහි මතු දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුකරණයෙන් අයැදුම් පත් පිළියෙල කරගෙන එය 1964 ජුනි 1 වන දා හෝ ඊට පෙර හෝ ඒ ඒ අපේක්ෂකයින් සිටින ප්‍රදේශවල සෞඛ්‍ය සේවා අධිකාරීන් වෙත ලැබෙන පරිදි, ලේඛනගත තැපෑලෙන් එවිය යුතු යැ. අයැදුම් පත් බහා එවන කවරයේ වම් අත පැත්තේ උඩ කෙළවර "මහජන සෞඛ්‍ය ශිෂ්‍යයින් තෝරීම සඳහා අයැදුම් පත්‍ර" යනුවෙන් සනක් තැබිය යුතු යැ. අපේක්ෂකයින්ගේ දැන ගැනීම සහ මග බලාගැනීම පිණිස සෞඛ්‍ය සේවා අධිකාරී ලැයිස්තුවක් මෙහි මතු දැක්වේ:—

| මධ්‍යස්ථානය | | සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ ලිපිනය |
|---|---|---|
| 1. අනුරාධපුර | ... | අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරී |
| 2. මඩකලපුව | ... | මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරී |
| 3. බදුල්ල | ... | බදුල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී |
| 4. කොළඹ | ... | කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී |
| 5. ගාල්ල | ... | ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී |
| 6. යාපනය | ... | යාපනයේ සෞඛ්‍ය සේවා අධිකාරී |
| 7. මහනුවර | ... | මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරී |
| 8. කෑගල්ල | ... | කෑගල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී |
| 9. කුරුණෑගල | ... | කුරුණෑගල සෞඛ්‍ය සේවා අධිකාරී |
| 10. කලුතර | ... | කලුතර සෞඛ්‍ය සේවා අධිකාරී |
| 11. මාතර | ... | මාතර සෞඛ්‍ය සේවා අධිකාරී |
| 12. මාතලේ | ... | මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී |
| 13. පුත්තලම | ... | පුත්තලම සෞඛ්‍ය සේවා අධිකාරී |
| 14. රත්නපුර | ... | රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරී |
| 15. වවුනියා | ... | වව්නියාවේ සෞඛ්‍ය සේවා අධිකාරී |

මේ දිනට පසු වැ ලැබෙන අයැදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. **මොන මැ අයැදුම් පතක්වත් කොළොඹැ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ අමතා නො එවිය යුතු යැ.**

(ආ) මෙහි අස්සන් කරන තැනැත්තාටවත්, මෙම දෙපාර්තමේන්තුවේ මොන මැ නිලධාරියෙකුට වත්, නමින් අමතා අයැදුම්පත් නො එවිය යුතු අතර, මෙම කාර්යාලයයේ කිසිම නිලධාරියෙකුට අයැදුම් පත් අතේ ගෙනැවිත් බාර දීම ද නොකට යුතු යැ.

(ඉ) රු. 20ක වටිනාකම ඇති මුද්දර අයැදුම් පතෙහි අලවා, එය මත අයැදුම්කරුගේ අත්සන තැබීමෙන් එය අවලංගු කළ යුතු යැ.

(ඊ) අයදුම්කරු යම් තැනැත්තකු යටතේ සේවය කරයි නම්, තමා මෙම පුහුණුවීම පිණිස තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා නියමිත දිනට යතහැකි පරිදි, සේවයෙන් නිදහස් කිරීමට තම ස්වාමියාගේ කැමැත්ත ප්‍රකාශ කෙරෙන ලිපියක් ඉල්ලුම් පත්‍රය සමග අමුනා එවිය යුතුය.

**4. විභාග පරිපාටිය.**—පහත සඳහන් විෂයයන් සම්බන්ධ ප්‍රශ්න පත්‍ර සැපයෙන මෙම විභාගය පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය තත්ත්වයේ එකකි.

(අ) (1) **තරඟ විභාගය**—විභාගයේ කොටස් දෙකකි. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වූ අයදුම්කරුවන් කලින් දැනුම් දෙනු ලබන දිනයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා කොළඹට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය අයදුම්කරු (1) වැනි (භාෂාව හා රචනය) ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයූ භාෂා මාධ්‍යයෙන් පැවැත් වේ.

9. (1) රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තුවේ විධාන හෝ රෙගුලාසි සහ ආණ්ඩුව මගින් කලින් කලට නිකුත් කරනු ලබන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට ඔබ යටත් වෙනවා ඇත. සෑම පත්වීමක් ම ස්ථිර වන්නේ අවුරුදු 3ක පරීක්ෂණාත්මක කාලසීමාවකින් පසුව ය.

(2) මුළු විභාගයටම සිංහල භාෂා මාධ්‍යයෙන් පෙනී නොසිටි ආධුනිකයින් පත්වීම් සඳහා තෝරා ගනු ලැබුවහොත් පරීක්ෂණාත්මක කාලය තුළ දී ඔවුන් සිංහල භාෂාව ඉගෙනගත යුතු ය. පරීක්ෂණාත්මක කාලසීමාව අවසාන යේ දී මෙම අයදුම් කරුවන්ගේ පත්වීම් ස්ථිර කරනු ලබන්නේ, අන් කරුණු ද ඇතුළුව, සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් සමත් වුවහොත් පමණකි.

(3) පරීක්ෂණාත්මක කාලය තුළ දී සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයකට එළඹිය නොහැකි වූවන්ගේ සේවය නවතාලීමට ඉඩ තිබේ. එහෙත් රාජ්‍ය භාෂාව ඉගෙනීමෙහි ලා නිර්ව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැයි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාට පෙනී ගියහොත් එසේ සේවාව නවතාලීම කල් දමනු ඇත. ඉන්පසු සෑහෙන කාලසීමාවක් තුළ දී ආධුනිකයින් එම පරීක්ෂණයෙන් සමත් වුවහොත් ඒ පිළිබඳ වගකීම උසුලන නිලධාරියාගේ අභිමතය පරිදි ජ්‍යෙෂ්ඨත්වයෙන් පහළ යාමද වෙනස් කරනු ලැබිය හැක.

(4) රජයේ සේවයට පත් කරනු ලබන සෑම "නව ප්‍රවේශකයකුම" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත් විශේෂයෙන් ම වර්ෂ 1956 යේ 33 වැනි අංකය දරණ රාජ්‍ය භාෂා පණතේ වගන්තීන් ක්‍රියාත්මක කිරීම සඳහාත් දනට පනවා ඇත්තාවූත්, මතුවට පනවනු ලබන්නාවූත් ව්‍යවස්ථාවලට අනුකූලව ඔබ විසින් ක්‍රියා කළ යුතු ය.

(5) අවුරුද්දක් සතුටුදායක ලෙස සේවය කළ පසු නිලධාරීන්ගේ ප්‍රථම වැටුප් වර්ධකය ගෙවනු ලබන්නේ එන්නත් කිරීම සහ කොකු පණු ප්‍රතිකාරය කිරීම පිළිබඳ ප්‍රවීණතා සහතිකය ලැබුවහොත් පමණකි. පත්වීම ලැබූ මුල් වර්ෂය තුළ දී එන්නත් කිරීම හා කොකු පණු ප්‍රතිකාරය දීම පිළිබඳ ප්‍රවීණතා සහතිකය ලබා ගැනීමට අසමත් වුවහොත් ප්‍රථම වැටුප් වර්ධකය නතර කරනු ලැබේ. ඉන් පසුව එම අසමත් වීම නිසා වැටුප් වර්ධකය විලම්බනය කිරීමට ද හේතු වේ. එහෙත් ප්‍රවීණතා සහතිකය නොලබන නිලධාරීන්ගේ සේවය නතර කිරීමේ බලය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා සතු වන්නේ ය.

10. **රාජකීය සෞඛ්‍ය සංගමයේ සහතික ප්‍රදානය කිරීම.**—සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට බැඳී අවුරුද්දක් සතුටුදායක අන්දමින් සේවය කළ මහජන සෞඛ්‍ය පරීක්ෂකයින්ට ලන්ඩන් රාජකීය සෞඛ්‍ය සංගමයේ සහතික පත්‍ර ප්‍රදානය කරන සේ නිර්දේශ කරනු ලැබේ.

11. යෝග්‍යතා පරීක්ෂණයෙන් වරක් අසමත් වූ අයදුම්කරුවකුට පුහුණුවීමට හෝ පරීක්ෂණයකට හෝ කැඳවනු ලබන්නේ රාජකීය සෞඛ්‍ය සංගමයේ ප්‍රාදේශීය විභාග මණ්ඩලය මගින් කෙරෙන ඉල්ලීමකට සෞඛ්‍ය අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලැබුණහොත් පමණකි.

12. මෙහි ඉහත සඳහන් අවශ්‍යතාවයන් සියල්ල සම්පූර්ණ නොවූ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13. අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් ඒ සඳහා යොදනු ලැබූ මුද්දරවල වටිනාකම ආපසු ගෙවනු නොලැබේ. අයදුම්කරුවකුට අසනීපයක් නිසා විභාගයට ඉදිරිපත්වීමට නොහැකි වුවහොත් ඒ බවට ලියාපදිංචි වූ සුදුසුකම් ඇති වෛද්‍යවරයකුගේ වෛද්‍ය සහතික යක් ඉදිරිපත් කළ විට මුද්දර ගාස්තුවලින් 3/5 ක් ආපසු ගෙවනු ලැබේ.

14. මෙහි පහත දැක්වෙන ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1964 ජූනි 1 වැනි දිනට පෙර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවර යාට ලැබෙන සේ එවිය යුතු ය.

බී. කේ. ද සිල්වා,
නියෝජ්‍ය (මහජන සෞඛ්‍ය සේවා) අධ්‍යක්ෂ.
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1964 මැයි මස 11 දින,
කොළඹ දී ය.

## අයදුම් පත්‍රයේ ආකෘතිය

**ආධුනික මහජන සෞඛ්‍ය පරීක්ෂකයින්ගේ විභාගය**

1. නම (මුලකුරු සහිතව) :————.

නාමය :————.

පෙලපත් නාමය :————.

2. ලිපිනය :————,

3. වයස හා උපන් දිනය :————.

4. ජාතිය :————.

5. විවාහක ද, අවිවාහක ද යන වග :————.

6. පුරවැසි භාවය :—

(අ) පරම්පරාවෙන් ද ? :————.

(ආ) ලියාපදිංචි කිරීමෙන් ද ? :————.

————.

පුරවැසි භාවය ලැබුවේ පරම්පරාවෙන් නම් පහත සඳහන් තොරතුරු සැපයිය යුතුය :—

(අ) අයදුම්කරු උපන් ස්ථානය :————.

(ආ) අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ ආත්තා උපන් ස්ථානය :————.

(ඇ) අයදුම්කරුගේ පිය පස මුත්තා උපන් ස්ථානය :————.

අයදුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) සමග (ආ) හෝ (ඉ) (ඊ) යන දෙක හෝ පිරවිය යුතු ය. අයදුම්කරු උපන්නේ ලංකාවේ නොවේ නම් (අ) සමග (ආ) (ඉ) යන දෙකින් එකක් හෝ (ඉ) (ඊ) යන දෙකින් එකක් හෝ පිරවිය යුතුය.

7. අවසාන වශයෙන් සමත්වූ විභාග හා ඉගෙනීම ලත් පාඨශාලාව :————.

8. විභාගයට ඉදිරිපත් වනුයේ කවර භාෂා මාධ්‍යයකින් ද ? සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි :————.

9. දෙමව්පියන්ගේ ලිපිනය හා ඔවුන්ගේ පුරවැසි භාවය :————. (පරම්පරාවෙන් ද, ලියාපදිංචි කිරීමෙන් ද යන වග)

10. ක්‍රිකට්, පාපන්දු හා බාලදක්ෂ වැනි පාඨශාලා කටයුතු වලට සහභාගි වී තිබේ ද ? :————.

11. අයදුම්කරු දනට කරන රක්ෂාව :————.

12. රක්ෂාවක නියුක්ත නම් ඔබේ ස්වාමියා ඔබට පුහුණුවීමට යාහැකිවන පරිදි නිදහස් කරයිද :————.

13. ඔබ මීට පෙර පුහුණුවීමේ පන්තියට ඇතුළු වී තිබේද ? :————.

(උප්පැන්න සහතිකයේ සහ චරිත සහතිකවල පිටපත් එවිය යුතු නොවේ. සම්මුඛ පරීක්ෂණයේ දී සහතිකවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුතු ය. එම සහතික සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් නොකරන අය නුසුදුස්සන් කරනු ලැබේ.)

මම අකාර්යක්ෂම භාවය නිසා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා හෝ අස් කරනු ලබා හෝ නොමැති බවත් ක්‍රිමිනල් වරදකට උසාවියක් මගින් දඬුවම් ලබා නොමැති බවත් ප්‍රකාශ කරමි. තවද මේ සම්බන්ධ යෙන් අසත්‍ය ප්‍රකාශයක් කළහොත් ඊට දඬුවම් වශයෙන් රාජ්‍ය සේවයෙන් එහා පහකරනු ලබන බවත් මම දනිමි. (අයදුම්කරු විසින් රුපියල් 20 ක මුද්දර අලවා ඒ මත අත්සන් කළ යුතු සි.) යුතු සි.)

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5–456—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## යුද්ද හමුදා මූලස්ථානය

1964 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1965 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා වූ කාල සීමාව තුළ පහත සඳහන් සේවාවන් කරදීම සඳහා, 1964 ජූනි මස 5 වැනි සිකුරාදා පෙරවරු 9.30 දක්වා කොළඹ 1, සෙනෙට් ගොඩනැගිල්ලේ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ :—

(1) කොළඹ, පනාගොඩ, ත්‍රිකුණාමලේ, යාපනේ, අම්පාරේ, මන්නාරම, දියතලාව, අයියකච්චි සහ සිලවතුරෙයි යන ස්ථානවල පිහිටා ඇති යුද්ද හමුදා කඳවුරුවලට එළවළු සහ පලතුරු සැපයීම.

(2) දියතලාවේ පිහිටා ඇති යුද්ද හමුදා සහ ගුවන් හමුදා කඳවුරු වලට එළවළු සහ පලතුරු සැපයීම.

පූර්වෝක්ත සේවාවන් සඳහා එකිනෙකට රු. 75 බැගින් ටෙන්ඩර් මුදලක් තැන්පත් කිරීමෙන් පසුව, මේ සම්බන්ධව සම්පූර්ණ විස්තර දැන ගත හැකි, කොළඹ පහළ වැව පාරේ තැ. පෙ. 553 යුද්ද හමුදා මූලස්ථානයෙන් 1964 ජූනි 4 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍රිකා ලබාගත හැකිය.

ජී. ආර්. ජයසිංහ,
මේජර්,
යුද්ද හමුදා ආඥාපති වෙනුවට.

1964 මැයි මස 8 වැනි දින,
යුද්ද හමුදා මූලස්ථානයේ දී ය.

5–354—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## කොළඹ වරාය කොමිෂන් සභාව

### රෙදි සේදීම සඳහා ටෙන්ඩර් කැඳවීම

කොළඹ වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1964 මැයි මස 28 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 දක්වා නාවික නියමු ස්ථානයේ, ප්‍රධාන මුර සංචාරක්ෂක නිලධාරි තැනගේ කාර්යාලයේ, ඇපොතිකරි දෙදෙනාගේ කාර්යාලවල, ලේඛනාගාරයේ සහ "කකුළුවා" මඩ හාරන යාත්‍රාවේ වර්ෂියක් තුළ රෙදි සේදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1964 මැයි මස 28 වැනි බ්‍රහස්පතින්ද පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිබඳ ලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 50 ක මුදලක් කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේ තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

3. ඉහත සඳහන් අන්දමට ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1964 මැයි 27 වැනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති නිකුත් කරනු ලැබේ. පිළිගත් ටෙන්ඩරය සඳහා ඇපකරුවන් අවශ්‍ය වේ නම්, ඔවුන් සැපයීමට ටෙන්ඩර්කරු සූදානමින් සිටිය යුතුය. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයේ සිට යටත් පිරිසෙයින් දින 60 ක් සෑම ටෙන්ඩරයක්ම වලංගුව පවතී.

එම්. චන්ද්‍රසෝම,
වරාය කොමසාරිස්.

5–340—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

නැගෙනහිර පළාතේ මඩකලපු දිස්ත්‍රික්කයේ වෙන්කලි අඩි උප කොටසේ වැලිගහකන්ඩිය වැවට ප්‍රතිකර්ම විධිවිධාන සඳහා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් අයැදුම් පත්‍ර කොළඹ 1, මහා ලේකම් ගොඩනැගිල්ලේ අංක 355 දරණ කාමරයෙහි කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1964 ජූනි මස 9 වැනි දින අඟහරුවාදා පූ. භා. 10 වන තෙක් භාරගනු ලැබේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 1,00,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ පස්වැඩ කිරීමට යෝග්‍ය යන්ත්‍ර ඇති කොන්ත්‍රාත් කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයැදුම් පත් ඉදිරිපත් කළ හැක. මඩකලපුවේ නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත් ටෙන්ඩර් ෆෝර්ම අනුපිටපතක් සමග පුරවා ඉදිරිපත් කළ යුතුය.

රුපියල් 200ක ටෙන්ඩර් ඇප මුදලක් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් කාර්යාලයීය වේලාවන් තුළදී 1964 ජූනි මස 5 වෙනි සිකුරාදා හෝ ඊට පෙර ටෙන්ඩර් ෆෝර්ම ලබා ගතහැක.

මේ ගැන වැඩි විස්තර මඩකලපුවේ නැගෙනහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායර්ාලයෙන් ලබාගත හැක.

ඇස්. පෙරියතම්බි,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1964.5.2,
කොළඹ.

5–245—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### මහියංගන උප කොට්ඨාශය

මහියංගන වාරිමාර්ග කඳවුරට ජලය සැපයීමේ ක්‍රමය (එස්ලෝන් පයිප්ප යොදා) සඳහා ටෙන්ඩර් පත් 1964 ජූනි මස 10 වන දින පෙරවරු 10 දක්වා බණ්ඩාරවෙල, ඌව කොට්ඨාශයේ ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 16,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1964 ජූනි මස 6 වෙනි සෙනසුරාදා වන තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී මහියංගන උප කොට්ඨාශය භාර නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා උප කොට්ඨාශය භාර නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ෆෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 25ක ටෙන්ඩර් තැන්පත් මුදලක් උප කොට්ඨාශය භාර නිලධාරි තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාල වේලාවන් තුළදී මහියංගනය උප කොට්ඨාශය භාර නිලධාරි තැනගෙන් ලබාගත හැකිය.

එච්. ඩී. සී. ගුණවර්ධන,
මහියංගනය උප කොට්ඨාශය භාර නිලධාරි තැන.

1964 මැයි මස 5 වන දින,
වාරිමාර්ග කාර්යාලය, මහියංගනය.

5–274—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### හසලක උප කොටස

හසලක උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1964.6.10 වැනි බදාදා පෙරවරු 10 දක්වා මහනුවර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේදීම සිදුකෙරේ :—

| කාර්යයේ විස්තර | ලියාපදිංචි ඇති ප්‍රමාණය රු. | ශ. | | තැන්පත් මුදල් ගණන රු. | ශ. |
|---|---|---|---|---|---|
| (1) ප්‍රධාන ඇලේ සැ. 23 දම. 17 දරණ ස්ථානයේ අඩි 130ක් දිග වාන සහිත පැන්නුම් පාලම සෑදීම ... | 50,000 | 0 | ... | 50 | 0 |
| (සිමෙන්ති, හියුම් පයිප්ප, කොලර්, මෘදු යකඩ (ඇම්. ඇස්. බාර්ස්) සහ බී. ආර්. සී. ෆැබ්රික් දෙපාර්තමේන්තුවෙන් සපයා වැඩපලට ගෙන ගොස් දෙනු ලැබේ. | | | | | |
| (2) හසලක කුඩා වැවේ ඇතුළුවන සොරොව්වට සොරොව් දොරටු සැපයීම ... | 35,000 | 0 | ... | 50 | 0 |
| (3) හසලක කුඩා වැවේ පිටවන සොරොව්වට දොටුර සැපයීම ... | 35,000 | 0 | ... | 50 | 0 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ප්‍රමාණවලට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට පමණක් මේ වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1964.5.8 වැනි සඳු දින පෙරවරු 9 සිට 1964.6.8 වැනි දින දවල් 12 දක්වා හසලක උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කායර්ාලයෙන් ලබා ගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත්, වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් හා දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ෆෝර්ම නිකුත් කිරීමට ප්‍රථම ඉහත සඳහන් ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායර්ාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත්කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම වැඩ ගැන සියළුම විස්තර යනාදිය කාර්යාලීය වේලාවන් තුල දී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

ජේ. ඒ. ජේ. ජයසූරිය,
වාරිමාර්ග ඉංජිනේරු තැන, හසලක උ. කො.

වාරිමාර්ග කාර්යාලය, හසලක
පල්ලේවත්ත, 1964.4.27 දින.

5–193—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—පුත්තලම උප කොට්ඨාශය

1. වයඹ කොට්ඨාශය භාර කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයැදුම් පත්‍ර 1964 ජූනි මස 2 වෙනි අඟහරුවාදා පෙ. ව. 10.00 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහි දී සිදු කෙරේ:—

| වැඩෙහි නම | කොන්ත්‍රාත්කරු ලියාපදිංචි විය යුතු ගණන | | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|
| | රු. | | රු. |
| (1) පහරිය වැව යටතේ ඇති ඉඩම්වලට වාරිමාර්ග සැපයීම සඳහා ව. ඉවුරේ ප්‍රධාන ඇලේ 1 වැනි සැතැක්ම සහ 2 වෙනි සැතැක්ම | 49,000 | ... | 50 |
| (2) පහරිය වැව යටතේ ඇති ඉඩම්වලට වාරිමාර්ග පහසුකම් සැපයීම සඳහා ව. ඉ. ප්‍රධාන ඇලේ 1 වෙනි හා 2 වෙනි බෙදුම් ඇලවල් හා ප්‍රධාන ඇලේ නිර්මාණයන් | 19,000 | ... | 25 |

2. ඉහත දැක්වෙන එක් එක් වැඩය සඳහා පෙන්නුම් කරන ගණන්වලට හෝ ඊට වැඩි ගණනකට මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් ඒ ඒ වැඩ සඳහා ටෙන්ඩර් අයැදුම්පත් ඉදිරිපත් කළ හැක.

3. වර්ෂ 1964 මැයි මස 29 වෙනි සිකුරාදා වන තෙක් එදින ඇතුළුව කායඨාලීය වේලාවන් තුලදී පුත්තලම උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඨාලයෙන් ලබාගත් පෝර්මවල ටෙන්ඩර් අයැදුම්පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම ඉහත සඳහන් ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඨාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩර් ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම්, වැඩ පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කායඨාල වේලාවන් තුළ දී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

එම්. එම්. සිවප්‍රගාසම්,
පුත්තලම උප කොට්ඨාශය භාර
වාරිමාර්ග ඉංජිනේරු තැන.

වාරිමාර්ග කායඨාලය, පුත්තලම,
1964 මැයි මස 7 වැනි දින.

5–359—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### අල්ලේ ව්‍යාප්ති ව්‍යාපාරය

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, අල්ලේ ව්‍යාප්ති ව්‍යාපාරයේ අල්ලේ–කන්තලේ පාරේ පහත සඳහන් කොටස් වැඩි දියුණු කිරීම සඳහා ත්‍රිකුණාමලයේ ''ඕර්ස්හිල්'' හි ත්‍රිකුණාමල කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් 1964 ජූනි මස 9 වන කුජ දින පූ. භා. 10.00 වන තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| | සැතැප්ම | | | ලියාපදිංචි මුදල | | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|---|---|---|
| | | | | රු. | | රු. |
| (1) | සැ. 14, අඩි 2,400 | සිට සැ. 15 දක්වා | ... | 21,000 සහ වැඩි | ... | 25 |
| (2) | සැ. 15 | සිට සැ. 16 ,, | ... | 40,000 ,, ,, | ... | 50 |
| (3) | සැ. 16 | සිට සැ. 17 ,, | ... | 40,000 ,, ,, | ... | 50 |
| (4) | සැ. 17 | සිට සැ. 18 ,, | ... | 40,000 ,, ,, | ... | 50 |
| (5) | සැ. 18 | සිට සැ. 19 ,, | ... | 40,000 ,, ,, | ... | 50 |
| (6) | සැ. 19 | සිට සැ. 19, අඩි 2,400 දක්වා | ... | 15,000 ,, ,, | ... | 25 |

2. ඉහත සඳහන් කොටස් ඉදිරියෙන් දක්වා ඇති ගණන්වලට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සන් වෙති.

3. 1964.5.22 සිට 1964.6.4 දක්වා කායඨාල වේලාවන් තුලදී අල්ලේ ව්‍යාප්ති ව්‍යාපාරයේ වාරිමාර්ග ඉංජිනේරු කායඨාලයෙන් ලබාගත හැකි පෝර්ම වල ටෙන්ඩර් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරණ වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශනයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද, නැද්ද, යනු සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම ලබා ගැනීමට ප්‍රථම ඉහත සඳහන් ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කොට ඊට කුවිතාන්සියක් ලබාගත යුතුය.

4. මේ ටෙන්ඩර් ගැන සියලු වැඩි විස්තර අල්ලේ ව්‍යාප්ති ව්‍යාපාරයේ වාරිමාර්ග ඉංජිනේරු කායඨාලයෙන් ලබාගත හැක.

ප. සිවසුබ්‍රමණියම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
අල්ලේ ව්‍යාප්ති ව්‍යාපාරය.

වාරිමාර්ග කායඨාලය,
සෝමපුර, 1964.5.8.

5–401—63.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—අනුරාධපුර උප කොට්ඨාශය

අනුරාධපුර උප කොට්ඨාශයේ ඒ. එල්. 3, බෙලිගමුව-නිලාගම-දේවහුව පාරේ ගල් සහ තාර දැමීම සඳහා ටෙන්ඩර් පත් 1964 ජූනි මස 9 වැනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා උතුරු මැද කොටසේ අනුරාධපුර ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එහිදී එදිනම කරනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 44,000 කට හෝ ඊට වැඩි ගණන් වලට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් භාරගනු ලැබේ.

3. වර්ෂ 1964 ජූනි මස 5 වැනි සිකුරාදා වනතෙක් (එදින ඇතුළුව) කාර්යාලයීය වේලාවන් තුළදී අනුරාධපුර වාරිමාර්ග ඉන්ජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම කොළ සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ඉල්ලුම් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැඩ සහ ඒවායේ වර්තාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර කිරීමට ඉඩ තිබේද? නැත්ද? යන්න ගැන සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉන්ජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රු. 50 ක තැන්පත් මුදලක් වාරිමාර්ග ඉන්ජිනේරු තැනගේ කාර්යාලයේ හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. මේ සම්බන්ධයෙන් ගිවිසුම, වැඩ සැලසුම් ආදී වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළදී වාරිමාර්ග ඉන්ජිනේරු තැනගෙන් ලබා ගත හැකි ය.

එම්. රත්නම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
අනුරාධපුර උ. කො.

1964 අප්‍රේල් 28 වන දින.

5–172—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කරදියන් ආරු ගොවිපලේ වී විකිණීම

වවුනියාවේ ගොවිපල පාලන හා නිෂ්පාදන පිළිබඳ කෘෂිකර්ම කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් කරදියන් ආරු ගොවිපලේ බැත අඩියෙ වී බුසල් 968ක් (දෙවෙනි වර්ගය) විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1964 මැයි මස 27 වැනි දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ.

මෙම වී සියල්ලම තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් කොන්ත්‍රාත්තුව අත්සන් කර සතියක් ඇතුළත මුළු මුදල ගෙවා ඉවත් කර ගත යුතුයි.

2. වවුනියාවේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා. නි.) ගෙන් ගන්නා ලද පෝර්මවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම දෙපිටපතකින් යුක්ත විය යුතු අතර නිසි ලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා, වවුනියාවේ, කෘෂිකර්ම කාර්යාලයේ (ගො. පා. හා. නි.) ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට ඉදිරිපත් කළ යුතුයි. කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි "කරදියන් ආරු ගොවිපලේ වී විකිණීම" කියා සඳහන් කළ යුතුයි.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට රිසිට් පත් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. 1964 මැයි මස 27 වැනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ඕනෑම කච්චේරියක හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ මෙම ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ හැක. ගිවිසුම් පත්‍ර අත්සන් කළ පසු මෙම මුදල ආපසු ගෙවනු ලැබේ. තෝරාගත් ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය භාරගත් බව දන්වා දින 10ක් ඇතුළත අවශ්‍ය ඇප තැන්පත් කිරීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නො හැකි විණි නම් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් ගාස්තුව රාජසන්තක කරනවාත් හැර ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත්තු පැහැර හැරියවුන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. එහෙත් මේ නිසා ඔහුයෙන් රජයට අයවිය යුතු යම් මුදලක් වේනොත් එය අයකර ගැනීමට බාධාවක් නොවේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් මුද්‍රා තැබූ කවරවල බහාලන ලද ටෙන්ඩර් පත්‍ර "කරදියන් ආරු ගොවිපලේ වී විකිණීම" යනුවෙන්ද ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද කවරයේ සඳහන් කොට "වවුනියාවේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා. නි.), ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා" වෙත ටෙන්ඩර්කරු විසින් හෝ ඔහුගේ නියෝජිතයින් විසින් පුද්ගලිකව භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන දිනම, ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දන්වීමක් නො ලැබුණි නම් ඒ බව වවුනියාවේ ගො. පා. හා. නි. පිළිබඳ කෘෂිකර්ම කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ඔහු විසින් වහාම දන්විය යුතුයි.

5. කැමති නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර ඇත. ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අවසාන දින එකී වේලාවට වවුනියාවේ ගො. පා. හා. නි. පිළිබඳ කෘෂිකර්ම කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. පිළිගත් පෝර්මයෙහි ඉදිරිපත් නොකරන ලද හෝ එහි සඳහන් කොන්දේසිවලට එකහෙලා අනුකූල නොවන කිසිම ටෙන්ඩර් පත්‍රයක් පිළිගනු නොලැබේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ලිපිනයන් ටෙන්ඩර් පත්‍රිකාවේ පැහැදිලි ලෙස සඳහන් කළ යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කොට සති තුනක් ගතවන තුරු ටෙන්ඩර් පත්‍රිකා පිළිගැනීම සඳහා ඉඩ ඇති බව ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුය.

9. කිසියම් ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේත් ටෙන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමේත් අයිතිය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතුය.

10. ටෙන්ඩර් කරන ලද කාර්ය සපුරාලීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට තෝරාගත් ටෙන්ඩර්කරුට සිදුවනු ඇත. මෙහිදී "ලාංකික" යන වචනය පෙලපතින් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසි භාවය අයිති යන අර්ථය ගෙන දේ.

11. පෞද්ගලිකව ටෙන්ඩර්කරු වෙත භාරදෙන ලද හෝ ටෙන්ඩර් පත්‍රයේ සඳහන් ලිපිනයට තැපෑලෙන් යවන ලද හෝ ටෙන්ඩරයට අදාල සෑම දන්වීමක්ම ටෙන්ඩර්කරු අතට පත් කළාසේ සළකනු ලැබේ.

12. 1934 වර්ෂයේ අංක 19 දරණ කම්කරු ආඥා පනතේ (117 වැනි අධිකාරිය) යටතේ සේවයෙහි යොදන ලද කම්කරුවෙකු විසින් හෝ කම්කරුවෙකු වෙනුවෙන් ඉල්වනු ලබන වන්දියකින් කොන්ත්‍රාත්කරු විසින් රජය නිදහස් කළ යුතුයි.

13. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයෙකු සේවයේ යෙදවීම අහිතකර දෙයක් ලෙස සලකා ඊට විරෝධය දක්වීමේත්, යම් කම්කරුවෙකු සේවයේ යෙදවීමට කලින් විරුද්ධවීමේත් අයිතිය රජය සතු වන්නේ ය.

14. වැඩ පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජය මගින් තබා ඇති ලේඛනයේ තනි තනිව හෝ ලේඛනයේ නම් සඳහන් වෙනත් අයෙකුගේ නම සමඟ හෝ ඇතුළු වී සිටින යම් පුද්ගලයෙකු සමග හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාට හැඟී යන හේතු නිසා හෝ කොන්ත්‍රාත්තුව භාරදීම නුසුදුස්සකු ලෙස සලකා ඔහු විසින් විරෝධය දක්වන කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

15. මේ පිළිබඳව වැඩි විස්තර කරදියන් ආරු ගොවිපලේ කළමනාකාර තැනගෙන් දැනගත හැකිය.

ඒ. ඊ. ඇම්. සිල්වා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1964 මැයි මස 5 වැනි දා,
පේරාදෙණියේදීය.

5–283—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

යේ තුන් උඩ, කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන්ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළදී කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක් දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජනසේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින් වෙන්නේ දනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරන නිලධාරි තැනය. ගිවිසුම පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1964 ජූනි මස 1 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිල ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිල ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවනතුරු වලංගුව තැබිය යුතුය.

ඇම්. ඩී. අමරසිංහ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
කොළඹ දිස්ත්‍රික්කය.

කොළඹ දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
326, ඩීන්ස් පාර, කොළඹ 10.
1964 මැයි මස 11 දින දීය.

5–451—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## ජලසම්පාදන සහ ජලාපවහන දෙපාර්තමේන්තුව

### ජලය පවිත්‍ර කිරීමේ යන්ත්‍රාගාරය

කුරුණෑගල ජලය සැපයීමේ යෝජනා ක්‍රමයෙහි, ජලය පවිත්‍ර කිරීමේ යන්ත්‍රාගාරය තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ පළාත් පාලන හා ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1964 අගෝස්තු මස 7 වැනි සිකුරාදා පූ. භා. 9.30 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන වේලාව වන එදින පූ. භා. 10 ට ටෙන්ඩර්කරුවන් එතනට පැමිණිය යුතුය.

2. රත්මලානේ, ජලසම්පාදන සහ ජලාපවහන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තැන (ඉදි කිරීම් සහ නඩත්තු) ගෙන් පෝරම කොළ ලබාගෙන අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියළු විස්තර සහ සැලැස්මවල් ඔහුගේ කාර්යාලයෙන් බලාගත හැක.

3. 1964 ජූනි මස 5 වැනි සිකුරාද දහවල් 12 ට පෙර ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල රත්මලානේ, ජලසම්පාදන සහ ජලාපවහන දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකිය.

4. මෙම වැඩය සඳහා මෙහි පහත දැක්වෙන සුදුසුකම් ඇති කොන්ත්‍රාත්කරුවන් සුදුස්සන් වෙත් :—

(ඒ) ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ "ඒ" සහ "බී" කාණ්ඩයේ ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන් (ලියා පදිංචිය පිළිබඳ ලියවිලි ඉදිරිපත් කළ යුතුයි.)

(බී) "ඒ" සහ "බී" කාණ්ඩයේ සහ සම තත්ත්වයක් ඇති විදේශීය හා ප්‍රාදේශික කොන්ත්‍රාත්කරුවන්.

5. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන කල ටෙන්ඩර්කරුවන් විසින් වෙනත් ස්ථානවල වැඩි වශයෙන් නිරක්ෂ රේඛාසික පෙදෙස්වල කර ඇති මේ හා සමාන සහ යෝජිත වැඩය භාර ගැනීමට ඔවුන්ගේ කාර්ය මණ්ඩලයේ පූර්ණ සුදුසුකම් ලත් අය සිටින බවටද සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. ඔවුහු තමන්ට කර්මාන්ත ශාලා පහසුකම්ද, ලංකාවේ ප්‍රාදේශීය නියෝජිතයින් වශයෙන් ගැනෙන්නන් බවද සනාථ කිරීමට සාධක ඉදිරිපත් කළ යුතුවේ.

සී. රාසයියා,
අධ්‍යක්ෂ,
ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව.
1964 මැයි මස 9 වන ද,
රත්මලාන,
ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේදීය.

5–391—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හඳපාන්ගල ලී මෝල

### පිටපලු විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම

චන්ද්‍රිකාවැව ඉඩම් සංවර්ධන නිලධාරි වන මා විසින් පිටපලු භාර 1,500 ක් විකිණීම සඳහා 1964 මැයි මස 29 දින ප. ව. 2.30 දක්වා ලාංකික ටෙන්ඩර් කරුවන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. 1964 මැයි මස 27 දින දහවල් 12 දක්වා චන්ද්‍රිකාවැව ඉඩම් සංවර්ධන නිලධාරී කාර්යාලයයෙන් ටෙන්ඩර් පෝරම ලබාගත යුතු අතර ටෙන්ඩර් පෝරම් පිළියෙල කොට පිටපත් දෙකක් සහිතව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රයකට රු. 50 බැගින් ඇප මුදල් මගේ කාර්යාලයේ හෝ ලංකාවේ ඕනෑම දිසාපති කාර්යාලයක හෝ මුදල් තැන්පත් කිරීමෙන් පසු ටෙන්ඩර්පත්‍ර ලබාගත හැක. දිසාපති කාර්යාලයක මුදල් තැන්පත් කලෙහි නම් ටෙන්ඩර් පත්‍ර ලබාගැනීම සඳහා මුදල් තැන්පත් කිරීමේ කුවිතාන්සිය ඉදිරිපත් කල යුතුයි.

3. ටෙන්ඩර් පත්‍රවල පැහැදිලිව මිලගණන් සඳහන් කොට කවරය වසා සිල්තබා මගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ තැපෑලෙන් එවන්නෙහිනම් ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කළ හැක. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම බහා එවන ලද කවරයේ වම් පස උඩ කෙලවරෙහි "පිටපලු මිලදී ගැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුයි.

4. 1964 මැයි මස 29 දින ප. ව. 3.30 ට ටෙන්ඩර් පත්‍ර චන්ද්‍රිකාවැව ඉඩම් සංවර්ධන නිලධාරිවන මා විසින් විවෘත කරනු ලැබේ. ඉල්ලුම් කරුවන්ට තමන් කැමතිනම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරණ අවස්ථාවේදී පැමිණිය හැක.

5. ටෙන්ඩර් කොටස් වසයෙන් හෝ පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ සම්බන්ධයෙන් ඉඩම් සංවර්ධන නිලධාරීගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

6. සතියේ කාර්යාලීය දිනවලදී හඳපාන්ගල ඉඩම් සංවර්ධන දෙපාතීමේන්තුවේ ලීමෝලට පැමිණ පිටපලු ප්‍රමාණය බලාගත හැක. වැඩි විස්තර අවශ්‍ය නම් මගේ කාර්යාලයෙන් හෝ හඳපාන්ගල ලී මෝලෙන් හෝ ලබාගත හැක.

7. පිළිගත් ටෙන්ඩර්කරුවා දින තුනක් ඇතුලත පිටපළු සඳහා සම්පූර්ණ මුදල් තැන්පත් කළ යුතු අතර සතියක් ඇතුලත ඒ සියල්ල ඉවත් කරගත යුතුයි.

චන්ද්‍රිකාවැව ඉඩම් සංවර්ධන නිලධාරි.
1964 අප්‍රේල් මස 21 දින,
චන්ද්‍රිකාවැව ඉඩම් සංවර්ධන කාර්යාලය යේ දී ය.

5–446—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් මරදානේ ට්‍රිපොලි වෙළඳ හලට, ට්‍රිපොලි වෙළඳ හලෙහි පිහිටි ආරෝග්‍යශාලා ආහාර සැපයීමේ මූලස්ථානයට සහ අනෙකුත් ආයතනයන්ට 1964.7.1 සිට 1965.6.30 දින දක්වා කුකුල් මස් සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත් කොළඹ 2, යූනියන් පෙදෙසේ පිහිටි කෘෂිකර්ම, ආහාර සහ සමූපකාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1964 ජූනි 9 වැනි දින අපරභාග 2.30 වන තුරු භාර ගනු ලැබේ. කොළඹ 1, චැතැම් වීදියේ, අංක 62 දරන, අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රුපියල් 100 ක් බැඳ ලබා ගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට 1964 ජූනි 9 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම ලබා ගත හැක. ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

ඇම්. ඩී. ඩබ්ලිව්. ආර්. සපරමාදු,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1964 මැයි මස 11 වන දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයේ දීය.

5–427—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් මරදානේ ට්‍රිපොලි වෙළඳ හලට සහ ට්‍රිපොලි වෙළඳ හලෙහි පිහිටි ආරෝග්‍යශාලා ආහාර සැපයීමේ මූලස්ථානයට සහ අනෙකුත් ආයතනයන්ට 1964.7.1 සිට 1964.12.31 දින දක්වා එළුමස් සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත් කොළඹ 2, යූනියන් පෙදෙසේ පිහිටි කෘෂිකර්ම, ආහාර සහ සමූපකාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1964 ජූනි 9 වැනි දින අපරභාග 2.30 වන තුරු භාර ගනු ලැබේ. කොළඹ 1, චැතැම් වීදියේ, අංක 62 දරන, අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රුපියල් 100 ක් බැඳ ලබා ගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට 1964 ජූනි 9 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම ලබා ගත හැක. ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

ඇම්. ඩී. ඩබ්ලිව්. ආර්. සපරමාදු,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1964 මැයි මස 11 වන දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයේ දීය.

5–428—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් බොරැල්ලේ මූළුතැන්ගෙයට, බේකරියට සහ නාරාහේන්පිට පිත් කිරීමේ කර්මාන්තායතනයට 1964.7.1 සිට 1964.12.31 දින දක්වා දර සහ පොල්කටු සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත් කොළඹ 2, යූනියන් පෙදෙසේ පිහිටි කෘෂිකර්ම, ආහාර සහ සමූපකාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1964 ජූනි 9 වැනි දින අපරභාග 2.30 වන තුරු භාර ගනු ලැබේ. කොළඹ 1, චැතැම් වීදියේ, අංක 62 දරන, අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රුපියල් 200 ක් බැඳ ලබා ගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට 1964 ජූනි 9 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම ලබා ගත හැක. ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

ඇම්. ඩී. ඩබ්ලිව්. ආර්. සපරමාදු,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1964 මැයි මස 11 වන දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයේ දීය.

5–425—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුවෙන් සාදන ලද නිවාස ක්‍රම 1964 වර්ෂය තුළ යථා අන්දමේ පවත්වාගෙන යාම, අළුත්වැඩියා කිරීම සහ සුළු එකතු කිරීම් සඳහා ටෙන්ඩර් කැඳවීමයි

ජාතික නිවාස දෙපාර්තමේන්තුවෙන් සාදන ලද පහත සඳහන් නිවාස ක්‍රම, 1964 වර්ෂය තුළ යථා අන්දමින් පවත්වාගෙන යෑම, අළුත්වැඩියා කිරීම සහ සුළු එකතු කිරීම් සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1964 මැයි මස 22 වෙනි සිකුරාදා පෙ. ව. 10 තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

| කොටස | | නිවාස ක්‍රමයන්හි ගම් සහ පිහිටි ස්ථාන |
| --- | --- | --- |
| "ඒ" කොටස | ... | කිරිබත්ගොඩ නිවාස ක්‍රමය,<br>දලුගම මයින කැම්ප් නිවාස ක්‍රමය,<br>අලුබෝගහ වත්ත නිවාස ක්‍රමය,<br>හැඳල නිවාස ක්‍රමය,<br>හේකිත්ත නිවාස ක්‍රමය සහ විටින් විට එකතු කරන වෙනත් ගොඩනැගිලි. |
| "බී" කොටස | ... | දෙවටගහවත්ත නිවාස ක්‍රමය,<br>අප්පුගෙවත්ත, නිවාස ක්‍රමය,<br>නාහේන නිවාස ක්‍රමය,<br>ගොංගිතොට නිවාස ක්‍රමය,<br>රාණිමඩම නිවාස ක්‍රමය,<br>එඬේරමුල්ල නිවාස ක්‍රමය,<br>පරණකන්දවත්ත නිවාස ක්‍රමය සහ විටින් විට එකතු කරන වෙනත් ගොඩනැගිලි. |
| "සී" කොටස | ... | ආදුරුප්පු වීදිය මහල් නිවාස ක්‍රමය,<br>බ්ලූමැන්ඩල් වීදිය මහල් නිවාස ක්‍රමය,<br>ආමර් වීදිය මහල් නිවාස ක්‍රමය, සහ විටින් විට එකතු කරන වෙනත් ගොඩනැගිලි. |
| "ඩී" කොටස | ... | පාසන්ස් පාරේ පිහිටි කාර්යාල ගොඩනැගිල්ල, බම්බලපිටිය මහල් නිවාස ක්‍රමය,<br>නුගගහවත්ත නිවාස ක්‍රමය, සහ විටින් විට එකතු කරන වෙනත් ගොඩනැගිලි. |
| "ඊ" කොටස | ... | මාලිගාවත්ත නිවාස ක්‍රමය,<br>තිඹිරිගස්යාය නිවාස ක්‍රමය,<br>කොල්ලුපිටිය මහල් නිවාස,<br>නාවල නිවාස ක්‍රමය,<br>සියඹලාගහවත්ත නිවාස ක්‍රමය, සහ විටින් විට එකතු කරන වෙනත් ගොඩනැගිලි. |
| "එෆ්" කොටස | ... | ගොතටුව, නිවාස ක්‍රමය,<br>දෙඩන්ගහගේන නිවාස ක්‍රමය,<br>බත්තරමුල්ල නිවාස ක්‍රමය,<br>බටලන්දහේන නිවාස ක්‍රමය සහ විටින් විට එකතු කරන වෙනත් ගොඩනැගිලි. |

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාණ ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම, වැඩි විස්තරද ඔහුගෙන් ලබා ගත හැක. එක් ටෙන්ඩර් කරුවෙකුට කොටස් දෙකකට 2 වඩා නොදෙනු ඇත.

රජයේ දෙපාර්තමේන්තුවේදී ගොඩනැගිලි වැඩ සඳහා හෝ යථා තත්ත්වයේ පවත්වාගෙන යෑම, අළුත්වැඩියා කිරීම සඳහා රුපියල් 15,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරණ ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුසුසෝ වෙති. ටෙන්ඩර් තැන්පත් මුදල එක කොටසකට රු. 25 ක් වේ. ලියාපදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත තැන්පත් මුදලක් තැබූබවට කුවිතාන්සියක් ඉදිරිපත් කරණ අයවළුන්ට 1964 මැයි මස 19 වැනි අඟහරුවාදා පෙ. ව. 11 තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ඩී. ට්. ඊ. ඒ. ද ෆොන්සේකා,
ජාතික නිවාස කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 544,
කොළඹ 2.
1964 අප්‍රේල් මස 27 වන දින දීය.

5–392—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## කැලෑ දෙපාර්තමේන්තුව

කැලෑ දෙපාර්තමේන්තුවට, අයත් නැගෙනහිර දිසාවේ කලමුනේ දැව ගබඩාවේ ඇති ඉරූ දැව තොග 6ක් විකිණීම සඳහා, කොළඹ වන සංරක්‍ෂක විසින් 64.5.29 වෙනි දින උදේ 10 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට ප්‍රථම, ඒ සඳහා වන සංරක්ෂක නමින්, රු. 25 ක ඇප මුදලක් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකුවේ අංක 34 ගණක අංකයට ගෙවා, බැංකු කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. මඩකලපුවේ දිසා වන නිලධාරිගෙන් ද ටෙන්ඩර් පත් ලබා ගැනීමට හැක. ඒ සඳහා රු. 25 ක මුදල් ඇනවුමක් මඩකලපුවේ දිසා කැලෑ නිලධාරි නමින් ලබාගෙන ඉදිරිපත් කළ විට, අවශ්‍ය ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර, දිසා වන නිලධාරි විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

1964 මැයි මස 28 වෙනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. වැඩි විස්තර හා ටෙන්ඩර් කොන්දේසි කොළඹ වන සංරක්ෂක කාර්යාලයයෙන් හෝ මඩකලපුවේ දිසාවන කාර්යාලයෙන් හෝ පැමිණ ලබාගත හැක.

වි. ජෝ. වීරරත්න,
වන සංරක්ෂක වෙනුවට.

වන සංරක්‍ෂණ කාර්යාලයය,
තැ. පෙ. 509,
කිව් පාර,
කොළඹ 2, 64.5.8.

**5–445—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය**

---

## කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත අඩවියේ කෙලින්කන්ද ජනපද යෝජනා ක්‍රමයෙන් කඳන් සපයනු සඳහා ටෙන්ඩර් පත්‍රය

අගලවත්ත අඩවියේ කෙළින්කන්ද ජනපද යෝජනා ක්‍රමයෙන් කඳන් සපයනු සඳහා කොළඹ 2, තැ. පෙ. අංක 509 දරණ තැන වන සංරක්‍ෂණ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

2. 1964 මැයි මස 30 වන දින දහවල් 12.00 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරන්නේ ලංකා බැංකුවේ කොළඹ, යෝර්ක් වීදියේ ශාඛාවේ වන සංරක්‍ෂකගේ වාසියට (අංක 34 ගිණුමට) රුපියල් 100 ක මුදලක් තැන්පත් කිරීමෙන් පසුව ය.

3. 1964 ජූනි මස 1 වන සඳු දින පෙ. ව. 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කරනු ඇත.

4. අවශ්‍ය වැඩිදුර විස්තර කොළඹ 2, තැ. පෙ. 509 දරණ තැන වන සංරක්‍ෂකගේ කායසීලයෙන් හෝ රත්නපුරේ හෙලිංස් පාරේ බටහිර දිශා වන නිලධාරීගෙන් හෝ අගලවත්තේ අඩවි වන නිලධාරීගෙන් හෝ ලබා ගත හැකි ය.

ම. නමසිවායම්,
වැඩ බලන වන සංරක්‍ෂක.

වන සංරක්‍ෂණ කායසීලය,
අංක 5, කිව් පාර,
තැ. පෙ. 509,
කොළඹ 2.

**5–452—64.5.15 දින අංක 14;035 දරන ගැසට් පත්‍රය**

---

## දකුණු දිශාවේ වලවේ නිම්නයේ අංක 3 කොටසින් සිල්පර, කඳන් හා ඉරාපු දැව සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍රය

වලවේ නිම්නයේ අංක 3 කොටසින් සිල්පර, කඳන් හා ඉරාපු දැව සපයනු සඳහා කොළඹ 2, තැ. පෙ. අංක. 509 දරන තැන වන සංරක්‍ෂණ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

2. 1964 මැයි මස 27 වන බදාදා දහවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරන්නේ ලංකා බැංකුවේ කොළඹ, යෝර්ක් වීදියේ ශාඛාවේ වන සංරක්‍ෂකගේ වාසියට (අක 34 ගිණුමට) රුපියල් 100 ක මුදලක් තැන්පත් කිරීමෙන් පසුව ය.

3. 1964 මැයි මස 28 වන බ්‍රහස්පතින්දා පෙ. ව. 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කරනු ඇත.

4. අවශ්‍ය වැඩිදුර විස්තර කොළඹ 2, තැ. පෙ. 509 දරණ තැන වන සංරක්‍ෂකගේ කාර්යාලයෙන් හෝ ගාල්ලේ දකුණු දිශා වන නිලධාරිගෙන් හෝ හම්බන්තොට අඩවි වන නිලධාරිගෙන් ලබා ගත හැකිය.

ම. නමසිවායම්,
වැඩ බලන වන සංරක්‍ෂක.

වන සංරක්‍ෂණ කායසීලය,
අංක 5, කිව් පාර,
තැ. පෙ. 509,
කොළඹ 2, 1964 මැයි මස 11 දින.

**5–455—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය**

---

## උඩරට දිශාවේ බින්තැන්නේ රජයේ අවශේෂ වනාන්තරයේ "බී" කොටසින් කඳන් සපයනු සඳහා ටෙන්ඩර් පත්‍රය—නුවරඑළිය

බින්තැන්නේ රජයේ අවශේෂ වනාන්තරයේ "බී" කොටසින් කඳන් සපයනු සඳහා කොළඹ 2, කිව් පාරේ, අංක 5, තැ. පෙ. අංක 509 දරන තැන වන සංරක්‍ෂණ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

2. 1964 මැයි මස 30 වන සෙනසුරාදා දහවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරන්නේ, ලංකා බැංකුවේ කොළඹ යෝර්ක් වීදියේ ශාඛාවේ වන සංරක්‍ෂකගේ වාසියට (අංක 34 ගිණුමට) රුපියල් 100 ක මුදලක් තැන්පත් කිරීමෙන් පසුව ය.

3. 1964 ජූනි මස 1 වන සඳු දින පෙ. ව. 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කරනු ඇත.

4. අවශ්‍ය වැඩිදුර විස්තර වන සංරක්‍ෂකගේ කායසීලයෙන් හෝ නුවරඑළියේ උඩරට දිශා වන නිලධාරීගෙන් හෝ බදුල්ලේ අඩවි වන නිලධාරීගෙන් ලබා ගත හැකිය.

ම. නමසිවායම්,
වැඩ බලන වන සංරක්‍ෂක.

වන සංරක්‍ෂණ කාර්යාලය,
අංක 5, කිව් පාර,
තැ. පෙ. අංක 509,
කොළඹ 2.

**5–453—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය**

---

## සිල්පර හා කඳන් සපයනු පිණිස දකුණු දිශාවේ වැඩ නොකරන ප්‍රදේශ 10 කින් ගස් කපා ගැනීම—දෙනියාය අඩවිය

දකුණු දිශාවේ, ගාල්ලේ දෙනියාය අඩවියේ වැඩ නොකරන ප්‍රදේශ 10 කින් සිල්පර හා කඳන් සපයනු පිණිස, කොළඹ 2, කිව් පාරේ අංක. 5, තැ. පෙ. අංක 509 දරන තැන වන සංරක්‍ෂණ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

2. 1964 මැයි මස 30 වන දින දහවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරන්නේ ලංකා බැංකුවේ කොළඹ, යෝර්ක් වීදියේ ශාඛාවේ වන සංරක්‍ෂකගේ වාසියට (අක 34 ගිණුමට) රුපියල් 100 ක මුදලක් තැන්පත් කිරීමෙන් පසුව ය.

3. එක් එක් ප්‍රදේශය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් ආකෘති පත්‍ර මුදල් තැන්පත් කළ යුතුය.

4. 1964 ජූනි මස 1 වන සඳු දින පෙ. ව. 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කරනු ඇත.

5. අවශ්‍ය වැඩිදුර විස්තර කොළඹ 2, තැ. පෙ. 509 දරන තැන වන සංරක්‍ෂකගේ කාර්යාලයෙන් හෝ ගාල්ලේ දකුණු දිශා වන නිලධාරිගෙන් හෝ දෙනියායේ අඩවි වන නිලධාරිගෙන් ලබා ගත හැකි ය.

ම. නමසිවායම්,
වැඩ බලන වන සංරක්‍ෂක.

වන සංරක්‍ෂණ කායසීලය,
අංක 5, කිව් පාර,
තැ. පෙ. 509,
කොළඹ 2, 1964 මැයි මස 11 දින.

**5–454—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය**

## ධීවර දෙපාර්තමේන්තුව

### ඩීසල් යාන්ත්‍රික බෝට්ටු ඇන්ජිමක් විකිණීම

ඩීසල් යාන්ත්‍රික බෝට්ටු ඇන්ජිමක් විකිණීම සඳහා ටැන්ඩර් කොළඹ 3, ගාලු මුවදොර, ධීවර අධ්‍යක්ෂ විසින් 1964 මැයි මස 29 වැනි දින පස්වරු 2 දක්වා බාරගනු ලැබේ. කොළඹ 15, මෝදර රජයේ ධීවර කර්මාන්ත ශාලාවේ දී මේ ඇන්ජිම පරීක්ෂා කළ හැක.

ටැන්ඩර් තැන්පත් මුදල රු. 50කි.

ඩී. ආර්. ඇල්. බාලසූරිය,
ධීවර අධ්‍යක්ෂ.

ධීවර දෙපාර්තමේන්තුව,
ගාළු මුවදොර,
කොළඹ 3,
1964 මැයි මස 4 වැනිදා.

5–210—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## ධීවර දෙපාර්තමේන්තුව

### නෝර්විජියානු වානේ ධීවර යාත්‍රාවක් විකිණීම

දැනට කල්පිටියේ නවතා තිබෙන දිග අඩි 30×9½ නෝර්විජියානු වානේ ධීවර යාත්‍රාවක් සහ වර්ග 1052කේ 24/30හේ බොලින්ඩර් මැරින් ඩීසල් ඇන්ජිම උපකරණ සමග විකිණීම සඳහා කොළඹ 3, ගාළු මුවදොර ධීවර අධ්‍යක්ෂ විසින් 1964 මැයි මස 29 වැනි දින පස්වරු 2 දක්වා ටැන්ඩර් බාරගනු ලැබේ.

මෙම යාත්‍රාව කල්පිටියේ ධීවර කාර්යාලය සමග පිළියෙළ කර ගනිමින් බලාගත හැකිය. ඇන්ජිම බලාගැනීම පිණිස මෝදර රොක් හවුස් ලේන් හි ධීවර කර්මාන්ත ශාලාවේ කළමනාකරු සමඟ පිළියෙළ කර ගත යුතුයි.

ටැන්ඩර් තැන්පත් මුදල රු. 100යි.

ඩී. ආර්. ඇල්. බාලසූරිය,
ධීවර අධ්‍යක්ෂ.

කොළඹ 3,
ධීවර දෙපාර්තමේන්තුව,
1964 මැයි මස 4 වැනිදා.

5–211—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## මහනුවර රජයේ ආරෝග්‍ය ශාලාවේ ශල්‍යාගාරවලට සිසිල් කිරීමේ හා ඇති කිරීමේ කාමරවලට සහ 'X' රේ ෂෙස්යා ශබඩාවට වායුසමන යන්ත්‍ර සැපයීමේ සහ පිහිටුවීමේ ටෙන්ඩර් සම්බන්ධවයි

ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1964 ක්වූ ජූලි මස 28 වන අඟහරුවාදා පූ. භා. 10 දක්වා ඉඩම්, වාරිමාර්ග සහ විදුලිය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 500, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන්ගේ කාර් යාලයෙහිදී කියවා බලාගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැප යීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5හේ මුදල ආපසු ගෙවනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් පෝර්ම වලයි. වර්ෂ 1964 ක්වූ ජූලි මස 24 වන දින ප. භා. 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1964 ක්වූ ජූලි මස 28 වන අඟහරුවාදා පූ. භා. 10ට ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලයේ නො. 355 හේ කාමරයේ පිහිටි ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවනට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. මුතුබාලසූරියර්,
වැ.බ. විදුලි කර්මාන්ත ප්‍රධාන කළමනාකාරතැන.

තැ. පෙ. 540,
කොළඹ 10,
1964 ක්වූ මැයි මස 15 වන දින දීය.

5–431—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## ගල්ඔය සංවර්ධන මණ්ඩලය

### උඩ වලවේ ජලාශ යෝජනා ක්‍රමය

පහත සඳහන් ලොරි සහ යන්ත්‍ර සැපයීම පිණිස 1964 ක්වූ, මැයි 28 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 10 දක්වා ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ උඩ වලවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. :—

(අ) ටොන් 5හේ ලොරි 3 යි.

(ආ) ටොන් 5හේ ටිපර් 5යි.

(ඇ) වැල්ඩින් යන්ත්‍ර 1 යි.

කොළඹ බුලර්ස් පාරේ අංක 415 දරන ස්ථානයේ ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල අනුපිටපතක් ඇතුව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුයි.

ජේ. ද. සී. මනම්පේරි,
සාමාන්‍යාධිකාරී,
උඩ වලවේ.
ගල්ඔය සංවර්ධන මණ්ඩලය.

5–429—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ රජයේ විදුලි දෙපාර්තමේන්තුව, මස්කෙලි ඔය යෝජනා ක්‍රමය—පළමුවෙනි පියවර

### කොන්ත්‍රාත් අංක 3—පොල්පිටිය විදුලි බලාගාරය සහ ඊට අදාල වැඩ සඳහා උපකරණ සහ වානේ නිර්මාණය

ඉහත සඳහන් කොන්ත්‍රාත්තුවේ යොදා ඇති පොල්පිටිය විදුලි බලාගාරය සඳහා විදුලි හා යාන්ත්‍රික උපකරණ සැපයීම පිණිස 1964 ජූලි 17 වැනි දින ලංකාවේ වේලාවෙන් පෙරවරු 10 ට හෝ ඊට ප්‍රථම කැනෙන්ඩියානු සැපයීම් කරුවන්ගෙන් සීල් තබන ලද ටෙන්ඩර්, ලංකාවේ කොළඹ, ඉඩම් වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් බාර ගනු ඇත. 1964 ජූලි 18 වැනි දින ලංකාවේ වේලාවෙන් පෙරවරු 10ට අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලය මගින් ටෙන්ඩර් විවෘත කරනු ඇත.

කොළඹ මැක්ලම් පාරේ රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකරුගේ කාර්යාලයේදී හෝ කැනඩාවේ වැන්කවුවර් 1, බී.සී. වෙස්ට්පෙන්ඩර් වීථියේ අංක 1112 පිහිටි ඉංගල්ඩෝ කීඩ් සහ ඇසෝසියේට්ස් සමාගමේ උපදේශක ඉංජිනේරු කාර්යාලයේ දී හෝ ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කිරීමට හෝ රු. 500 හෝ කැනේඩියන් ඩොලර් 100ක් ගෙවීමෙන් පසු මෙම කාර්යාලවලින් ලබාගැනීමට පුළුවන.

1964 ජූලි 11 දින දක්වා ටෙන්ඩර් ලියවිලි නිකුත් කරනු ඇත.

5–460—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

යොමු අංකය : එෆ්.ටී.බී./8/64

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### නිර්වින්දන උපකරණ සැපයීම

1. මෙහි පහත පෙනෙන උප ලේඛණයෙහි සඳහන් පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනට නිර්වින්දන උපකරණ සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත් සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1964 අගෝස්තු 25 වෙනි අඟහරුවාද උදේ 10 දක්වා බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුවේ. ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ ගාලු මුවදෙර පිහිටි මහ ලේකම් ගොඩනැගිල්ලේ ''බී'' අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගේ කායාර්ලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශයෙන්) ලබාගත හැක. මෙම දැන්වීමේ 5 වැනි 6 වැනි ඡේදයන්හි සඳහන් කරුණු අනුව 1964 අගෝස්තු 24 වෙනි සඳුද උදේ 10 දක්වා ඉල්ලුම් කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් සීල් තබන ලද කවරයක බහා, සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශය, තැ. පෙ. 500, පළමුවෙනි මහළ, මහා ලේකම් ගොඩනැගිල්ල, ගාලුමුවදෙර, කොළඹ යන ලිපිනයට එවිය යුතුවේ. සීල් තබන ලද ටෙන්ඩර්පත් බහාලන කවරයේ වම් කෙළවරේ උඩ ''නිර්වින්දන උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර් 1964 අගෝස්තු 25 වැනි දින උදේ 10 ට'' යනුවෙන් සඳහන් කළ යුතුවේ.

4. ටෙන්ඩර්පත් ගාලු මුවදෙර මහා ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ, කාමර අංක 155 හේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ එවීම කළ හැක. එහෙත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින්, තමන්ට අවශ්‍යයයි හැඟේ නම් සීල් තබන ලද ටෙන්ඩර්පත් සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ උප ලේකම් තැනවෙත පුද්ගලිකව ගෙනැවිත් බාරදීමද කළ හැක. එසේ බාරදෙන සීල් තබන ලද කවරයේ එය කිනම් සැපයීමක් සඳහාද යනවග හා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුවේ. එම ටෙන්ඩර්පත් බාර ගැනීම සඳහා ඉහතකී නිලධාරි තැනට බලය ඇත. සීල් තබන ලද ටෙන්ඩර් පත් බාරගත් බවට කුවිතාන්සියක් එවිට ටැන්ඩර්කරුවෙත ඔහු විසින් නිකුත් කරණු ලැබේ.

5. සුප්‍රසිද්ධ නිෂ්පාදන සමාගමක ඒජන්තවරයෙකුට හෝ වෙළඳ නියෝජිතයෙකුට වුවද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් අයදුම්කරු නම් කරන ලද නිෂ්පාදන සමාගමේ නියෝජිත ඒජන්ත වරයෙකු බව සහතික කල යුතුවේ. (මේ සඳහා නියෝජිතත්වය ඔප්පු කිරීමක් ඉදිරිපත් කළ යුතුවේ)

හෝ (බී) කොළඹ කච්චේරියෙන් පිට ඕනෑම කච්චේරියක හෝ කොළඹ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකුවේ මුදලින් රුපි. 100/– මගේ නමට තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

6. ලාංකික සම්බන්ධතා ඇති රටවල් වූ ඇල්මේනියාව, ඔස්ට්‍රියාව, බල්ගේරියාව, චීන මහජන සමූහ ආණ්ඩුව, චෙකොස්ලොවේකියාව, ටායිවාන්, ජර්මන් පෙඩරල් සමූහ ආණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, හන්ගේරියාව, ජපානය, කොරියාව, පෝලන්තය, රුමේනියා මහජන සමූහ ආණ්ඩුව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව, යුගෝස්ලේවියාව, වියට්නාම් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, ආදී රටවල් වලින් මෙම සැපයීම ආනයනය කර සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර් කරුවන් වෙතොත්, ඔවුන් ලියා පදිංචි කරන ලද වෙළෙන්දන් විය යුතු අතර ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද සාමාන්‍ය බඩු ගෙන්වීමේ වලංගු බලපත්‍රයක් ලත් ඇත්තේ විය යුතුයි. ටෙන්ඩර් ආකෘතිපත්‍ර ඉල්ලීමේදී ඉහත සඳහන් බලපත්‍රයක් හිමි බව ඔප්පු කල යුතුවේ.

7. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර මෙම දැන්වීමේ 2 වැනි ඡෙදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගේ කායාර්ලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශය) ලබාගත හැක. මෙම කායාර්ලයෙන් ලබාගත් ආකෘති පත්‍ර, කොන්දේසි පත්‍ර ආදිය භාවිතාකල හැක්කේ ස්වදේශීය ටෙන්ඩර් කරුවන්ට පමණි.

8. මෙහි පළමුවැනි ඡෙදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර් කරු විසින් ස්වකීය ගණන් යෝජනාව ටෙන්ඩර් බාරගැනීමේ අවසාන දින සිට යටත් පිරිසෙයින් මාස 2 ක් වත් විවෘතව තැබිය යුතුයි.

9. කෙලින්ම ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමැති විදේශීය නිෂ්පාදක මූලිකවරුන් වෙත ඔවුන්ගේ ලංකා නියෝජිතයින් සහ ඒජන්තවරුන් විසින් ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා මෙම ටෙන්ඩරය පිළිබඳ සියලුම විස්තර පහත සඳහන් රටවල සිටින ලංකා ආණ්ඩුවේ නියෝජිතයින්ගෙන් ලබාගත හැකි බව දැන්විය යුතුවේ. මහා බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉතාලිය, පකිස්තානය, ජපානය, ප්‍රංශය, බටහිර ජර්මනිය, චීන මහජන සමූහ ආණ්ඩුව, සෝවියට් රුසියාව, කැනඩාව, නෙදර්ලන්තය, බැල්ජියම, හන්ගේරියාව, බල්ගේරියාව, නැගෙනහිර ජර්මනිය, එක්සත් අරාබි සමූහ ආණ්ඩුව, බුරුමය, අයර්ලන්තය, අයිරානය, ඉරාකය, මාලදිවයින, උතුරු කොරියාව, ස්පාඤ්ඤය සහ ඉන්දියාව, බොම්බායේ සහ ඕස්ට්‍රේලියාවේ සිඩ්නි හි සිටින ලංකා වෙළඳ කොමසාරිස් සහ ලංකාවේ සිටින විදේශීය ආණ්ඩුවල නියෝජිතවරු සහ ඉන්දියාවේ දිල්ලියේ සිටින ලංකාවේ විදේශීය නියෝජිතයින් ගෙන්.

10. මෙහි 1 වැනි ඡෙදයේ සඳහන් ස්ථානයේදී ටෙන්ඩර් පත් විවෘත කරණු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ සෑම ටෙන්ඩර්කරුවෙකුටම එම ස්ථානයේ සිටීමට අවසර තිබේ. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිල ගණන් එහි පැමිණි සිටි ටෙන්ඩර්කරුවන්ට කියවනු ලැබේ. ලැබී තිබුන ටෙන්ඩරයක් පරීක්ෂාකර බැලීමට යම්කිසි ටෙන්ඩර් කරුවෙකුට අවශ්‍යනම්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග කටයුතු පිළියෙළ කර ගැනීමෙන් පසු එසේ පරීක්ෂා කර බැලීමට ඉඩදෙනු ලැබේ.

ඇස්. ඥානසේගරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
කොළඹ.
1964–5–11.

### අදාල උපලේඛනය

| විෂය අංක | වර්ගය | ඇස්තමේන්තුව කරන ලද අවශ්‍ය ප්‍රමාණය | අවශ්‍ය ඇහිරීම |
|---|---|---|---|
| 1 ... | නයිට්‍රස් ඔක්සයිඩ්, ඔක්සිජන්, කාබන්ඩයොක්සයිඩ් සහ සයික්ලොප්‍රොපෑන් බෙදහරින නොකඩවා ඇදහැලෙන රොටාමීටර් වර්ගයේ, තවද ඇතුලත වෙනස් නොවන නියම ශක්තිමත් පූට්ටු ඇති අඩ කුහරයේ ඇති වාෂ්ප බවට හැරුණු හැලෝතීන් වේපරයිස් පිල උෂ්ණත්වය ගැනීමට හැකි, තවද රවුමින් පිටත උරාගැනීමේ ක්‍රමය ඇති වෙනත් වේපරයිසර් නැති විනිවිද පෙනෙන සිරස් අතර කැනිස්ටරය ඇති, කාබන් ඩයොක්සයිඩ් උරාගන්නා ක්‍රමයක වට රවුම ඇති ප්ලග් එකක් සවි කිරීම ඉඩකඩ ඇති වියයුතු අතර කාබන් ඩයොක්සයිඩ් ඉබේ උරාගන්නා ක්‍රමයද මෙම භාණ්ඩයේ තිබිය යුතුවේ. මෙම උපකරණය ඕනෑම තැනක ගෙනයාහැකි එකක් වියයුතු අතර එහි ඇති අම්ලකර වාතය අවසාන වූ විට ඒ බව පෙන්නුම් කරන ක්‍රමයක්ද එහි තිබිය යුතුවේ. | 12 ක් පමණයි ... | සුදුසු ඕනෑම ඇහිරීම් ක්‍රමයක |
| 2 ... | පින්ඉන්ඩෙක්ස් වැල්, සහ ගණ අඩි 24, ඔක්සිජන් සිලින්ඩර්ස් ... ... | 288 ක් පමණයි ... | එම |
| 3 ... | නයිට්‍රස් ඔක්සයිඩ් සිලින්ඩර්ස්, පින් ඉන්ඩෙක්ස් වැල් සහිත ගැලො. 400 කට ඉඩකඩ ඇති | 288 පමණයි ... | එම |
| 4 ... | කාබන් ඩියොක්සයිඩ් සිලින්ඩර්ස් පින්ඉන්ඩෙක්ස් වැල් සහිත රා. 2 ක ඉඩකඩ ඇති ... | 48 පමණයි ... | එම |
| 5 ... | සයික්ලොපොපෙන් සිලින්ඩර්ස් පින්ඉන්ඩෙක්ස් වැල් එක සමග ගැලොම් 40 ක ඉඩකඩ ඇති. | 48 ක් පමණයි ... | එම |
| 6 ... | එකට බැඳි සිලින්ඩර් කී ස්පැනර් සහ වැල් කප්ලර් කැට් ඇම්. ඇස්. 60 ... | 12 ක් පමණයි ... | එම |
| 7 ... | උෂ්ණත්වයෙන් වාෂ්ප වතුර බවට හරවන සහ පදම 4% ක් දක්වා වැඩිය ලබාදෙන හැලෝතීන් වේපරයිසර් | 12 ක් පමණයි ... | එම |

**බාරදීමේ ක්‍රමය.** විෂය අංක 1–7 දක්වා ඇති භාණ්ඩ, ඇනයුම් කළ දින සිට මාස 3 ක් ඇතුලතදී කොළඹ රජයේ බෙහෙත් ගබඩාවට එක තොගයෙන්ම ගෙනැවිත් බාරදිය යුතුවේ. ටෙන්ඩර්කරු ණයවර ලිපියක් විවෘත කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ නම් මෙම භාණ්ඩවල ඇහිරීම් සහ අනිකුත් සියලුම ගාස්තු සහිතව මිල සහ කොළඹට ගෙනඊමේ ගාස්තු ඇතුලුව මිළ භාණ්ඩ නිෂ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින්ද සඳහන් කළ යුතුවේ.

නාවික මාරු කිරීම් වලට ඉඩදෙනු නොලැබේ.

මෙම සැපයීමේ සියලුම භාණ්ඩ හා බහා එවන සියලුම භාජනවල ''ඔටුන්න ලකුණ'' තිබිය යුතු අතර ''ඩී/සී. ඇම්. ඇස්. 2037/63–64'' යනුවෙන් සඳහන් කර තිබිය යුතුයි.

යොමු අංකය : ඇ/ප්.ටී.බී. 39/64

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### උරාගන්නා පුළුන්—ආරෝග්‍යශාලා වර්ගය සැපයීම

මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි සඳහන් පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකතැනට, උරාගන්නා පුලුන්—ආරෝග්‍යශාලා වර්ගය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත් සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1964 ජූනි 16 වෙනි අඟහරුවාද උදේ 10 දක්වා බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ ගාලු මුවදොර පිහිටි මහ ලේකම් ගොඩනැගිල්ලේ '' බී '' අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගේ කාර්‍යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශයෙන්) ලබාගත හැක. මෙම දැන්වීමේ 5 වැනි සහ 6 වැනි ඡෙදයන්හි සඳහන් කරුණු අනුව 1964 ජූනි 15 වෙනි සඳුද උදේ 10 දක්වා ඉල්ලුම්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් සීල් තබන ලද කවරයක බහා, '' සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශය, තැ.පෙ. 500, පළමුවෙනි මහළ, මහා ලේකම් ගොඩනැගිල්ල, ගාලුමුවදොර, කොළඹ '' යන ලිපිනයට එවිය යුතු වේ. සීල් තබන ලද ටෙන්ඩර්පත් බහාලන කවරයේ වම් කෙළවරේ උඩ '' උරාගන්නා පුලුන්—ආරෝග්‍යශාලා වර්ගය සැපයීම සඳහා ටෙන්ඩර්, 1964 ජූනි 16 දින උදේ 10 ට '' යනුවෙන් සඳහන් කළ යුතු වේ.

4. ටෙන්ඩර් පත් ගාලු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ, කාමර අංක 155හේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ එවීම කළ හැක. එහෙත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින්, තමන්ට අවශ්‍ය යයි හැඟේ නම් සීල් තබන ලද ටෙන්ඩර් පත් සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ උප ලේකම් තැන වෙත පුද්ගලිකව ගෙනැවිත් බාරදීමද කළ හැක. එසේ බාරදෙන සීල් තබන ලද කවරයේ එය කිනම් සැපයීමක් සඳහාද යන වග හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතු වේ. එම ටෙන්ඩර් පත්. බාර ගැනීම සඳහා ඉහතකී නිලධාරි තැනට බලය ඇත. සීල් තබනලද ටෙන්ඩර් පත් බාරගත් බවට කුවිතාන්සියක් එවිට ටෙන්ඩර්කරු වෙත ඔහු විසින් නිකුත් කරනු ලැබේ.

5. සුප්‍රසිද්ධ නිෂ්පාදන සමාගමක ඒජන්තවරයෙකුට හෝ වෙළඳ නියෝජිතයෙකුට වුවද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් අයදුම්කරු නම් කරන ලද නිෂ්පාදන සමාගමේ නියෝජිත ඒජන්තවරයෙකු බව සහතික කළ යුතු වේ. (මේ සඳහා නියෝජිත්වය ඔප්පු කිරීමක් ඉදිරිපත් කළ යුතු වේ).

6. 1955 ඔක්තෝබර් 28 වෙනි දින අංක 10,854 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් අයුරු, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 1949 සහ අංක 25 දරණ ආහාර සහ ඖෂධ පනත යටතේ පනවන ලද රෙගුලාසි අනුව, ඖෂධ විකිණීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගෙන් ලබාගත් වලංගු බලපත්‍රයක් ඇති, බලයලත් වෙළඳුන්ගෙන් පමණක් මෙම සැපයීම සඳහා ටෙන්ඩර් පත් බාරගනු ලැබේ. ලාංකික සම්බන්ධතා ඇති රටවල් වූ ඇල්බේනියාව, ඕස්ට්‍රියාව, බල්ගේරියාව, චීන මහජන සමූහ ආණ්ඩුව, චෙකොස්ලොවැකියාව, ටායිවාන්, ජර්මන් ෆෙඩරල් සමූහ ආණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, හංගේරියාව, ජපානය, කොරියාව, පෝලන්තය, රුමේනියා මහජන සමූහ ආණ්ඩුව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව, යුගෝස්ලේවියාව, වියට්නාම් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, ආදී රටවල් වලින් මෙම සැපයීම ආනයනය කර සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් වෙතොත්, ඔවුන් ලියාපදිංචි කරන ලද වෙළෙන්දන් විය යුතු අතර ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද සාමාන්‍ය බඩු ගෙන්වීමේ වලංගු බලපත්‍රයක් ලත් ඇත්තන් විය යුතුයි. ටෙන්ඩර් ආකෘතිපත්‍ර ඉල්ලීමේදී ඉහත සඳහන් බලපත්‍රයක් හිමි බව ඔප්පු කළ යුතු වේ.

7. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර මෙම දැන්වීමේ 2 වැනි ඡෙදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගේ කාර්‍යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශය) ලබාගත හැක. මෙම කාර්‍යාලයෙන් ලබාගත් ආකෘති පත්‍ර, කොන්දේසි පත්‍ර ආදිය භාවිතාකළ හැක්කේ ස්වදේශීය ටෙන්ඩර් කරුවන්ට පමණි.

8. මෙහි පළමුවැනි ඡෙදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර්කරු විසින් ස්වකීය ගණන් යෝජනාව ටෙන්ඩර් බාරගැනීමේ අවසාන දින සිට යටත් පිරිසෙයින් මාස 2ක් වත් විවෘතව තැබිය යුතුයි.

9. ටෙන්ඩර් කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර සමග නිකුත් කරන ටෙන්ඩර් කොන්දේසිවල II වැනි ඡෙදය කෙරෙහි ටෙන්ඩර් කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. කොළඹ රජයේ බෙහෙත් ගබඩා අධිකාරීන්ට යැවිය යුතු මෙම බඩුවල ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) සම්බන්ධව විස්තර එම ඡෙදයෙහි සඳහන් කර ඇත. ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුත්තේ ටෙන්ඩර් පත් පමණි. ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) එහි තැන්පත් නොකළ යුතුයි.

ටෙන්ඩර් පත් සමාප්ත කරන දිනයේ නියම වේලාවට ප්‍රමාදව ලැබුණු සැම්පල්ස් සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

10. මෙහි 1 වැනි ඡෙදයේ සඳහන් ස්ථානයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ සෑම ටෙන්ඩර් කරුවෙකුටම එම ස්ථානයේ සිටීමට අවසර තිබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිළ ගණන් එහි පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ට කියවනු ලැබේ. ලැබී තිබුණ ටෙන්ඩරයක් පරීක්ෂාකර බැලීමට යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට අවශ්‍යනම්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් පසු එසේ පරීක්ෂා කර බැලීමට ඉඩදෙනු ලැබේ.

ඈස්. ඥානසේගරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
කොළඹ.
1964.5.11.

### අදාල උපලේඛනය

| විෂය අංක | වර්ගය | ඇස්තමේන්තු කරනලද අවශ්‍ය ප්‍රමාණය | අවශ්‍ය ඇහිරීම |
|---|---|---|---|
| 1. | උරා ගන්නා සුලු පුලුන්—ආරෝග්‍යශාලා වර්ගය | රාත්තල් 50,000 | රාත්තල් 1කේ රෝල් වලින් බේලකට රාත්තල් 100ක් වියයුතුයි |

**කෙන්දක දිග ප්‍රමාණය**
සාමාන්‍යයෙන් අඟල් 3/8කට නොවැඩි විය යුතුයි

**උරා ගැනීම**
මෙම පුලුන් ග්‍රෑම් එකක් මිලිලීටර්ස් 20 දක්වා කුඩා කර, ප්‍රොසැජ් එකක මාර්ගයෙන් සැන්ටිග්‍රේඩ් 20 ක උෂ්ණත්වය ඇති වතුරෙහි මතුපිටට දැමූ කල තත්පර 10 ක් තුලදී එය සම්පූර්ණයෙන් පෙඟී යන්නේය

**උෂ්ණත්වයේ බලපෑම්**
මෙම පුලුන් විනාඩි 20 කදී සෙන්ටිග්‍රේඩ් 110ක් දක්වා උෂ්ණ කළහොත්, එය දුඹුරු පැහැය ගැනීමක් හෝ කුඩා කොටස්වලට කැඩිබිඳී යෑමේ සලකුණු හෝ නොපනේවයි.

**වතුරේ දියැවෙන ප්‍රමාණය**
1.0% කට නොවැඩි විය යුතුයි

**අළු**
0.5% කට නොවැඩි විය යුතුයි

**ඇසිඩගතිය**
මෙම පුලුන් මතුපිට බ්‍රොමො ක්‍රිසොල් නිල්පාට ද්‍රව්‍ය ඉසිනු ලැබුවහොත්, එය බොමොක්‍රිසෝල් ද්‍රව්‍යය පැහැදිලි කහ වර්ණයට නොපැමිණේ

**බාරදීමේ ක්‍රමය**

මෙම සැපයීමේ සම්පූර්ණ තොගය, ඇනයුම් කළ දින සිට මාස 2ක් තුල දී එක් තොගයෙන්ම, කොළඹ රජයේ බෙහෙත් ගබඩාවට ගෙනැවිත් බාරදිය යුතු වේ.

ටෙන්ඩර්කරු ණයවර ලිපියක් විවෘත කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ නම්, මෙම භාණ්ඩයන්ගේ මිළ හා කොළඹට ගෙනඊම් ගාස්තුව සහිතව, ඇහිරීමේ ගාස්තු සියල්ල ඇතුලුව, මිල, භාණ්ඩ නිෂ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින්ද සඳහන් කළයුතු වේ.

මෙම සැපයීමේ සියලුම විෂයයන් හා ඒවා අඩංගු සියලුම භාජනවල '' ඔටුන්න ලකුණ '' සහ සී/සීඇම්ඇස් 2195/63–64 යනුවෙන් සඳහන් කර තිබිය යුතු වේ.

5–447—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1964 ක්වූ ජූනි මස 5 වැනි සිකුරාද පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර නුවරඑළිය, අධ්‍යාපන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් භාරගනු ලැබේ.

| පාසැලේ නම | | කළයුතු වැඩ |
|---|---|---|
| 1. නු/හෝල්බෲක් විද්‍යාලය | ... ... | ගොඩනැගිල්ල |
| 2. නු/ඉඩමලන්ද විද්‍යාලය | ... ... | ගොඩනැගිල්ල |

සංලක්ෂ්‍යය : අංක 1.—නු=නුවරඑළිය
අංක 2.—අවශ්‍ය ලියාපදිංචි කිරීම

| | | අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව රු. | | අනුමතකළ සමිති සමාගම් රු. |
|---|---|---|---|---|
| අංක 1 සිට 2 | ... | 15,000 | ... | 15,000 |

2. ඉහත දක්වෙන දෙවෙනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට සහ එහි සඳහන් මුදලකට නො අඩු ගණනකට ගොඩනැගිලි වැඩ සඳහා අධ්‍යාපන සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි වූ විවිධ සේවා සමුපකාර සමිතිවලට, ග්‍රාම සංවර්ධන සමිතිවලට හා කම්කරු සමිතිවලට ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 ජූනි මස 4 දින දවල් 12.00 වන තෙක් නිකුත් කරනු ලැබේ.

3. ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ කාර්‍යාලයේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම දිසාපති කාර්‍යාලයක හෝ එක් එක් වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක්ද තැන්පත්කොට ලබාගත් කුවිතාන්සි, නුවරඑළියේ අධ්‍යාපන නිලධාරි තැනට ඉදිරිපත් කිරීමෙන් පසුව ය. චෙක් පත්, මුදල් ඕඩර, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් (ගොඩනැගිලි ශාඛාවෙන්) හෝ නුවරඑළිය අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත යුතුයි. මුදල් තැන්පත් කිරීමේ චච්චර් නිකුත් කරනු ලබන්නේ 2 වෙනි ඡෙදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුවෙකු වශයෙන් ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

5. ඉහත සඳහන් 2 වෙනි ඡෙදයන්හි දක්වෙන පරිදි නුවරඑළිය අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ දෙවෙනි පිට පතකුත් සමගය. සියලුම විස්තර හා තොරතුරු නුවරඑළියේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් දනගත හැකිය. සැලැස්මද එහිදී බලාගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර නුවරඑළිය, අධ්‍යාපන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත රෙජිස්ට්‍රර් තැපැලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත්‍ර රෙජිස්ට්‍රර් තැපැලෙන් නො එවන්නේ නම්,ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් නුවරඑළියේ, අධ්‍යාපන කාර්‍යාලයේ කාර්‍යාල සහකාර නිලධාරිතැන භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුයි. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද, තමන් ඉල්ලා ඇති වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

6. වර්ෂ 1964 ජූනි මස 5 වැනි සිකුරාද පස්වරු 2.30 ට නුවරඑළියේ අධ්‍යාපන කාර්‍යාලයේ ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට විවෘත කරන ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද ටෙන්ඩර්කරුගේ නමද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

7. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති 6 කට නො අඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

8. වෙනත් අවශ්‍ය විස්තර නුවරඑළිය අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත හැකි අතර ටෙන්ඩර් සම්බන්ධ ලියකියවිලිද මෙහිදී පරීක්ෂා කර බැලිය හැක.

9. වැඩය භාරගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම සේවකයින් ලාංකිකයින් වියයුතු වා පමණක් නොව, වැඩය කෙරෙන ප්‍රදේශයෙහි වූ සේවකයින් පමණක් වැඩෙහි යෙදවීමට කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දෙනු ලබන විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසිය නො පිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සලකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. එවැනි අනුමතියක් හෙදු අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කෙරෙන ප්‍රදේශයෙහි නොවූ හෝ සේවකයින් වැඩෙහි යෙදවීම තහනම්ය.

10. කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ඉහත සඳහන් ගණන් අනුව ඉහත සඳහන් දෙපාර්තමේන්තුවල ලියාපදිංචි වී ඇති අනුමත සමිති වලටද ටැන්ඩර් ඉදිරිපත් කළ හැක. එම සමිති තැන්පත් මුදලින් නිදහස් කරනු ලැබේ.

ඩබ්ලිව්. ජේ. ඩබ්ලිව්. ජයතිලක.
අධ්‍යාපන නිලධාරි, නුවරඑළිය.

වර්ෂ 1964 ක්වූ මැයි මස 4 දින,
නුවරඑළිය, අධ්‍යාපන කාර්‍යාලයේදී ය.

5–224—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1964ක්වූ ජූනි මස 5 වැනි සිකුරාදා පෙරවරු 10.30 වනතෙක් කොළඹ 3, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ, සභාපති තැන විසින් පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

| පාසලේ නම | | කළයුතු වැඩය |
|---|---|---|
| කෑ/කෑගලු මහා විද්‍යාලය | ... | පන්ති කාමර සහ විද්‍යාගාර ගොඩනැගිල්ල තැනීම. |

සංලක්ෂය : කෑ/=කෑගල්ල දිස්ත්‍රික්කය.

2. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුවකු වශයෙන් රු. 2,00,000 ට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වී සිටින අයට 1964 ජූනි මස 2 අඟහරුවාදා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර කෑගල්ලේ අධ්‍යාපන කාර්යාලයේදී නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර අපේක්ෂකයින් විසින් කොළඹ 2, මලයි වීදියේ පිහිටි අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ (ඒ. සී.) ශාඛාවේදී හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක මේ වැඩය වෙනුවෙන් රු. 100ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි කෑගල්ලේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ තැන වෙත ඉදිරිපත් කළ යුතුය. චැක් පත්, මනිඕඩර, පෝස්ටල් ඕඩර යනාදිය භාරගනු නො ලැබේ.

4. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ වව්චර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපනාධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ පාසල් ගොඩනැගිලි පිළිබඳ ශාඛාවෙන් හෝ කෑගල්ලේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂක තැනගේ කාර්යාලයෙන් හෝ ලබා ගත හැකිය. මුදල් තැන්පත් කිරීමේ වව්චර නිකුත් කරනු ලබන්නේ ඉහත පෙනෙන දෙවන ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියාපදිංචි වී ඇති බව ඔප්පු කරන කොන්ත්‍රාත්කරුවන්ට පමණි.

5. ඉහත සඳහන් දෙවන ඡේදයේ දක්වන පරිදි කෑගල්ලේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂතැනගෙන් ලබා ගත් ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ දෙවන පිටපතකුත් සමගය. සැලැස්මවල් සහ සියලුම විස්තර හා තොරතුරු එම කාර්යාලයේ දී දැන ගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි තැපැලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ 3, අධ්‍යාපන හා සංස්කෘත අමාත්‍යාංශයේ කාර්යාල සහායක තැනට භාරදී එසේ භාර ගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා ගත යුතුය. ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද, වැඩයේ නමද, සඳහන් කර තිබිය යුතුය.

6. වර්ෂ 1964 ජූනි මස 5 වැනි සිකුරාදා පෙරවරු 10.30ට කොළඹ 3, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන නිලධාරි තැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද, ටෙන්ඩර්කරුගේ නමද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

4. පූර්වෝක්ත දෙවැනි ඡෙදයේ සඳහන් වන පරිදි අධ්‍යාපන නිළධාරි තුමාගෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම එවිය යුත්තේ දෙවැනි පිටපතකුත් සමහය. සියළු විස්තර සහ තොරතුරු තංගල්ලේ අධ්‍යාපන නිළධාරි තුමාගෙන් දැන ගත හැකිය. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර, '' ටෙන්ඩර් සභාවේ සභාපති, අධ්‍යාපන කාර්යාලය, තංගල්ල, '' යන ලිපිනයට රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. ප්‍රාදේශිය ටෙන්ඩර්කරුවන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කරන ලද තැපැලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර තංගල්ලේ අධ්‍යාපන කාර්යාලයේ ප්‍රධාන ලිපිකාර කාර්යාල සහකාර නිළධාරි තැනට බාර දී එසේ බාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා ගත යුතුය. එසේ බාරදෙන ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද, ලියා තිබිය යුතුයි.

5. 1964 ජූනි මස 5 වැනි සිකුරාද පස්වරු 2.30ට තංගල්ලේ අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරනු ලබන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරනු ලබන නිළධාරි තැන විසින් ගාස්තු ප්‍රමාණය ද, (රේට් ගණන් ද) ටෙන්ඩර්කරුවන්ගේ නම් ද, පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

6. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර බාර ගැනීම අවසන් කර සති හයකට නොඅඩු කාළයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්තර තංගල්ලේ අධ්‍යාපන නිළධාරි තැනගෙන් ලබා ගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිළි ද මෙහි දී පරීක්ෂා කර බැලිය හැක.

8. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන් ය, ටෙන්ඩරය. අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන් ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන් පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂ වරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හි දී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළාසේ සලකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමට ද යටත්වෙයි. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමැතිය හෝ සම්මමුතිය හෝ ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

සී. ඒ. පී. ප්‍රනාන්දු,
තංගල්ලේ අධ්‍යාපන නිළධාරි.

1964 මැයි මස 8 වැනි දින,
තංගල්ලේ අධ්‍යාපන කාර්යාලයේ දී ය.

5–371—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1964 වූ ජූනි මස 5 වැනි සිකුරාදා පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර බණ්ඩාරවෙල, ඌව ප්‍රදේශයේ අධ්‍යාපන කායභාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ:—

| | පාසැලේ නම | කළ යුතු වැඩ |
|---|---|---|
| 1. | බ/වංගියකුඹුර මහා විද්‍යාලය ... ... | ගැන්ට්‍රි |
| 2. | බ/කදුරුගමුව මිහිඳු සි. මි. පාසැල ... ... | මුල් ගුරු නිවාසයක් |
| 3. | බ/ලේමස්තොට සි. මි. පාසැල ... ... | එම |
| 4. | බ/වංගියකුඹුර මහා විද්‍යාලය ... ... | පාසැල් ගොඩනැගිලිවලට ජනෙල් දොරවල් සවිකිරීම |
| 5. | බ/කඳන සි. සි. පාසැල ... ... ... | පාසැල් ගොඩනැගිල්ලක් |
| 6. | බ/ඇල්ල සි. මි. පාසැල ... ... ... | එම |
| 7. | බ/නාඋල්ල මහා විද්‍යාලය ... ... ... | එම |
| 8. | බ/ගැරඩිඇල්ල සි. මි. පාසැල ... ... | එම |
| 9. | බ/නාගොල්ල සි. මි. පාසැල ... ... | එම |
| 10. | බ/කළුගහකඳුර සි. මි. පාසැල ... ... | එම |
| 11. | බ/වත්තේකැලේ සි. මි. පාසැල ... ... | එම |
| 12. | බ/ඉට්තැම්පොල සි. මි. පාසැල ... ... | එම |
| 13. | බ/පන්වැව සි. මි. පාසැල ... ... ... | එම |
| 14. | බ/ඌව පරණගම සි. මි. පාසැල ... ... | පාසැල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ |
| 15. | බ/පස්සර මධ්‍ය මහා විද්‍යාලය ... ... | විද්‍යා රසායනාගාරයේ ඉතිරි වැඩ |
| 16. | බ/ඇටම්පිටිය මහා විද්‍යාලය ... ... | එම |
| 17. | බ/විහාරගොඩ සි. මි. පාසැල ... ... | පාසැල් ගොඩනැගිල්ලක් |
| 18. | බ/නැදුන්ගමුව සි. මි. පාසැල ... ... | එම |

සංලක්ෂාය .—අංක 1. බ=බදුල්ල

අංක 2. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ අවශ්‍ය ලියාපදිංචිකිරීම

| | රුපියල් |
|---|---|
| අංක 1 ... ... | 1,000 |
| අංක 2 ... ... | 9,000 |
| අංක 3 සහ 4 ... ... | 10,000 |
| අංක 5 ... ... | 11,000 |
| අංක 6 සිට 12 දක්වා ... | 12,000 |
| අංක 13 ... ... | 13,000 |
| අංක 14 ... ... | 14,000 |
| අංක 15 සිට 18 දක්වා ... | 15,000 |

2. ඉහත දැක්වෙන දෙවැනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචිවූ අයට සහ එහි සඳහන් මුදලකට නොඅඩු ගණනකට ගොඩනැගිලි වැඩ සඳහා අධ්‍යාපන හා රජයේ වැඩ දෙපාර්තමේන්තුවල ලියාපදිංචිවූ විවිධ සේවා සමුපකාර සමිතිවලට, ග්‍රාම සංවර්ධන සමිතිවලට හා කම්කරු සමිතිවලට ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 ජූනි මස 4 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 3.30 තෙක් නිකුත් කරණු ලැබේ.

3. ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලබන්නේ කොළඹ අධ්‍යාපනාධ්‍යක්ෂතුමාගේ කායභාලයේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ එක් එක් වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි, බණ්ඩාරවෙල ඌව ප්‍රදේශයේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂට ඉදිරිපත් කිරීමෙන් පසුවය. චෙක්පත්, මුදල් ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර, කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් (ගොඩනැගිලි ශාඛාවෙන්) හෝ බණ්ඩාරවෙල, ඌව ප්‍රදේශයේ, සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ ගෙන් ලබා ගත යුතුයි. මුදල් තැන්පත් කිරීමේ ගෙවීමේ පත්‍ර නිකුත් කරණු ලබන්නේ 2 වැනි ඡේදයේ සඳහන්වන මුදල් ප්‍රමාණයට ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

5. ඉහත සඳහන් 2 වැනි ඡේදයෙහි දැක්වෙන පරිදි බණ්ඩාරවෙල, ඌව ප්‍රදේශයේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂගෙන් ලබා ගත් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ දෙවෙනි පිටපතකුත් සමහය. සියළුම විස්තර හා තොරතුරු බණ්ඩාරවෙල, සහකාර අධ්‍යපනාධ්‍යක්ෂ ගෙන් දැනගත හැකියි. සැලැස්මයන් ද එහිදී බලාගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර බණ්ඩාරවෙල, ඌව ප්‍රදේශයේ, අධ්‍යාපන කායභාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි. ප්‍රාදේශිය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි තැපැලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබනලද ටෙන්ඩර් බණ්ඩාරවෙල, අධ්‍යාපන කායභාලයේ කායභාල සහකාරට භාරදී එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා ගත යුතුයි. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද, තමන් ඉල්ලා ඇති වැඩයේ නම ද ලියා තිබිය යුතුයි.

6. වර්ෂ 1964 වූ ජූනි මස 5 වැනි සිකුරාදා පස්වරු 2.30 ට බණ්ඩාරවෙල, ඌව ප්‍රදේශයේ, අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරණු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනවිට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තව ද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද ටෙන්ඩර්කරුගේ නම ද පැමිණ සිටින අයට ඇසෙනසේ කියවනවා ඇත.

7. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති හයකට නො අඩු කාලයක් තුළ සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

8. වෙනත් අවශ්‍ය විස්තර බණ්ඩාරවෙල, ඌව කොට්ඨාශයේ, සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ ගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් සම්බන්ධ ලියකියවිලිද මෙහිදී පරීක්ෂාකර බැලිය හැකිය.

9. වැඩය භාරගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම සේවකයින් ලාංකිකයින් විය යුතුවා පමණක් නොව, වැඩය කෙරෙන ප්‍රදේශයෙහි වූ සේවකයින් පමණක් වැඩෙහි යෙදවීමට කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්තුමාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්ෂ විසින් අවසර දෙනු ලබන විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසිය නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සළකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත්වේ. එවැනි අනුමැතියක් අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කෙරෙන ප්‍රදේශයෙහි නොවූ හෝ සේවකයින් වැඩෙහි යෙදවීම තහනම්ය.

බී. පී. ඇම්. සේනානායක,
ඌව ප්‍රදේශයේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ.

වර්ෂ 1964 වූ මැයි මස 7 වැනි දින,
බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ දී ය.

5-341/2—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1964වූ ජූනි මස 5 වැනි සිකුරාදා පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ :—

| | පාසැලේ නම | කළයුතු වැඩ |
|---|---|---|
| 1. | බ/තොලබෝවත්ත-ඉහලගම සි. මි. පාසැල | පාසැල් ගොඩනැගිල්ලක් |
| 2. | බ/ඇත්තලගෙදර තක්ෂිලා සි. මි. පාසැල | එම |
| 3. | බ/උඩුබාදන සි. මි. පාසැල | එම |
| 4. | බ/හත්කිඳ සි. මි. පාසැල | එම |
| 5. | බ/ගලහගම සි. මි. පාසැල | එම |
| 6. | බ/මැදවෙල මහා විද්‍යාලය | එම |
| 7. | බ/කොස්ගොල්ල සි. මි. පාසැල | එම |
| 8. | බ/නමුණුකුල සි. මි. පාසැල | එම |
| 9. | බ/කරගහඇල්පොත සි. මි. පාසැල | එම |
| 10. | බ/බැද්දේගම මහා විද්‍යාලය | විද්‍යා රසායනාගාරයක් |
| 11. | බ/වංගියකුඹුර මහා විද්‍යාලය | ගුරු නිවාසයේ ඉතිරි වැඩ |
| 12. | බ/සිවලී විද්‍යාලය (බණ්ඩාරවෙල) | පාසැල් ගොඩනැගිල්ලක් |
| 13. | බ/කදුරුගමුව මහා විද්‍යාලය | එම |
| 14. | බ/කරගහවෙල සි. මි. පාසැල | එම |
| 15. | බ/ලියන්ගහවෙල මහා විද්‍යාලය | එම |

සංක්ෂෙපය.—අංක 1. බ = බදුල්ල
අංක 2. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ අවශ්‍ය ලියාපදිංචිකිරීම

| | රුපියල් |
|---|---|
| අංක 1-5 දක්වා | 16,000 |
| අංක 6 සහ 7 | 17,000 |
| අංක 8 සහ 9 | 18,000 |
| අංක 10 | 20,000 |
| අංක 11 | 21,000 |
| අංක 12 සහ 13 | 22,000 |
| අංක 14 සහ 15 | 23,000 |

2. ඉහත දැක්වෙන දෙවැනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට සහ එහි සඳහන් මුදලකට නොඅඩු ගණනකට ගොඩනැගිලි වැඩ සඳහා අධ්‍යාපන හා රජයේ වැඩ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි වූ විවිධ සේවා සමුපකාර සමිතිවලට, ග්‍රාමසංවර්ධන සමිතිවලට හා කම්කරු සමිතිවලට ඉහත් සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 ජූනි මස 4 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 3.30 තෙක් නිකුත් කරනු ලැබේ.

3. ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත්කරණු ලබන්නේ කොළඹ අධ්‍යාපනාධ්‍යක්ෂතුමාගේ කාර්යාලයේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ එක් එක් වැඩය වෙනුවෙන් රු. 100ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි, බණ්ඩාරවෙල, ඌව ප්‍රදේශයේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂට ඉදිරිපත් කිරීමෙන් පසුවය. චෙක්පත්, මුදල් ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර, කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් (ගොඩනැගිලි ශාඛාවෙන්) හෝ බණ්ඩාරවෙල, ඌව ප්‍රදේශයේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂගෙන් ලබා ගත යුතුයි. මුදල් තැන්පත් කිරීමේ ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ 2 වැනි ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

5. ඉහත සඳහන් 2 වැනි ඡේදයෙහි දැක්වෙන පරිදි බණ්ඩාරවෙල, ඌව ප්‍රදේශයේ, සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂගෙන් ලබා ගත් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ දෙවෙනි පිටපතකුත් සමගය. සියළුම විස්තර හා තොරතුරු බණ්ඩාරවෙල සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ ගෙන් දැනගත හැකියි. සැලැස්මයන් ද එහි දී බලාගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබනලද ටෙන්ඩර් කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාරට භාර දී එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා ගත යුතුයි. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ද, තමන් ඉල්ලා ඇති වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

6. වර්ෂ 1964 වූ ජූනි මස 5 වැනි සිකුරාදා පස්වරු 2.30ට කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද ටෙන්ඩර්කරුගේ නමද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

7. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති හයකට නො අඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

8. වෙනත් අවශ්‍ය විස්තර බණ්ඩාරවෙල, ඌව කොට්ඨාශයේ, සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ ගෙන ලබාගත හැකි අතර ටෙන්ඩර් සම්බන්ධ ලිය කියවිලිද මෙහිදී පරීක්ෂාකර බැලිය හැකිය.

9. වැඩය භාර ගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම සේවකයින් ලාංකිකයින් විය යුතුවා පමණක් නොව, වැඩය කෙරෙන ප්‍රදේශයෙහි වූ සේවකයින් පමණක් වැඩෙහි යෙදවීමට කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තුමාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්ෂ විසින් අවසර දෙනු ලබන විශේෂ අවස්ථාවන්හි දී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසිය නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සළකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමට ද යටත් වේ. එවැනි අනුමැතියක් අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කෙරෙන ප්‍රදේශයෙහි නොවූ හෝ සේවකයින් වැඩෙහි යෙදවීම තහනම්ය.

බී. පී. ඇම්. සේනානායක,
ඌව ප්‍රදේශයේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ.

වර්ෂ 1964 මැයි මස 7 වැනි දින,
බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්‍යාලයේ දීය.

5–341/1—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 ජූනි මස 5 වැනි දින සිකුරාද පස්වරු 2 වන තෙක් මාතර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| | පාසැලේ නම | | කළ යුතු වැඩය |
|---|---|---|---|
| (1) | මාර/කන්දෙගොඩ ර. වි. | ... | අළුත්වැඩියාව |
| (2) | මාර/ගම්මැද්දෙගම ර.වි. | ... | එම |
| (3) | මාර/පල්ලිමුල්ල ර. වි. | ... | වැසිකිළි |
| (4) | මාර/අකුරුගොඩ ර. වි. | ... | ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම |
| (5) | මාර/පාලටුව මහා විද්‍යාලය | ... | එම |
| (6) | මාර/මැදළයන්ගොඩ ර. වි. | ... | ක්‍රීඩා පිටිය |
| (7) | මාර/කිරිවලගම ර. වි. | ... | අළුත්වැඩියාව |
| (8) | මාර/උල්ලල ර. වි. | ... | එම |
| (9) | මාර/ගල්බොඩ ර. වි. | ... | ගොඩනැගිලි |
| (10) | මාර/කහවින්න ර. වි. | ... | එම |
| (11) | මාර/පාලටුව මහා විද්‍යාලය | ... | එම |
| (12) | මාර/නාවිමන උතුර ර. වි. | ... | එම |
| (13) | මාර/පනන්වෙල ර. වි. | ... | එම |
| (14) | මාර/මාරමණ්ඩිය ර. වි. | ... | එම |
| (15) | මාර/පස්ගොඩ ර. වි. | ... | එම |
| (16) | මාර/බැරගම ර. වි. | ... | එම |
| (17) | මාර/කැටියපේ ර. වි. | ... | එම |
| (18) | මාර/කොරඹුරුවාන ර. වි. | ... | එම |
| (19) | මාර/යටියන ර. වි. | ... | එම |
| (20) | මාර/කෝන්ගල ප්‍රාතමික ර. වි. | | එම |
| (21) | මාර/මීගස්දෙනිය ර. වි. | ... | එම |
| (22) | මාර/දෙයියන්දර මහා විද්‍යාලය | ... | කෘෂිකම් විද්‍යාගාරය |
| (23) | මාර/කිරින්ද බාලිකා ර. වි. | ... | අළුත්වැඩියාව |
| (24) | මාර/අපරැක්ක මහා විද්‍යාලය | ... | කෘෂිකර්ම විද්‍යාගාරය |
| (25) | මාර/ගොඩපිටිය මහා විද්‍යාලය | ... | එම |

සංලක්ෂ්‍යය : මාර = මාතර දිස්ත්‍රික්කය.
ර. වි. = රජයේ විද්‍යාලයය.

2. ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන කොන්ත්‍රාත්කරුවන්, වැඩ අංක 1 සිට 6 දක්වා රු. 3,000ට නොඅඩු ගණනකට ද, වැඩ අංක 7 සහ 8 සඳහා රු. 5,000ට නො අඩු ගණනකට ද, වැඩ අංක 9 සිට 21 දක්වා රු. 9,500ට නොඅඩු ගණනකටද වැඩ අංක 21 සිට 25 දක්වා රු. 13,000ට නොඅඩු ගණනකටද, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී සිටිය යුතුයි.

3. අනුමත කරණ ලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමුපකාර සමිති, ගොඩනැගිලි වැඩ සඳහා 2 වැනි ඡේදයේ සඳහන් ගණන් වලට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී ඇත්නම් ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

4. වර්ෂ 1964 ජූනි මස 4 වෙනි බ්‍රහස්පතින්ද පස්වරු 3.30 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. ටෙන්ඩර් පත්‍ර අපේක්ෂකයින් විසින් අධ්‍යාපන අධ්‍යක්ෂතැනගේ කාර්‍යාලයේ (ඒ. සී. ශාඛාවේ) හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක එක් එක් වැඩය වෙනුවෙන් රු. 100ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ තුමාට ඉදිරිපත් කළ යුතුය. චෙක් පත්, මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය බාරගනු නොලැබේ.

5. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ වවුචර් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ තුමාගෙන් හෝ ලබාගත යුතුය. මුදල් තැන්පත් කිරීමේ වවුචර් නිකුත් කරනු ලබන්නේ ඉහත පෙනෙන දෙවන හා තුන්වන ඡේදයන්හි සඳහන් වන මුදල් ප්‍රමාණයන් අනුව ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට හා සමිතිවලට පමණකි.

6. ඉහත සඳහන් 2 වන හා 3 වන ඡේදයන්හි දක්වෙන පරිදි මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂතුමාගෙන් ලබා ගත් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ දෙවන පිටපතකුත් සමඟය. සියළුම විස්තර හා තොරතුරු මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂතුමාගෙන් දැනගත හැකිය. සැලැස්ම වල් ද එහිදී බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර මාතර අධ්‍යාපන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා වෙත ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවන්නේ නම් ඔහු හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් මාතර අධ්‍යාපන කාර්‍යාලයේ කාර්‍යාල සහකාර නිලධාරි තැනට භාරදී එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුය. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ද, වැඩයේ නම ද ලියා තිබිය යුතුය.

7. වර්ෂ 1964 ජූනි මස 5 වෙනි සිකුරාද පස්වරු 2.30ට මාතර අධ්‍යාපන කාර්‍යාලයේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිළධාරි තැන විසින් එක් එක් ටෙන්ඩර්යේ ගාස්තු ප්‍රමාණය ද ටෙන්ඩර්කරුගේ නම ද පැමිණ සිටින සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

8. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති 6කට නොඅඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

9. වෙනත් අවශ්‍ය විස්තර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂකගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් සම්බන්ධ ලිය කියවිලි ද මෙහි දී පරීක්ෂා කර බැලිය හැක.

10. වැඩය භාරගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම සේවකයින් ලාංකිකයින් වියයුතුවා පමණක් නොව, වැඩය කෙරෙන ප්‍රදේශයෙන් ම තෝරා ගැනීමට සෑම උත්සාහයක්ම දැරිය. ලාංකික වූ හා වැඩය කෙරෙන ප්‍රදේශයෙහි වූ සේවයකයින් පමණක් වැඩෙහි යෙදවීම කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දෙනු ලබන විශේෂ අවස්ථාවන්හි දී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසිය නො පිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සලකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමට ද යටත් වේ. එවැනි අනුමතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කෙරෙන ප්‍රදේශයෙහි නොවූ සේවකයින් වැඩෙහි යෙදවීය තහනම් ය.

පී. ඊ. ජී. මැන්ඩිස්,
මාතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ.

අධ්‍යාපන කාර්‍යාලය,
මාතර, 1964 මැයි මස 15 වෙනි දින.

5–374—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 ජූනි මස 5 වැනි දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර මඩකලපුවේ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ:—

| පාසැලේ නම | | කළ යුතු වැඩ |
|---|---|---|
| 1. මඩ/වාකරෙයි ර. දෙ. මි. පාසැල | ... | පාසැල් ගොඩනැගිල්ලක් |
| 2. මඩ/එරාවූර් ර. මු. ගැ. පාසැල | ... | පාසැල් ගොඩනැගිල්ලක් |
| 3. මඩ/තික්කිලි වඩෙයි ර. දෙ. මි. පාසැල | ... | පාසැල් ගොඩනැගිල්ලක් |

**සංලක්ෂ්‍යය.**—1. මඩ = මඩකලපු දිස්ත්‍රික්කය.
2. අවශ්‍ය ලියාපදිංචි කිරීම.

අධ්‍යාපන දෙපාතීමේන්තුවේ සහ ප්‍රසිද්ධ වැඩ දෙපාතීමේන්තුවේ—

අංක 1 සඳහා රු. 15,000.
අංක 2 සහ 3 සඳහා රු. 10,000.

2. ඉහත සඳහන් දෙවැනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති අයට, විවිධ සේවා සමූපකාර සමිතිවලට, කම්කරු සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 ජූනි මස 4 වැනි ද දවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ.

ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ට මෙම වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයේ එච්. ඒ. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම දිසාපති කාර්යාලයක එම වැඩය සඳහා රු. 100 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් නැගෙනහිර ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ අයට පමණි. චෙක් පත්, මුදල් ඇනවුම් හෝ පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර මඩකලපුව නැගෙනහිර ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත යුතුයි. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ 2 වැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණි.

4. ඉහත සඳහන් 2 වැනි ඡේදයේ සඳහන් වන පරිදි සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත් ටෙන්ඩර් ෆෝර්ම එවිය යුත්තේ දෙවැනි පිටපතකුත් සමගය. සියළුම විස්තර හා තොරතුරු නැගෙනහිර ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් දැන ගත හැකිය. සැලැස්ම එහිදී බලා ගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, අධ්‍යාපන කාර්යාලය, මඩකලපුව යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් මුද්‍රා තබන ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මඩකලපුවේ අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර නිලධාරි තැනට භාරදී එසේ භාර දුන් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා ගත යුතුය. එසේ භාර දෙන ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද සඳහන් කළ යුතුය.

5. 1964 ජූනි මස 5 වැනි දින පස්වරු 2.30ට මඩකලපුව අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට ඒවා විවෘත කරනු ලබන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරනු ලබන නිලධාරි තැන විසින් ගාස්තු (රේට් ගණන්) ප්‍රමාණයද ටෙන්ඩර් කරුවන්ගේ නම් ද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

6. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කර සති හයකට නොඅඩු කාලයක් තුළ සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

7. වෙනත් අවශ්‍ය විස්තර නැගෙනහිර ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද එහිදී පරීක්ෂා කර බැලිය හැකිය.

8. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරුවන් විසින් සේවයේ යෙදවිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන්ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදවිය යුත්තේ ලාංකික කම්කරුවන් සහ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන්ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදවීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මතය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළ සේ සළකනු ලැබීමටද කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමටද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහත කී අනුමතිය හෝ සම්මුතිය නොලබා ගෙන සේවයේ යෙදීම තහනම්ය.

වී. ජී. බී. මුණසිංහ,
නැගෙනහිර ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

1964 මැයි මස 8 වැනි දින,
මඩකලපුව අධ්‍යාපන කාර්යාලයේදීය.

5–397—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 ජූනි මස 5 වැනි දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ:—

| පාසලේ නම | | කළයුතු වැඩය |
|---|---|---|
| 1. ර/බඹරබොටුව මහා විද්‍යාලයය | ... | රසායනාගාරය තැනීම. |
| 2. ර/කලවාන මහා විද්‍යාලයය | ... | එම |
| 3. ර/උඩගම මහා විද්‍යාලයය | ... | කර්මාන්තශාලාව තැනීම. |
| 4. ර/ඇහැළියගොඩ මහා විද්‍යාලයය | ... | පාසල් ගොඩනැගිල්ල තැනීම. |

1 **සටහන :** ර=රත්නපුර දිස්ත්‍රික්කය.

2. **සටහන :** අවශ්‍ය ලියා පදිංචි කිරීමේ—

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ—

1 වැනි හා දෙවන වැඩ සඳහා රුපියල් 25,000.
3 වන වැඩය සඳහා රුපියල් 30,000.
4 වන වැඩය සඳහා රුපියල් 18,000.

2. ඉහත සඳහන් 2 වැනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි සඳහා ලියා පදිංචි වී ඇති අයට, විවිධ සේවා සමූපකාර සමිතිවලට, කම්කරු සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 ජූනි මස 4 වැනිදා දහවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ.

ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට මෙම වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ, කොළඹ, අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයේ එච්. ඒ ශාඛාවේ හෝ, රත්නපුර අධ්‍යාපන කාර්යාලයේ හෝ, කොළඹින් පිට ඕනෑම දිසාපති කාර්යාලයක හෝ එම වැඩය සඳහා රු. 100ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් රත්නපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ විට පමණි. චැක්පත්, මුදල් ඕඩර, පෝස්ටල් ඕඩර යනාදිය භාර ගනු නොලැබේ.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර රත්නපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත යුතුයි. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ 2 වැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයට ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණි.

4. පූර්වෝක්ත 2 වැනි ඡේදයේ සඳහන් වන පරිදි සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත් ටෙන්ඩර් ෆෝරම එවිය යුත්තේ දෙවැනි පිටපතකුත් සමගය. සියලුම විස්තර හා තොරතුරු රත්නපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් දැනගත හැකිය. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර, "ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මැලේ වීදිය, කොළඹ 2" යන ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් මුද්‍රා තබන ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් නො එවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාලන සහකාර තැනට ඒවා භාර දී එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුයි. එසේ භාර දෙන ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද සඳහන් කළ යුතුය.

5. 1964 ජූනි මස 5 වැනි දින පස්වරු 2.30ට කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට ඒවා විවෘත කරනු ලබන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරනු ලබන නිලධාරි තැන විසින් ගාස්තු ප්‍රමාණය (රේට් ගණන්) ද, ටෙන්ඩර්කරුවන්ගේ නම්ද, පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

6. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කර සති හයකට නොඅඩු කාලයක් තුළ සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

## ලුණු දෙපාර්තමේන්තුව

කොළඹ කොම්පඤ් ඤ වීදියේ ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවතේ අංක 110 දරණ ස්ථානයේ ලුණු කොමසාරිස් තැන විසින් නිලාවෙලි ලුණු ලේවායේ තිබෙන හුලං මෝලක් මිලදී ගෙනයාම සඳහා 1964 ජූනි මස 5 වැනි සිකුරාදා පස් වරු 3 තෙක් ටෙන් ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන් ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන් ඩර්කරුවන් ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

ටෙන් ඩර් පත්‍ර සැපයිය යුත් තේ අනු පිටපත සමග ලුණු කොමසාරිස් ගෙන් හෝ ත්‍රිකුණාමලේ දිසාපතිගෙන් හෝ නිලාවෙලි ලුණු ලේ වායේ කාර්‍යභාර නිලධාරි තැනගෙන් 1964 ජූනි මස තුන් වෙනිදා දවල් 12 වන තෙක් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. ටෙන් ඩර් තැන් පත් මුදලක් වශයෙන් රු. 50ක් ඕනෑම කච්චේරියක හෝ ලුණු කොමසාරිස් කාර්‍යාලයේ බැඳ ඒ බවට කුවිතාන් සියක් ඉදිරිපත් කළ විට ටෙන් ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ලුණු කොමසාරිස් කාර්‍යාලයේ මුදල් තැන් පත් කරන් නේ නම්, ලුණු කොමසාරිස් නමට මුදල් පත් පමණක් ඉදිරිපත් කළ යුතුයි.

වැඩි විස් තර ලුණු කොමසාරිස්, ත්‍රිකුණාමලේ දිසාපති සහ නිලාවෙලි ලුණු ලේ වායේ කාර්‍යභාර නිලධාරි කාර්‍යාලවලින් ලබා ගත හැක.

ජේ. ජේ. ජී. අමිර්තනායගම්,
වැඩ බලන ලුණු කොමසාරිස්.

1964 මැයි 15 දින,
කොළඹ 2.

5–259—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## මොණරාගල කච්චේරිය

### 1964 කතරගම ඇසළ උත් සවය

1964 කතරගම ඇසළ උත් සවය වෙනුවෙන් ඉදිකෙරෙන තාවකාලික ගොඩනැගිලි සඳහා 1964 මැයි මස 30 වැනි සෙනසුරාදා පස් වරු 12.30 දක් වා මොණරාගල දිස් ත්‍රික් කයේ දිසාපති විසින්, පහත සඳහන් ප්‍රකාර ටැන් ඩර් භාරගනු ලැබේ :—

(1) බටහිර දිසාවේ තාවකාලික ගොඩනැගිලි තැනීම
(2) ලං.ග.ම. හා අනිකුත් දෙපාර්තමේන් තු සඳහා ගොඩනැගිලි
(3) නැගෙනහිර දිසාවේ තාවකාලික ගොඩනැගිලි තැනීම
(4) තාවකාලික වැසිකිළි 970 ක් ඉදිකිරීම ආදිය.

2. 1964.5.23 වන දින පෙරවරු 11.30 දක් වා ලියාපදිංචි වූ කොන් ත්‍රාත් කරුවන් ට ටැන් ඩර්පත් නිකුත් කරනු ලැබේ. ඊට ප්‍රථම ඉහත එක් එක් වැඩ කොටස සඳහා ටැන් ඩර් තැන් පත් මුදලක් වශයෙන් රු. 25 ක් බැගින් තැන් පත් කොට කුවිතාන් සියක් ඉදිරිපත් කළ යුතුයි.

3. ටැන් ඩර් පත් මොණරාගල දිසාපතිගෙන් ලබාගන් නා ලද ටැන් ඩර් ආකෘතිවල පිටපත් දෙකකින් සමන් විත විය යුතුය.

4. 1964.5.30 වන දින පස් වරු 12.30 ට මෙම කච්චේරියේ දී ටැන් ඩර් විවෘත කරනු ලැබේ. මේ අවස් ථාවේ ටැන් ඩර්කරුවන් ට පැමිණ සිටීමට අවසර තිබේ.

5. එක් එක් වැඩ කොටසට වෙන් වෙන් වශයෙන් ටැන් ඩර් එවිය යුතුය. ඉල් ලුම් කරණ වැඩ කොටසේ නම ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරේ සඳහන් කොට සීල් තබා ලියාපදිංචි කළ තැපැලෙන් එවීමට හෝ කච්චේරියේ ටෙන් ඩර් පෙට්ටියේ බහාලීමට හෝ පුළුවන.

6. තෝරාගන් නා ටෙන් ඩර්කරු වහාම වැඩ පටන් ගැනීමට සූදානම්ව සිටිය යුතුයි.

7. වැඩි විස්තර කාර්‍යාල වේලාවන් හිදී මොණරාගල දිසාපතිගෙන් ලබාගත හැක.

විමල් නවගමුව,
මොණරාගල දිස් ත්‍රික් කයේ දිසාපති.

1964 මැයි මස 5 වන දින,
මොණරාගල දිසාපති කාර්‍යාලයයේ දීය.

5–405—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

### කොස්ලන්ද දිස්ත්‍රික්කයේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගල් සැපයීම සහ ගෙනැවිත් භාරදීම සඳහා ටෙන්ඩර් පත්

රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඌව කොට්ඨාශයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති තැන විසින් 1964 ජූනි මස 17 වැනි දින බදාදා පෙරවරු 11.00 වන තෙක් පහත සඳහන් ගල් ප්‍රමාණ සැපයීම හා ගෙනැවිත් භාරදීම සඳහා කොස්ලන්ද දිස්ත්‍රික්කය වෙනුවෙන් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| | 2″ කියුබ | ¾″ කියුබ |
|---|---|---|
| (අ) කොළඹ – ගාල්ල – හම්බන්තොට – වැල්ලවාය පාර ... ... | 150 ... | 15 |

2. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ කොස්ලන්ද දිස්ත්‍රික්කයේ විධායක ඉංජිනේරු තැනගේ කාර්‍යාලයෙහි දී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කළ හැක. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රුපියල් 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කර විධායක ඉංජිනේරු තැනගෙන් ඉල්ලුම් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබාගත හැක. තැන් පත් මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

3. මෙහි පහත සඳහන් ආයතන වලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අනවශ්‍යය :—
(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය,
(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කළ ග්‍රාම සංවර්ධන සමිති, හා
(ඇ) සමුපකාර රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කළ සමුපකාර සමිති.

4. මෙහි ඉහත සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත්වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1964 මැයි මස 22 වැනි සිකුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

5. ටෙන්ඩර් පත් නිකුත් කිරීම ලාංකිකයන්ට ද, ලාංකික වෙළඳ සමාගම් සහ අනිකුත් ලාංකික සමාගම්වලට ද සීමාකර තිබේ.

ආර්. ඇලෙක්සැන්ඩර්,
රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඌව කොට්ඨාශයේ
අධිකාරී ඉංජිනේරු තැන.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
ඌව කොට්ඨාශයේ අධිකාරී ඉංජිනේරු කාර්‍යාලය,
බදුල්ල.

5–383/1—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

### කොස්ලන්ද දිස්ත්‍රික්කයේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගල් සැපයීම සහ ගෙනැවිත් භාරදීම සඳහා ටෙන්ඩර් පත්

රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඌව කොට්ඨාශයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති තැන විසින් 1964 ජූනි මස 17 වැනි දින බදාදා පෙරවරු 11.00 වන තෙක් පහත සඳහන් ගල් ප්‍රමාණ සැපයීම හා ගෙනැවිත් භාරදීම සඳහා කොස්ලන්ද දිස්ත්‍රික්කය වෙනුවෙන් ටැන්ඩර් පත් භාරගනු ලැබේ.

| | | 2″ කියුබ | $\frac{3}{4}$″ කියුබ |
|---|---|---|---|
| (අ) | කොළඹ – රත්නපුර – වැල්ලවාය – මඩකළපුව මාර්ගය ... ... | 170 ... | 17 |
| (ආ) | හිඟුරකඩුව – පැල්වත්ත පාර ... ... ... ... | 100 ... | 10 |

2. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ කොස්ලන්ද දිස්ත්‍රික්කයේ විධායක ඉංජිනේරු තැනගේ කායසීලයෙහි දී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කළ හැක. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රුපියල් 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කර විධායක ඉංජිනේරු තැනගෙන් ඉල්ලුම් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබාගත හැක. තැන්පත් මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

3. මෙහි පහත සඳහන් ආයතන වලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අනවශ්‍යයය :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,
(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කළ ග්‍රාම සංවර්ධන සමිති, හා
(ඇ) සමූපකාර රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කළ සමූපකාර සමිති.

4. මෙහි ඉහත සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත්වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1964 මැයි මස 22 වැනි සිකුරාදා දවල් 12 වනතෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

5. ටෙන්ඩර් පත් නිකුත් කිරීම ලාංකිකයින්ට ද, ලාංකික වෙළඳ සමාගම් සහ අනිකුත් ලාංකික සමාගම්වලට ද සීමාකර තිබේ.

ආර්. ඇලෙක්සැන්ඩර්,
රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඌව කොට්ඨාශයේ
අධිකාරී ඉංජිනේරු තැන.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
ඌව කොට්ඨාශයේ අධිකාරී ඉංජිනේරු කායසීලය,
බදුල්ල.

5–383/2—64.5.15 දින අංක 14,035 දරණ ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

ගල්මුරුව ගැමි රෝහලේ වාට්ටුවක් සහ මුලුතැන් ගෙයක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1 විරාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ හා තැපැල් පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 ජූනි මස 17 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. හලාවත ර. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1964 මැයි මස 29 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,76,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

පී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1964 මැයි 11.

5–443—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

3,000 ක් පමණ පාවිච්චිකළ මැංගලෝර් උළු සහ 8,000ක් පමණ පාවිච්චිකළ මෙරට උළු මිලයට ගැනීම හා ඉවත් කර ගැනීම සඳහා ටැන්ඩර් පත්, කොලොන්නාවේ රජයේ කර්මාන්ත ශාලාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 ජූනි මස 17 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ඒ දිනම පෙරවරු 10.30 ට රජයේ කර්මාන්ත ශාලාවේ ටැන්ඩර් මණ්ඩල කාර්යාලයේ දී ටැන්ඩර් පත් විවෘත කරණ විට ටැන්ඩර් කරුවන්ට පෙනී සිටිය හැකි ය.

2. කොලොන්නාවේ රජයේ කර්මාන්ත ශාලාවේ කර්මාන්ත ශාලා ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කල හැක. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක, ටැන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කර කර්මාන්ත ශාලා ඉංජිනේරු තැනගෙන් ඉල්ලුම් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබාගත හැක. තැන්පත් කළ මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

මෙහි පහත සඳහන් ආයතන වලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අනවශ්‍යය :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) වෙන ආණ්ඩුවල රාජ්‍ය වෙළඳ සංවිධාන නිදර්ශන: චීන ජාතික යන්ත්‍රෝපකරණ ආනයන සංස්ථාව,

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරණ ලද ග්‍රාම සංවර්ධන සමිති සහ,

(ඈ) සමූපකාර සමිති රෙජිස්ත්‍රාර් තැන විසින් ලියා පදිංචි කල සමූපකාර සමිති.

3. මෙහි ඉහත සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත්වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1964 ජූනි මස 12 වෙනි සිකුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

පී. එල්. සී. ජයවර්ධන,
වැඩ බලන කර්මාන්තශාලීය ඉංජිනේරු,

රජයේ කර්මාන්ත ශාලාව,
කොලොන්නාව, 1964.5.11.

5–444—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

අගල් ¾ ගල් කියුබ් 60 ක් සහ අගල් ½ ගල් කියුබ් 304 ක් සැපයීමට සහ අනුරාධපුරයේ ර. වැ. දෙ. අංගනයට ගෙනැවිත් බාර දීමට ටෙන්ඩර් පත් රජයේ වැඩ හා තැපැල් අමාත්‍යාංශයෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 ජූනි මස 17 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් බාර ගනු ලැබේ. 1964 ජූනි මස 18 වෙනි දින පෙරවරු 10 ට අමාත්‍යාංශ ටැන්ඩර් මණ්ඩල කාර්යාල යේදී ටැන්ඩර් පත් විවෘත කරන විට ටැන්ඩර් කරුවන්ට පෙනී සිටිය හැක.

2. අනුරාධපුරයේ ර. වැ. දෙ. විධායක ඉංජිනේරුතැනගේ කාර්යාලයෙහි දී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කළ හැක. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක, ටැන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කර විධායක ඉංජිනේරුතැන ගෙන් ඉල්ලුම් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබාගත හැක. තැන්පත් කළ මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

මෙහි පහත සඳහන් ආයතන වලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අනවශ්‍යය :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,
(ආ) වෙන ආණ්ඩුවල රාජ්‍ය වෙළඳ සංවිධාන නිදර්ශන: චීන ජාතික යන්ත්‍රෝපකරණ ආනයන සංස්ථාව,
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරණ ලද ග්‍රාම සංවර්ධන සමිති සහ,
(ඈ) සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කළ සමූපකාර සමිති.

3. මෙහි ඉහත සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත් වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1964 ජූනි මස 12 වෙනි සිකුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

වී. අරසරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 64. 5. 8.

5–440—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

අනුරාධපුර දිස්ත්‍රිකක්යේ පුත්තලම්-ත්‍රිකුණාමල පාර වෙනස් කරන ස්ථානයට අගල් 4 ගල් කියුබ් 900 ක්ද, අගල් 2 ගල් කියුබ් 830 ක් සහ අගල් ¾ ගල් කියුබ් 104 ක් සැපයීමට සහ ගෙනැවිත් බාර දීමට ටෙන්ඩර් පත් රජයේ වැඩ හා තැපැල් අමාත්‍යාංශයෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 ජූනි මස 17 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ. 1964 ජූනි මස 18 වෙනි දින පෙරවරු 10 ට අමාත්‍යාංශ ටැන්ඩර් මණ්ඩල කාර්යාල යේදී ටැන්ඩර්පත් විවෘත කරන විට ටැන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක.

අනුරාධපුරයේ ර. වැ. දෙ විධායක ඉංජිනේරු තැනගේ කාර්යාල යෙහි දී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කළ හැක. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක, ටැන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කර විධායක ඉංජිනේරු තැන ගෙන් ඉල්ලුම් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබාගත හැක. තැන්පත් කළ මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

මෙහි පහත සඳහන් ආයතන වලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අනවශ්‍යය.

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,
(ආ) වෙන ආණ්ඩුවල රාජ්‍ය වෙළඳ සංවිධාන, නිදර්ශන: චීන ජාතික යන්ත්‍රෝපකරණ ආනයන සංස්ථාව,
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති සහ,
(ඈ) සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කළ සමූපකාර සමිති.

3. මෙහි ඉහත සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත් වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1964 ජූනි මස 12 වෙනි සිකුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

වී. අරසරත්නම්.
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 64.5.8.

5–439—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## 1964 අප්‍රේල් මාසය තුළ තීරණය කළ ටෙන්ඩර් පිළිබඳ දැන්වීම

| සේවය | ටෙන්ඩර් කරුවන්ගේ ගණන | | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය | පිළිගත් මිළ ගණන |
|---|---|---|---|---|
| 1. ඇලිපන්ට්පාස් ලුණු ලේවායට සක්කගල් සැපයීම | 4 | ... | සීමාසහිත වෛතලින්ගම් සහ සමාගම, 138, කේ. කේ. එස්. පාර, යාපනය | කියුබ් එකක් රු. 46.00 |
| 2. කොළඹ වරායේ සිට නාරාහේන්පිට ගබඩාවට ලුණු ප්‍රවාහනය කිරීම | 8 | ... | එස්. සෝමසුන්දරම්, අංක 104, හතරවෙනි හරස් වීදිය, කොළඹ 11 | සැතපුම් ටොන් එකක් ශත 70 බැගින් |

ජේ. ජේ. ජී. අම්ර්තනායගම්,
වැ. බ. ලුණු කොමසාරිස්.

ලුණු දෙපාර්තමේන්තුව,
කොළඹ.
1964 මැයි මස 15 වැනිද.

5-390—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

### ටෙන්ඩර් සඳහා ගත් අවසාන තීරණ

| සේවය | ලැබුණු ටෙන්ඩර් ගණන | | තෝරාගත් ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් ගණන් |
|---|---|---|---|---|
| 1. 1964.4.1 සිට 1964.9.30 දක්වා අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ආයතන යන්ට පොල් සැපයීම | 3 | ... | ඩබ්ලිව්. පී. පෙරේරා මහතා, 134, නාගල ගම් වීදිය, කොළඹ 14 | (i) අවුන්ස 30 සහ ඊට වැඩි තෝරපු ලෙලි අරින ලද පොල් 1,000ක් ගෙනැවිත් භාර දීමටත් සමග එදිනෙද පුවත්පතේ පළවන අංක 1කේ වතු කොප්පරා පාරමක ඉහළම මිලට රු. 7,50ක් අඩුවෙනි<br>(ii) අවුන්ස 26–30 අතර පොල් 1,000ක් ගෙනැවිත් භාරදීමටත් සමඟ නොවෙනස් මිල රු. 140 යි<br>(iii) ගෙඩියක වට ප්‍රමාණය අඟල් 12ට නොඅඩු පොල් 1,000ක් ගෙනැවිත් භාරදීමටත් සමඟ එදිනෙද පුවත් පතේ පළවන අංක 1කේ වතු කොප්පරා පාරමක ඉහළම මිලට රු. 50ක් අඩුවෙනි |

| | සේවය | ලැබුණු ටෙන්ඩර් ගණන | | තෝරාගත් ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් ගණන් | රු. ශ. |
|---|---|---|---|---|---|---|
| 2. | 1964.4.1 සිට 1964.9.30 දක්වා අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ආයතන යන්ම ගවමස් සැපයීම | 1 | ... | ඇම්. ඒ. ඇස්. මොහමඩ් මුස්තාපා මයා., 121, ස්වර්ණ චෛත්‍ය පාර, කොළඹ 14 | 1. කටු (සුප් සඳහා ඇට මිදුළු සහිතව)... | 0 05 |
| | | | | | 2. කරි මස් (25% කටු සහිතව) ... | 0 7[illegible] |
| | | | | | 3. වකුගඩු ... ... | 1 0 |
| | | | | | 4. පිකුදු ... ... | 2 75 |
| | | | | | 5. මොළය (එකක්) ... | 0 75 |
| | | | | | 6. ස්ටු මස් ... ... | 0 95 |
| | | | | | 7. සුප් මස් ... ... | 0 40 |
| | | | | | 8. ඝනකම ඇති ඇලපත මස්(බැදීමට)... | 0 95 |
| | | | | | 9. වල්ගා ... ... | 0 60 |
| | | | | | 10. දිව ... ... | 0 70 |
| | | | | | 11. බොකු සහ කිරි බඩවැල් ... | 0 15 |
| | | | | | 12. හදවත ... ... | 1 0 |
| | | | | | 13. ගවමස් (කටු රහිත) ... | 0 93 |
| | | | | | 14. බල්ලන්ට දෙන මස් ... | 0 03 |
| | | | | | 15. ඇලදිව ... ... | 1 0 |
| 3. | 1964.4.1 සිට 1964.9.30 දක්වා අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ආයතන යන්ට බටර් සැපයීම | 2 | ... | (අ) රෝහල් සැපයීමේ මූලස්ථානය සඳහා—කිරි මණ්ඩලය | ගෙනැවිත් භාරදීමත් සමග බටර් රාත්තලක් | 1 95 |
| | | | | (ආ) කොළඹ ආයතනයන්ට—ස.තො. සේ. ග්‍රොසරි දෙපාර්තමේන්තුව | ගබඩාවෙන් භාරදෙන මිල රාත්තලක් ... | 2 34 |
| | | | | (ඇ) පිට පළාත්හි ආයතනයන් සඳහා—ස.තො.සේ. ග්‍රොසරි දෙපාර්ත මේන්තුව | දුම්රියට භාරදෙන මිළ රාත්තලක් ... | 2 35 |

අ. වි. ර. පෙරේරා,
වැ. බ. අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1964 මැයි මස 8 ද,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

5–355—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

### 1963 නොවැම්බර් මස සිට 1964 ජනවාරි මාසය දක්වා පිළිගත් ටෙන්ඩර් පිළිබඳ විස්තර

| | වැඩය | ලැබුන ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර් කරුගේ නම | මුදල රු. ශ |
|---|---|---|---|---|
| (1) | කලුතර පොදුසේවා නිවාස තැනීම ... ... | 7 | ... බී. කේ. ජී. විද්‍යාරත්න සහ සහෝදරයෝ ... | 2,44,727 03 |
| (2) | හෙම්මාතගම ගැමිරෝහලේ මාතෘ වාට්ටුව තැනීම ... | 7 | ... ඇම්. ඇල්බට මහතා ... ... | 1,21,031 0 |
| (3) | කල්මුනේ රෝහලේ ගොඩනැගිලිවල වහලේ ඇස්බැස්ටස් යෙදීම සහ සීවලින් ගැසීම | 3 | ... කේ. වී. සිතම්බරපිල්ලේ මහතා ... | 57,479 53 |
| (4) | බෙලිහුල් ඔය තානායම වැඩිදියුණු කිරීම ... ... | 1 | ... කේ. ඩී. පෙරේරා මහතා ... | 22,364 22 |
| (5) | මඩකලපුව රජයේ රෝහලේ ඇඳන් 104 වාට්ටුවක් තැනීම ... | 7 | ... ඇම්. එම්. බුහාරි මහතා ... ... | 3,56,957 62 |
| (6) | රත්මලාන ගුවන්තොටුපලේ අභ්‍යාසනා මඩුවේ වහල ප්‍රකෘතිමත් කිරීම ... ... ... | 5 | ... කේ. ඩී. ඒ. පෙරේරා මහතා ... | 77,112 00 |
| (7) | අනුරාධපුර පාදෙනිය පාරේ 18 වැනි සැතපුමේ සිට යෝජිත කලාඔය පාලම දක්වා පාර තැනීම | 5 | ... නැෂනල් මැකනයිස්ඩ් ෆාමර්ස් ... | 94,685 00 |

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

### 1964 මාර්තු මාසය තුල පිළිගත් ටෙන්ඩර් පිළිබඳ විස්තර

| | වැඩය | ලැබුන ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම | මුදල රු. ශ. |
|---|---|---|---|---|
| (1) | කොළඹ තුරහපිටියේ කර්මාන්ත ප්‍රදර්ශන අංශයේ වැසිකිළි කට්ටල 12ක් තැනීම | 9 | ... ජුලියන් ප්‍රනාන්දු සහ පුත්‍රයෝ ... | 2,10,298 74 |
| (2) | මස්කෙළිඔය යෝජනාක්‍රමය යටතේ පොල්පිටිය විදුලි බල මධ්‍ය ස්ථානයට පිවිසෙන මාර්ගය ඉදිකිරීම | 3 | ... ඇස්. එච්. ජයතිලක මහතා ... | 2,60,899 94 |

5–319/1—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

### 1964 පෙබරවාරි මාසය තුල පිළිගත් ටෙන්ඩර් පිළිබඳ විස්තර

| | වැඩය | ලැබුන ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම | මුදල රු. ශ. |
|---|---|---|---|---|
| (1) | නාගදීපයේ ගැමිරෝහලේ වාට්ටු 2ක් තැනීම ... ... | 3 | ... ඇස්. නඩරාජා මහතා ... ... | 96,500 25 |
| (2) | දකුණු කොළඹ රෝහලේ රෝගනිධාන රසායනාගාරයට ලීබඩු සහ උපකරණ සැපයීම | 3 | ... ඩබ්ලිව්. ඩී. ඇස්. ප්‍රනාන්දු මහතා ... | 60,198 25 |
| (3) | රත්මලාන ගුවන් තොටුපලේ ගුවන් විදුලි ඉංජිනේරු අංශයට ගබඩා ගොඩනැගිල්ලක් තැනීම | 12 | ... බී. කේ. ජේ. විද්‍යාරත්න සහ සහෝදරයෝ | 92,855 98 |

| | වැඩය | ලැබුන ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම | මුදල රු. ශ. |
|---|---|---|---|---|
| (4) | කබුරුගමුවේ පර්යන්තනීකකය තැනීම ... ... | 5 | ... ඩී. ජෝන් පෙරේරා මහතා ... | 70,224 21 |
| (5) | 6–ඒ ශ්‍රේණියේ නිවාසයක් කල්මුනේ තැනීම ... ... | 2 | ... ඇස්. මුරුගප්පන් මහතා ... | 1,00,343 90 |
| (6) | පත්තලගෙදර විද්‍යාගුරු අභ්‍යාස විද්‍යාලේ 4ඒ ශ්‍රේණියේ නිවාස 8ක් තැනීම | 11 | ... ටී. ආර්. ඇල්. ප්‍රනාන්දු මහතා ... | 3,46,225 38 |
| (7) | ඌරුගොඩවත්තේ වෘත්තීය පුහුණු කිරීමේ මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම | 8 | ... කේ. ඒ. සිල්වා මහතා ... ... | 92,825 01 |
| (8) | අනුරාධපුරයේ 5බී ශ්‍රේණියේ නිවාස 2ක් තැනීම ... | 7 | ... ෂෙල්ටන් සහෝදරයෝ ... | 1,37,663 96 |
| (9) | මිනුවන්ගොඩ රෝහලේ මාතෘ වාට්ටුවක් තැනීම ... | 4 | ... ටී. ඒ. ද සේරම් මහතා ... ... | 78,527 11 |
| (10) | කොළඹ නැගෙනහිර අංක 6බී රිජන්ට් වීදිය කොටසේ රජයේ ගොඩනැගිලි 1964 වර්ෂය තුළ නඩත්තු කිරීම | 2 | ... එච්. බී. ජේම්ස් අප්පුහාමි මහතා ... | බී. ඇස්. ආර් වලට 2%ක් අඩුවෙන් |
| (11) | මස්කෙළිඹය යෝජනා ක්‍රමයේ පොල්පිටිය හා ලක්ෂපාන යාකරන මාර්ගය තැනීම | 3 | ... එච්. කේ. ධර්මදාස මහතා... ... | 7,97,856 54 |
| (12) | පාදෙනිය–අනුරාධපුර පාරේ 48 වැනි සැතපුමේ සිට යෝජිත පාර තැනීම | 4 | ... ආර්. ජේ. ආර්නෝල්ඩා මහතා ... | 1,68,931 63 |

5—319/2—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය.

# බඩු බාහිරාදිය විකිණීම

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### ගම්පහ දැව ගබඩාවේ 1964 මැයි මස 27 වෙනි දින පැවැත්වෙන දැව වෙන්දේසිය

රත්නපුර, බටහිර දිසාවේ, දිසා වන නිලධාරී විසින් 1964. 5. 27 දින පෙරවරු 10 ට II, III හා IV වෙනි පන්තිවල ඉරූ දැව ගොඩ වල් 8ක් (ඝන අඩි 1276.7 ක් පමණ), ගම්පහ කිඹගම්මුල්ලේ පිහිටි දැව ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. දැව ලේඛනය හා අනිකුත් විස්තර ගම්පහ දැව ගබඩාවේ ගබඩා ඕවර්සියර්ගෙන් හෝ මගෙන් ලබාගත හැක.

ටී. ඩබ්ලිව්. සෙනෙවිරත්න,
බටහිර දිසාවේ දිසා වන නිලධාරී.

දිසා වන නිලධාරී කාර්යාලය,
හෙලිංස් මාවත, රත්නපුර,
1964. 5. 4 වැනි දින දීය.

5—441—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## කැලෑ දෙපාර්තමේන්තුව

### වෙන්දේසියේ විකිණීම

හල්මිල්ල, බුරුත, පලු, වැවරණ, කොහොඹ, කොලොන් හා පානක්කා ආදියෙන් යුත් කඳන් හා, ඉරණ ලද දැව ද කැලෑ අපරාධයකට අයත් දේද උතුරු මධ්‍යම දිසා භාර කැලෑ නිලධාරී විසින් අනුරාධපුරය, පොලොන්නරුව, අඩවි වන කාර්යාලවලදී හා තලාව අංක 2 රජයේ දැව ගබඩාවේ දී පිළිවෙළින් 1964 මැයි 22 වන දින පෙරවරු 10 ට, 1964 මැයි මස 22 වැනි දින පස්වරු 2 ට හා 1964 මැයි 23 වැනි දින පෙරවරු 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරණු ලබන දේ ඒ ඒ අඩවිය හෝ ගබඩාව භාර නිලධාරීන්ගේ අවසරය ඇතිව කලින් පරීක්ෂාකර බැලීමට අවසර දෙනු ලැබේ.

වෙන්දේසිය සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් එම වෙන්දේසි වේලාවේදී කියවනු ලබන කොන්දේසිවලට අනුකූල වන සේ ක්‍රියා කළ යුතුය. ඒ ඒ වෙන්දේසියට අයත් දේ පිළිබඳ අවශ්‍ය වෙනත් සියලුම විස්තර ඒ ඒ අඩවිය හෝ ගබඩාව භාර නිලධාරීගෙන් හෝ ත්‍රිකුණාමලයේ දිසා කැලෑ නිලධාරී කාර්යාලයෙන් හෝ පැමිණ දැන ගත හැක.

ජ. ආ. ද සිල්වා,
දිසා භාර කැලෑ නිලධාරී (උ. මැ. දි.).

1964 අප්‍රේල් මස 29 වැනි දින,
ත්‍රිකුණාමලයේ දිසා කැලෑ කාර්යාලයේදීය.

5—442—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## රේගුවේ ප්‍රසිද්ධ වෙන්දේසියක්

පහත සඳහන් බඩු 1964, මැයි මස 21 වෙනි දින පෙරවරු 10 ට රේගුවේ ගමන් බඩු කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියෙන් විකුණනු ලැබේ.

ස්වර්ණාභරණ සහ මැණික් ගල් පමුණක් 1964, මැයි මස 20 වෙනි බදාදා පස්වරු 1 සිට 3.30 දක්වා සෝදිසි කළ හැක.

ස්වර්ණාභරණ කොටස් 22ක්
මැණික් ගල් 9ක්
අත් ඔරලෝසු 9ක්
සාරි 10ක්
කමිස 37ක්
සහ වෙනත් බඩු.

ඩබ්ලිව්. පත්මනාදන්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

රේගුව, කොළඹ,
1964 මැයි 11 වෙනි දින.

5—421—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## වෙන්දේසියේ විකිණීමයි

### ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව—මොරටුව, වෙලෝනාවේ රජයේ චිත්‍රපට ආයතනය

මෝටර් බැටරි, මෝටර් රථ උපකරණ, කම්මල් බඩු සහ වෙනත් කාර්යාලයීය ද්‍රව්‍ය ඇතුළත් පාවිච්චි කළ නොහැකි ද්‍රව්‍ය මොරටුවේ, වෙලෝනාවේ පිහිටි රජයේ චිත්‍රපට ආයතනයේ දී 1964 මැයි මස 29 වෙනි සිකුරාදා ප. ව. 1.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. සාර්ථක වූ ඉල්ලුම්කරුවන් බඩුවල සම්පූර්ණ වටිනාකම ගෙවා එදිනම ප. ව. 4.30ට ප්‍රථම ඒවා ඉවත් කරගත යායුතුය. මෙම ද්‍රව්‍ය වෙන්දේසිය පවත්වන දිනයේ පෙ. ව. 9.30 සිට ප. ව. 1.30 දක්වා, මොරටුවේ, වෙලෝනාවේ පිහිටි රජයේ චිත්‍රපට ආයතනයේ දී පරීක්ෂා කර බැලිය හැක.

ඇස්. බී. සේනානායක,
වැඩ බලන ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

ගුවන් විදුලි කාර්යාලය,
කොළඹ 7.

5—258—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## කැලෑ දෙපාර්තමේන්තුව

### දව වෙන්දේසි කිරීම

ඉරූ දව, වට ලී හා කම්බි කණුවලින් සමන්විත දව තොග හයක් 1964 මැයි මස 16 වන දින උදය 10ට පුත්තලම් අඩවියේ පාලාවි දව ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දව වෙන්දේසියට පෙර ඉල්ලුම්කරුවන්ට පරීක්ෂා කර බැලිය හැක. මේයට අදාල වැඩි විස්තර පාලාවි දව ගබඩා පාලකගෙන් හෝ වයඹ දිසා කැලෑ කාර්යාලයෙන් හෝ ලබාගත හැක.

ස. මුත්තයියා,
වයඹ දිසාභාර කැලෑ නිලධාරි.

තැ. පෙ. අංක 10,
කුරුණෑගල,
64.4.22.

5-244—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## දැන්වීමයි

නොම්මර 1 තත්ත්වයේ හිස් ගෝනි 450ක් ද,
නොම්මර 2 තත්ත්වයේ හිස් ගෝනි 350ක් ද,
නොම්මර 3 තත්ත්වයේ හිස් ගෝනි 100ක් ද,

දෙහිවල සත්වෝද්‍යානයේ බඩු ගබඩාව අසලදී 1964 මැයි මස 29 වැනි දින පෙරවරු 10ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ දී සම්පූර්ණ මුදල් ගෙවා ගෝනි ඉවත්කර ගත යුතුය.

ඩබ්ලිව්. එල්. ඊ. ද අල්විස්,
අධ්‍යක්ෂ.

1964.5.6 වැනි දින,
දෙහිවල, සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ දී ය.

5-265—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

වර්ෂ 1964 ක්වූ මැයි මස 29 වැනි දින පස්වරු 2ට කොළඹ 2, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවතේ, අංක 110 දරන ස්ථානයෙහි පිහිටි ලුණු දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේදී, පහත සඳහන් දෑ ප්‍රසිඩ වෙන්දේසියෙන් විකුණනු ලැබේ. එසේ ලබා ගන්නා ලද දෑ එහිදීම මුදල් ගෙවා වහාම ඉවත්කර ගත යුතුයි.

1. පාවිච්චියට නුසුදුසු බයිසිකල් 2 යි.
2. පාවිච්චියට නුසුදුසු ගුවන් විදුලි යන්ත්‍ර 1 යි.
3. පරණ පුවත්පත් රාත්තල් 56 යි.

ඉහත සඳහන් දෑ පෙරකී ස්ථානයේ දී වෙන්දේසි කරන දින පස්වරු 1 සිට 2 දක්වා වූ කාලය තුළදී බැලිය හැක.

ජේ. ජේ. ජී. අමිර්තනායගම්,
වැ. බ. ලුණු කොමසාරිස්.

ලුණු කොමසාරිස්,
අංක 110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 2,
1964 මැයි මස 15 වැනිද.

5-389—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

## තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

### 1964.7.1 සිට 1965.6.30 කාල සීමාව තුළ වවුනියාව දිස්ත්‍රික්කයේ රා තැබෑරුම් නැවත විකිණීමයි

1964.7.1 දින සිට 1965.6.30 වන දින දක්වාවූ කාල සීමාව තුළ සුදුසු ස්ථානයන්හිදී පහත දැක්වෙන ප්‍රදේශයන්හිදී පැසුණු රා සිල්ලරයෙන් විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍රිකා වවුනියාවේ දිසාපති විසින් භාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ඕනෑම කච්චේරියකින්, කොළඹ සුරාබදු කොමසාරිස්ගේ කාර්යාලයෙන්, යාපනේ සහකාර සුරාබදු කොමසාරිස්ගේ කාර්යාලයෙන් සහ පේදුරුතුඩුවේ සුරාබදු අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති-පත්‍රිකාවක විය යුතුයි.

3. එක තැබෑරුමක් සඳහා එක ටෙන්ඩර් පත්‍රිකාවකට වඩා ටෙන්ඩර් පත්‍රිකා කිසිම අයෙකු විසින් ඉදිරිපත් නොකළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍රිකා භාර ගැනීමේ අවසන් වේලාවේදී සියලුම ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කරන්නන් පෞද්ගලිකව පෙනී සිටිය යුතුයි. ටෙන්ඩර් පත්‍රය ඉදිරිපත් කරන්නා පෙනී නොසිටීනම් එවැනි ටෙන්ඩර් පත්‍ර බාරගනු නොලැබේ. ටෙන්ඩර් පත්‍රිකා ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකි අතර විකුණන ස්ථානයේදී අතින් ද භාර දිය හැකිය. ටෙන්ඩර් පත්‍රිකාවට අදාල තැබෑරුම් නම සහ අංකය ලියුම් කවරයේ වම් කොනේ පැහැදිලිව ලියා එහි ටෙන්ඩර් පත්‍රිකාව බහා මුද්‍රා තැබිය යුතුය.

5. විකිණීමේ කොන්දේසි සපුරාලීම වශයෙන් සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමගම රුපියල් 1,000කට කච්චේරිය කුවිතාන්සියක් ඇමිණිය යුතුයි. සියලුම තැන්පත් කිරීම් වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති නමින් විය යුතුයි. සාර්ථක වූ ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය ඔහුට එම වරප්‍රසාදය හිමිවූ විගසම විකිණීමේ කොන්දේසිවලට අත්සන් තැබීමට ඉදිරිපත් නොවූවොත් ඇප මුදල රාජසන්තක වේ.

6. කිසියම් කාරණයක් සඳහන් නොකොට ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය දිසාපති සතුය. අත්සන් නොතබා ඇති සංශෝධන ඇති ටෙන්ඩර් පත්‍රිකා ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

7. අසතුටුදායක ටෙන්ඩර් පත්‍ර ලැබී ඇත්නම් එක ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය දිසාපති සතුය.

8. සාර්ථකවූ ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය එසේ මිළට ගත් බව ප්‍රකාශ කළාට පසුව වවුනියා දිසාපති විසින් අණකරන අයුරු මාස දෙකක කුලියට අඩු නොවන මුදලක් ඇප වශයෙන් වවුනියා දිසාපතිට ගෙවා විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා කොන්ත්‍රාත්තුව සඳහා මුද්දර සැපයිය යුතුයි.

9. විකිණීමේ කොන්දේසිය හා වෙනත් වැඩි විස්තර වවුනියා කච්චේරියෙන් ලබාගත හැක.

10. දැනට තැබෑරුම් ඇති ස්ථානම ඉදිරි වර්ෂයේදීත් ලැබේ යයි ස්ථිරව කිව නොහැකිය. වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති ස්ථාන අනුමත කරන තුරු බල පත්‍ර නිකුත් නොකරනු ලැබේ. විකිණීමේ විස්තර මෙහි පහත දැක්වේ.

ප. හේ. ප්‍රේමවර්ධන,
වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති.

1964.5.8 වන දින,
වවුනියාව කච්චේරියේදීය.

| අංකය හා ප්‍රදේශය | | කැබෑරුම පිහිටි පළාත් පාලන කොට්ඨාශය | | විකුණන ස්ථානය | | දිනය සහ වේලාව |
|---|---|---|---|---|---|---|
| 1. මුලතිව් | ... | මුලතිව්හි සුළු නගර සභාව | ... | වවුනියා කච්චේරිය | ... | 64.6.4 පූ. භා. 9.30 |
| 3. මුල්ලියවලෙයි | ... | මුල්ලියවලේ ගම් සභාව | ... | එම | ... | 64.6.4 පූ. භා. 10.30 |
| 4. පුදුකුඩිඉරිප්පු | ... | පුදුකුඩිඉරිප්පු ගම් සභාව | ... | එම | ... | 64.6.4 පූ. භා. 11.30 |
| 5. පුතුමාතලන් | ... | පුතුමාතලන් ගම්සභාව | ... | එම | ... | 64.6.4 ප. ව. 1.30 |
| 7. වව්නියා | ... | වව්නියා නගර සභාව | ... | එම | ... | 64.6.4 ප. ව. 2.30 |
| 8. කච්චිලාමඩු | ... | කච්චිලාමඩු ගම්සභාව | ... | එම | ... | 64.6.4 ප. ව. 3.30 |
| 9. වට්ටුවාකිකාල් | ... | වට්ටුවාකිකාල් ගම්සභාව | ... | එම | ... | 64.6.4 ප. ව. 4.30 |

5-394—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

# වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම්

## වෙන්දේසියේ විකිණීමයි

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ උඩසිය පත්තුවේ, රංගල්ල, හක්මන, හීල්ඔය සහ පෝද්දල්ගොඩ පිහිටි, අක්කර එක්දස් තුන්සිය හතළිහක (අ. 1,340, රූ. 0, ප. 0) ට අඩු-වැඩි ප්‍රමාණයන්ගෙන් යුත් (මාර්ග අයිතිය සමග වටගල්ල, හීල්ඔය සහ තවත් ඉඩකඩම් කීපයකින් සමන්විත) බර්න්සයිඩ් වතුයාය යනුවෙන් හැඳින්වෙන වතු වැවිලි සහ ඉඩකඩම්, එහි පිහිටි කර්මාන්තශාලා සහ ගොඩනැගිලි සමග ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි.

ලංකා රජයේ උකස් බැංකු ආඥා පනතේ 62(1) (1956 ව්‍යවස්ථාපිත අණපනත්හි 398 වැනි පරිච්ඡේදය) දරණ වගන්තිය යටතේ, ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද, විශේෂ තීරණයක් විධිමත්ව ගැසට් පත්‍රයේ පළ කර ප්‍රසිද්ධ කිරීමෙන්, ඒ යටතේ ලැබී ඇති බලතල අනුව සහ එකී අධ්‍යක්ෂ මණ්ඩලයෙන් බලය ලත් පරිදි, ඒ. එස්. කරුණාරත්න ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද 1947 අප්‍රේල් 3 වෙනි දින හා අංක 1817 සහ 1953 ජූනි 3 වෙනි දින හා අංක 2491 දරණ උගස්කරයන් පිට මහනුවර කාසල් හිල් විදියේ අංක 93 දරණ ස්ථානයේ පිහිටි, සීමාසහිත සේනානායක වතු සමාගම විසින් මෙම බැංකුවට ඇප වශයෙන් උගස් කරන ලද, මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩසිය පත්තුවේ, රංගල්ල, හක්මන, හීල්ඔය සහ පෝද්දල්ගොඩ පිහිටි, අක්කර එක්දාස් තුන්සිය හතළිහක (අ. 1,340 රූ. 0 ප. 0) ට අඩු-වැඩි ප්‍රමාණයන්ගෙන් යුත් (මාර්ග අයිතිය සමග වටගල්ල සහ හීල්ඔය හා තවත් ඉඩම් කීපයකින් සමන්විත) බර්න්සයිඩ් වතුයාය යනුවෙන් හැඳින්වෙන වතුවැවිලි සහ ඉඩකඩම්, එහි පිහිටි කර්මාන්තශාලා සහ ගොඩනැගිලි සමග ඉහත කී උගස්කර දෙක පිට අයවිය යුතු මුදල වන රු. 4,34,525.85 අය කරගනු සඳහාත්. 1962.11.7 වැනි දින සිට වෙන්දේසිය සිදු කරන දින දක්වා රු. 3,33,817.91 ට අවුරුද්දට සියයට 5½ බැගින් පොලිය අයකර ගනු සඳහාත්, ලංකා රජයේ උකස් බැංකු ආඥා පනතේ 63 වෙනි වගන්තිය යටතේ අය කර ගත හැකි වියනියදම්ද, අනිකුත් මුදල්ද අයකරගනු සඳහා, 1964 ජූනි මස 20 වෙනි ශනි දින පූ. භා. 10ට කොළඹ කොටුවේ බේලි වීදියේ අංක 20 දරණ මගේ කාර්යාලයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර කොළඹ හෝර්ටන් පෙදෙසේ අංක 91 දරණ තැන, ලංකා රජයේ උකස් බැංකුවෙන් ලබාගත හැක.

ඒ. එම්. මාර්සුක්,
බලය ලත් වෙන්දේසිකරු.

අංක 20, බේලි වීදිය,
කොළඹ 1.
ටැලිෆෝන් : 78130
64.4.23

5–1180—64.5.15 දින අංක 14,035 දරන ගැසට් පත්‍රය

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි